

# බුද්ධවංශ දේශනාව
# හා
# පරංජීශ දීපනිය.

# BUDDHAWANSADESANAWA.

# බුද්ධවංසදෙසනාව

සහ

නිර්වාණපුරවර්ණනාව, මෛත්‍රීවර්ණනාව

ඇතුළුව

## පරංජසදීපනිය.

සමණී ස්ථවිරයන්වහන්සේ නමක් ලවා

සංශෝධනය කරවාගෙන

සූරියආරච්චිගේ බබාසිඤ්ඤොඅප්පුහාමි විසින්

4 වෙනි වරට

අච්චුගැසවා ප්‍රසිද්ධ කරණලදි,


පැලියගොඩ

ශෙවයශ්‍රී යන්ත්‍රශාලාවේදී අච්චුගසනලදි.

1899.

# බු ධ වං ස දෙ ස නා ව.

**නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.**

ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරිං.

හිරුවට වඩා තේජස්ඇතිවූ සඳුවට වඩා සොම්‍යගුණඇතිවූ මුළු පොලොවට වඩා ධෛර්‍ය්‍යඇතිවූ සමුද්‍රයට වඩා ගැඹුරු නුවන ඇතිවූ භවසමුද්‍රට නැවක් බඳුවූ, යාචකයන්ට කප්රුකක් බඳුවූ, උපාසකයන්ට කල්පවෘක්ෂයක් බඳුවූ, දුගීන්ට ඇල්කෙතක් බඳුවූ, උගුරට මියුරුවූ, සවනට අමාවූ, අපායට වැටක්වූ, නිවන්පුරයට මාවතක්වූ, අප තිලෝගුරු බුදුරජාණන්වහන්සේ සුවිසි අසංඛ්‍යයක් සත්වයන්ට අමාමහනිවන් දක්වා වදාළසේක.—උන්වහන්සේගේ මහභිනික්මන් ජාතකය සත්පුරුෂයන් විසින් කිසි අරගලයක් නොකොට කන් නමා සිත්හෙලා ඇසියයුතු—තවද අප මහබෝසතාණෝ සන්තුසිත නම් දිව්‍යරාජව දෙවියන් පිරිවරා සුදන්දෙව්ලෝ වැද සුවයෙන් වැඩ වසන සමයෙහි දසදහසක් සක්වල දෙව් බඹුන් හා දිව්‍යබ්‍රහ්මයන් මේ මගුල් සක්වලට එක්ව ඔවුන් අතුරෙහි බුදුවන්නට මහත් කුසල් කළ කෙනෙක් ඇද්දෝහෝයි ඊවසින් බැලූකල්හි; අපමහබෝසතාණෝ තුසිතනම් දෙව්ලොව සන්තුසිතනම් දිව්‍යරාජව වැඩවසන නියාව දැන දෙව්බඹුන් විසින් මෙසේ කියන ලදි.

කාලොයං තෙ මහා වීර, උප්පජ්ජ මාතු කුච්ඡියං
සදෙවකං තාරයන්තො, බුජ්ඣස්සු අමතං පදං.

යනමේ ගාථාවෙන් කුමක් කී නියාවද යත්? මේ දස දහසක් සක්වළ දෙව් බඹුන් හා දිව්‍යබ්‍රහ්මයන් හා නාග සුපර්ණ ගරුඩ ගාන්ධර්ව යක්ෂයන් විසින් සියලු සිද්ධවිද්‍යාධරයන් එකතුහැර අවුන් දෙහොත් මුදුනෙහි තබා වැඳ ආරාධනාව දක්වා, ස්වාමිදරුවූ බෝසතාණන් වහන්ස, මේ සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි මනුෂ්‍යයන් තබා දිව්‍යබ්‍රහ්මයන් විසිනුත් කරන්නනා තබා සිතන්නටත් අවිෂයවූ දානපාරිත්‍යාගයක් කොට ශෝදමණ සැපතක් නිසා පමාවූසේක්ද නම්

මේ මඟුල්සක්වලෙහි උපන් සත්‍වයෝ එක් සුවඳ මලක්වත් එක් පහණක්වත් එක් බත් කිනිස්සක්වත් දන්දී ලබන්නාවූ සම්පත් අනුභව කරන්ට නොහැක්වෙති—එහෙයින් මින් මහාඝෝෂ මඟුල් සක්වලෙහි ඉපිද මශ අඳුරු වලෙනි වැටි දුක් විඳිනා දෙවිමිනිස්ආදී සියලු සතුන් දුකින් මුදවාවදාළමැනවයි කියා ආරාධනාකළාහ— එවේලෙහි මහබෝසතානෝ එකඅතකට යත් අමණ පමණක්සේ කරණ ආරාධනාව ඉවසා තුන්පූර්ව නිමිති දැක පඤ්චවිලොකනය දැක වදාරණසේක.... මේ දසදහසක් සක්වලෙහි කවරනම් සක්වලෙක උපදිම්දෝහොයි දිවසින් බැලූසේක, මෙකපට මඟුල්සක්වලෙහි දසු නුමෙර මුදුන දඹදිව පෙරත් සර්වඥයන්වහන්සේලා උපන් බව දැක මේ මෙකලට කවර කුලයෙක් උතුම්දෝහොයි දිවසින් බැලූසේක; එකල දඹදිව කිඹුල්වත්පුරය ශාක්‍යවංශය උතුම්සේ දැක ඒ රාජවංශය උතුම්විනුමුත් බුදුවන මහත්කෙනෙකුන්ට මව්වන්නට නිසි ස්ත්‍රියක් ඇද්දෝහෝයි දිවසින් බැලූසේක; එකල කප් කෙළලක්‍ෂයක් මුළුල්ලෙහි මම බුදුවන මහෝත්තම කෙනෙකුන්ට මව්වෙම්වයි ප්‍රාර්ථනාකළාවූ මහමායා දේවීන් වහන්සේ ඒ රාජවංශයට නායකව උපන් බව දැක උන්වහන්සේ මව්වන්ට නිසිසේක් විනුමුත් බුදුවන මහත්කෙනෙකුන්ට පියවන්ට නිසි පුරුෂයෙක් ඇද්දෝහෝයි දිවසින් බැලූසේක; එකල දඹදිව සතලිස් සත්දහස් සත්සිය සත්අනූවක් රජදරුවන්ට රජකම්කොට සොළවර රජපැමිණි සුඩොදන රජ්ජුරුවන් වහන්සේ සොළලක්‍ෂයක් මුලුල්ලෙහි බුදුවන මහත්කෙනෙකුන්ට පියවෙම්වයි ප්‍රාර්ථනාකලසේක; දෙදෙනා වහන්සේ මට මව්පිය වන්ට නිසිසේක් විනාමුත් මමත් ඒ රාජවංශයට නායකව උපන් කලෙක් ඇද්දෝහෝයි දිවසින් බැලූසේක; ජාතිජාතියෙහි පෙරුම්පුරණ කල්හි රජව උපන්කල් තිබේද්දී මහාභද්‍රකල්පයෙහි එකුන්තිස්වාරයක් සක්විතිරජව උපන්නෙමි, එකුන්තිස් වාරයක් බරණැස්රජව උපන්නෙමි, පළමු මෙකපට මතු පාරමිතානම් රජව උපන්නෙමි, මහාසම්මත රජව උපන්නෙමි, කුරුධර්මනම් රජව උපන්නෙමි, චක්‍රවර්තිනම් රජව උපන්නෙමි, මහාමඤ්ඤනම් රජව උපන්නෙමි, මඛාදේවනම් රජව උපන්නෙමි, සඳමහරජව උපන්නෙමි, සුඩොදන රජව උපන්නෙමි, තේමියකුමාරව උපන්නෙමි, අඩසඳ කුමාරව උපන්නෙමි, බ්‍රහ්මදත්තරජව උපන්නෙමි, සිවිරජව උපන්නෙමි, දහම්සොඩ රජව උපන්නෙමි, කුසරජව උපන්නෙමි, නිමිරජව උපන්නෙමි, චේතියරජව උපන්නෙමි.... අග්නි දිග්භාගයෙහි සැවැත්නුවරය, ජයතුරානුවරය, සාගලනුවරය, රජගහනුවරය යනමේ නුවරවල් සල්ලවතී ගංගා දිශාවෙහි පිහිටියාහ; තවද මෙම බෝධිමණ්ඩලයට දක්‍ෂින දික්භාගයෙහි අශවපුරය, කලස් සුභාවය, අයෝලය, ඉදිපත්නුවරය, කුරුරටය, බරණැස්නුවරය, කිඹුල්වත්පුරය යන මේ මහා නුවරවල් පිහිටියාය.

තවද මේ බෝධිමණ්ඩලයට පශ්චිමදිග්භාගයෙහි සිංහපුර නුවරය, විසාලාමහනුවරය, කොසඹෑනුවරය, පැලලුප්නුවරය, කණ්ඩාලය යනමේ උතුම්වූ පස්නුවරයෝ බමුණුගම දිශායෙහි පිහිටියාහ—තවද ඒ බෝධි මණ්ඩලයට උත්තරදිශාභාගයෙහි උත්තරපංචාල නුවරය, රෝජත නුවරය, තක්සලා නුවරය, කුසිනාරා නුවරය, තාම්බ්‍ර නුවරය, යනමේ නුවරවල් මධ්‍යමණ්ඩලයට ඇතුල්වන්නාහ—මේ මහානුවරයෝ නම්; චක්‍රවර්තීරජුන්හා මහාධන සිටුවරුන්ද, මහේශාක්‍ය දෙවියන් හා අසූමහසව්වන්ද, පසේබුදුන්හා ලොව්තුරාබුදුන්ද යන මෙම උත්තමයන්ගේ උත්පත්තිස්ථානයයි දත්යුතුයි—මෙසිත් පිටත බංකාලය, අරමණය, වගුරටය, භොත්ගිනිය, කලිඟුදේශය, සිංහුරය, ඔහලය, යවනය, කුජ්ජරය, ත්‍රිංගුරය, දෙරුවරය, වේගුරලය, කණ්ඩවනය, තිමිරයදේශය, කාකය, යවනය, ගුජ්ජරය, තුරුගිය, බාජ්‍රය, පුපපාලය, ජානිරය, කණ්ණිකාගරය, මුළුරය, වල්ළුරය, මලයුරය, පචාලය, දිනය, මහාදිනය, සෝනකය, කශිය, බරණ්ඩය, වඩිගය, චිරය, කල්‍යාණිය, තුරණිය, මොලය, මෙකිදේශවල් මධ්‍යමණ්ඩලයට පිටත් දේශවල් වෙනි—මෙකී දේශවල බුද්ධ බෝධිසත්වයෝ නූපදින්නාහ; අනන්ත අප්‍රමාණ සක්වලවල්හැර, තවද නොකී යනලද සෙසු දිවසින්ද දෙව්ලොවද බඹලොවද නොපිපද මේ මධ්‍යමණ්ඩලය උතුම්වනහෙයින් ශ්‍රී මහබෝධිසත්වයෝ මේ මඟුල්සක්වළ උපදිමියි දිවසින් බැලූසේක—එසේහෙයින් සියලු සත්පුරුෂයෝ මේ මඟුල්සක්වල උපදිමහයි කියා ප්‍රාර්ථනාකළාහ; යහපත් වෙසන්තර නම් රජව උපන්නෙමි, මෙම නියායෙන් එකුන්තිස්වාරයක් සක්විතිරජව උපන්නෙමි, රාජවංශය මටම හිමියයි සිතා දිවසින් දැක ඇසළමස මැදි පොහෝද උතුරසළේ නැකතින් අවුත් මහා මායාදේවින් වහන්සේගේ කුස පිළිසිඳගත්සේක—දසළුකඩමසක් පුරා මව්කුස පිළිසිඳ වෙසගමැදි පොහෝද සොලොස්දහසක් බිසෝවරුන් පිරිවරාගණ මඟුල් සල්උයනේ උයන්කෙළියට නික්මුනුසේක—එදවස් දෙවිබඹුන් විසින් සරහනලද මඟුල් උයනේ දොතළු සල් කිතුල් අඹ දඹ සපු නා පනා සිනිඳු බෝලිඳ ඇසල එරහැඳි පළොල් දෙල් දිඹුල් කිණිහිරි පෙත්රිපි නුග වෙලඟ කඹුපුල් ඇඹිල ඉඹිල නෙළුන් මහනෙල්මල් සමග ගැවසීගත් උයනේ මීමැසි බඹර වැසිදෙරා ගිගුමෙන් ගැවසීගත්තාහ—මෙසේ මඟුල් උයනේ සිරි විඳිමින් වඩිනා වේලෙහි මුලපටන් අගදක්වා ජවානයොප්සේ මලින් ගැවසීතිබෙන සල්ගසක් දැක එගස මල්පලදිමිසිතා සල්ගසට අතදික්කළාය, එකල්හි සුනික්ෂිතකොට ගොතාතුබූ මල්දමක්සේ රන් කරඬුවකින් මාලාකාරයකු අතට මල්දමක් වැඩුවාසේ සල්අත්තනැමී බිසවුන් අත පහළවූවාහ—ඒ අශ්වයසීයදුටු දෙවිබඹුන් විසින් එතන එකබණගෙයක්සේ

දෙහොත්මුදුනේ තබා සාධුකාරදුන්නාහ—මෙසේ උයන්සිරිපිදි මගුල් සල්උයනේ සිරිකල්හි සියත් සොඳුන් උසඇති පරසතු මඳුරා රුකින් ලීලොපෙතව වැටෙන මල්පෙන්තක්සේ රන්ගල් මුදුනකින් නැගි රන් පියුමක්සේ පියුම් මඬලයෙන් නැගි රන් කැකුලක්සේ සුවඳ තෙලෙන්නැගි පහණක්සේ රුවන්කොතලයක පෙරාතුවූ මහෞෂධයක්සේ උඩුමාලෙන් යටිමාලෙට බසිනා කලක්මෙන් මහාබ්‍රහ්මයා අතට වෙසහපුර පසලොස්වක් ලත් විශාඛා නැකතින් ශ්‍රීපාදදෙක බිමට දක්වූසේක; ඒ ඇසිල්ලෙහි දෙලක්ෂ සතලිස් දහසක් ගනකඩ මහා බොල්පොළව කම්පිතව නටන්ට පටන්ගත්තාහ—එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මහාමේරු පර්වතය උයාලූ වේබඩයක්සේ නැමී වැඳ නමස්කාර දුන්නේය෴සතරවරම්දෙවියෝ සතරදෙන දෙහොත් මුදුනෙහි තබා සාධුකාරදුන්නාහ; සියලු දේවතාවෝ දෙහොත් මුදුනෙහි තබා සාධුකාර දුන්නාහ; පාද දෙකට සත් පියුමකින් පියුම් සතක් නැංනාහ; ඒ පියුම් සතට සත් පියවරක් වැඩිසේක කෙලවර පියුමේ සිට නැගෙනහිර දිසාව බැලූසේක; දස දහසක් සක්වළ වෙව්ලන්ට පටන්ගත්තාහ; නැවත දකුණු දිසාව බැලූසේක; ඒ දිසාවත් සුලඟට බැඳි පටකඩක්සේ වෙව්ලන්ට පටන්ගත්තාහ—නැවත බස්නාහිර දිසාව බැලූසේක෴ඒ දිසාවත් සයුරේ රැලකොළියක්මෙන් නටන්ට පටන්ගත්තාහ— නැවත උතුරු දිසාව බැලූසේක ඒ දිසාව මඳුරුගිරි කුලක්මෙන්ද ලෝපහුරක්මෙන්ද නිසන්සලව තිබුවා දැක මාගේ ගුණතරමටනම් වස්තුවක් ඇත්දෝහෝයි දිවසින් බැලූකල්හි—පළමු කකුසඳ කෝනාගම කාශ්‍යපයයි යන බුදුවරුන් තුන්දෙනාවහන්සේට පිටදුන් හැම බෝධින්වහන්සේ පිහිටි සෙසිනුන් තමන්වහන්සේට පිටදෙන බෝධින්වහන්සේ ඒ දිග පිහිටි සෙසිනුත් තමන් වහන්සේගේ ගුණ දරාගන්නා වස්තු සතරක් ඒ දිග පිහිටි සෙසිනුත් ඒ පියුමේ සිට දකුණින් දික්කොට දස දහසක් සක්වලට ඇසෙන ලෙසින් එක සිංහනාදයක්කළසේක; ඒ සිංහනාදය නම් කවරේදයත්? මේ දසදහසක් සක්වල මුළුල්ලෙහි ඇතුළු ගබඩාවකදී පිඹු ජයතුරා සකක්සේ ඇසෙසි, මෙසේ මේ සිංහනාදය පවත්වා නැවත වදාරණසේක්; "අග්ගොහමස්මි ලොකස්ස, ජෙට්ඨොහමස්මි ලොකස්ස, සෙට්ඨොහමස්මි ලොකස්ස, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති" යන මේ ගාථාවෙන් කුමක්කීතියාවදයත්? දෙවියන්ටත් මම්මවැඩිමි, බඹුන්ටත් මම්ම වැඩිමි, නුවනටත් මම්ම වැඩිමි, දිවැසිනුත් මම්ම වැඩිමි, නයින්ටත් මම්ම වැඩිමි, සදෙව්ලොවටත් මම්ම වැඩිමි, දසදහසක් සක්වලටත් මම්ම වැඩිමි, මුළුතුන්ලොවටත් මම්ම වැඩිමි, ඉර සඳ දෙකටත් මම්ම වැඩිමි, මව්පියන් දෙදෙනාටත් මම්ම වැඩිමි, කියා එවේලෙහි තිලකුණුකොට කියා බාලවයසට පැමිණිසේක෴

එවේලෙහි සුද්ධොදන රජ්ජුරුවෝ එබස්අසා මහාපෙළහරින්ගෙණ ගොස් මතුමහල්තෙලෙහි වඩාගෙණ බමුණන් නැකැත්තන් ගෙන්වා කියන්නාහු බමුණෙනි මේ සිද්ධාර්ථ කුමාරයෝ වැඩුනුකල කුමක් කෙරේදැයි විචාළාහ; එබසට බමුණු සත්දෙනෙක් දෑගිල්ලක් ඔසවා දෙතිස්මහාපුරුෂ ලක්ෂණයන් දැක කියන්නෝ ගව උන්නොත් චක්‍රවර්ත්තිරාජ්‍යය කෙරෙති, වළගියොත් බුදුවෙති, මින්මතු නැකැත් නොකියමි කිහ; නැවත බමුණෙක් එකඟිල්ලක් ඔසවා කියන්නේ, මහණව සූවිසි අසංඛ්‍යයක් සත්වයන් අමාමහ නිවන්දක්වා බුදුවෙතියි කිහ; එබස් අසා සුද්ධොදන රජ්ජුරුවන්වහන්සේ කියනසේක්, මේ අරුම පුතනුවන් වහන්සේට කිරිමවුන් සැලැස්සුව මැනවැයි කියා නුවර ඇමතියන් ගෙන්වා විචාළේය; ඇමතියෝ කියන්නාහු එළලු ගැහැණුන් කිරිමව්කමට ගතහොත් කිරිබොනකල ඇඟට උනපවනිසි කියති, කළු ගැහැණුන් කිරිමව්කමට ගතහොත් කිරිබොනකලට ඇඟට ඇල්පවනියි කියති, උස් ගැහැණුන් කිරිමව්කමට ගතහොත් උස්ව තනයට නවපෙවූකලට කර දික්වෙයි කියති, මිටි ගැහැණුන් කිරිමව්කමට ගතහොත් මිටිව තනයට නවපෙවූකලට කර ඇනිරි මූන පැහිරෙයි කියත්, කළු ගැහැණුන් කිරිමව් කටමට ගතහොත් ධර්මයට සිතිමඳ වන්නේය; ලොභ ගැහැණුන් කිරිමව්කමට ගත්හොත් ධර්මයට මඳවන්නේය; ඉතා උස් නොවන ඉතා මිටි නොවන ඉතා කළු නොවන ඉතා එළලු නොවන ඉතා ලොභ නොවන, කුලයෙන් අඩු නොවන, වංශවත් සත්‍රියක් බලවයි කියා නුවර බෙර ලවා තලඑලඑවන් ගැහැණුන් කිරිමව්කමට ගත්තාහ; මෙසේ කිරිපොවා තුන්මැසි වයසට පැමිණියාහ; එකල ඒ රජගෙයි කාලදේවල නම් ඍෂිවර කෙණෙක් ඇත්තාහ; ඉදිරියෙන් සතලිස් කපෙක, ගියදවසින් සතලිස් කපෙක; අසූකල්පයක් එනල් ගියකල් දන්නා ඍෂිවර කෙනෙක ඒ ඍෂිවරයෝ එක් දිවාභාගයෙක උතුරුදිග පෙණී සිටිති; එක් දිවාභාගයෙක හිමාලය පෙණී සිටිති; එක් දිවාභාගයෙක නාලොව පෙණී සිටිති; එක් දිවාභාගයෙක ශක්‍රලොව පෙණී සිටිති; එදවස් ශක්‍රභවනයෙහි සැනකෙළියක් කෙළින්නාහ; එවේලෙහි ඍෂිවරයෝ කියන්නාහු, මෙතෙක් දවසෙක මේ නුවරට එන්නෙමි වේද මෙසේවූ සැනකෙළියක් නුදුටිමි, කුමක්නිසා මෙසේ සැනකෙළියක් කෙළිව්දැයි විචාළාහ; එවේලෙහි දෙවියෝ කියන්නෝ, කිඹුල්වත්පුරයෙහි සුද්ධොදන රජ්ජුරුවන්වහන්සේගේ ගෙයි බුදුවන්නට කුසල්කළ සිද්ධාර්ථ කුමාර කෙනෙකුන් අද උපන්හයි යන බස අසා සැනකෙළියක් කෙළුම්හයි කිහ; එවේලෙහි තාපසයෝ ඒ කුමාරයාගේ කුසල් බලන්ට යම්මැයි සිතා සුද්ධොදන රජ්ජුරුවන්ගේ වාසල් දොර පෙණී සිටිසේක—ඉක්බිත්

තෙන් සුඩොදන රජ්ජුරුවෝ අවුන් තාපසයන් වැදවැටී සිටියාහ; එකල තාපසයෝ මහරජ තොපගේ දේවීන් පුතෙකු ලදහයි ඇසීම්; ඒ කුමරුන් දුන් මම දකිනු කැමැත්තෙමි සිහ; රජ්ජුරුවෝ එබස් අසා ගෙට දිවගෙණ ගොස් පුතනුවන් සුවඳ පැහින් නාවා ලක්‍ෂයක් වටනා පලසකින් වසා ගෙණවුත් මපුතුන් මේ ස්වාමින්වැඳ පින් පුරාගන්නැයි සිතා දක්වූහ; තාපසයෝ බෝසතුන් බැලූහ; එකල මාගේ ස්වාමිදරුවෝ බුද්ධවන ජාතියෙහි කිසිකෙනෙකුන් නොවඳ නාහෙයින්නුන් වැඳුන් ගත් කෙනෙකුන් ඉස සත්කඩකට පැලෙන හෙයිනුත් බෝසතුන්ගේ තේජසින් හිඳගත නොහී තාපසයෝ බිමට බැසපීහ; එකෙනෙහි බෝසතානන්ගේ ශ්‍රීපතුල් දෙක පෙරලී නැමී තාපසයන්ගේ ජටාවෙහි පෙණීගියාහ; මේඝකූටයෙහි පැන නැගි විදුලි දෙකක්සේ විරාජමාන වූහ; ඒ ආශ්චය්‍යීය දුටු පියමහ රජ්ජුරුවෝ ප්‍රේම දරාගත නොහෙහන්නාවූ තෙමේද පුතනුවන්ගේ ශ්‍රීපතුල් දෙක තමන් නලල තබාගත වැන්දූහ; එකල කාලදේවලයෝ මේ කෙසේවූ විශ්ම පුරුෂයෙක්දෝහෝ අද ශක්‍රයා බ්‍රහ්මයා වීනුමුත් මා දැක නොවැඳ නොහෙති; නිරු සඳු දෙදෙනා මා නොකැමැති කරවා ආකාශයෙන් ගමන් යානොහෙති, මේ රජ කුමරුවා එසේවූ මා අතින් වැඳුන්ගත් වැලි ඒකාන්තයෙන් බුදුවේදෝහෝ බුදු ලකුණු චෝහට ඇද්දෝහොයි මිනිකැටසුත්පත් දෙකක් බලන් නාසේ ශ්‍රීපතුල් සුන්දෙක තමන් දැනින් අල්වාගෙණ මඟුල් ලකුණු දුටහ—දෙපතුල්දෙක මැද පිහිටි සක් ලකුණු දෙක දුටුහ; එකළස් චක්‍රය සිසාරා සිටි දෙදහසක් කොදෙව් දෙකය, තාවුතිසාදෙව්ලොව දෙකය යාමනම් දෙව්ලෝ දෙකය, තුසිතනම් දෙව්ලෝ දෙකය, නිම්මානරත්නම් දෙව්ලෝ දෙකය, පරනිර්මිතනම් දෙව්ලෝ දෙකය වසවර්ත්ති දෙව්ලෝ දෙකය. රූපාවචර බ්‍රහ්මපුරෝහිතනම් බඹලෝ දෙකය, මහබ්‍රහ්මනම් බඹලෝ දෙකය, පරිත්තාභනම් බඹලෝ දෙකය, අප්පමාණසුභනම් බඹලෝ දෙකය, සුභකිණ්ණකානම් බඹලෝ දෙකය, වෙහප්පලනම් බඹලෝ දෙකය, අසඤ්ඤසත්තනම් බඹලෝ දෙකය, අවිහනම් බඹලෝ දෙකය, අතප්පනම් බඹලෝ දෙකය, සුදස්සනම් බඹලෝ දෙකය, සුදස්සිනම් බඹලෝ දෙකය, අකනිට්ඨානම් බඹලෝ දෙකය, මේ ආදී දෙසිය සොළසක් මඟුල් ලකුණු කාලදේවලනම් ඍෂිවරයෝ බලා, ලොව්තුරා බුදුවී සූව්සි අසංඛ්‍යයක් සඹයෝ අමාමහනිවන් දක්වන බැව් දිවැසින් දැක දෙහොත් මුදුනේ තබා සාධුකාර දුන්නාහ.

මෙසේ දෙසියසොළසක් මඟුල් ලකුණු ඇසූ ස්ත්‍රී පුරුෂයෝද, සදිව්‍යලෝකයෙහි දේවතාවෝද,මේ මඟුල් සක්වළ දේවතාවෝද අමා මහ නිවන් දක්නානුය— මෙසේ සැදී සිටිනා ලක්‍ෂණය ලෝම ධාතු

මෙන් දැක අමා පිරුණු කරඬුවක් මෙන් දිවිදලින් ඔප්නැඟූ රන්පිළිමයක් මෙන් හෙලිතුඩකින් ඇඳ සිටුවාලූයේ මේ සාරාසංඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි කළාවූ කුසල් එකිනෙකට පලදෙනකල දුටු දුටුවන්ගේ සිත් සතුටුවන්නාහ; ' ඒකාන්තයෙන් මේ මහෝත්තමයානෝ ලොවුතුරා බුදුවෙනවා නියතය දැන දසදහසක් සක්වළත් සදෙව්ලොවන් එක බණගෙයක්සේ කොට ලොව්තුරාබුදුව සූවිසි අසංඛ්‍යයක් සත්වයන් අමාමහ නිවන්දක්වන නියාව දැක තාපසයෝ සිතන්නාහු මේ මහෝත්තමයානන්වහන්සේගේ ශාසනයෙහි මමත් නිවන්දකිම්දෝහොයි තමන්ගේ කුසල් බැලූයේය; කල්පාන්තරය කිනුත් විනාශය සැළසුනු කල අරූපභවයෙහි උපන්කල බුදුවරයන් දහසක් බුදුවුනත් ඔහුගේ අසු නොගෙවෙන බව දැක තාපසයෝ අඬන්ට ගන්හ; මහදියකලයක් මැදින් ගැසුනාසේ තාපසයන්ගේ නිකටින් දැලිනාවරගෙණ වැගිරෙණ කඳුලු දැක සුඩොදන රජ්ජුරුවෝ සිතන්නාහු ගියදවසින් සතලිස් කපෙක ඉදිරියෙන් සතලිස් කපෙක අසූකල්පයක් එනකල් ගියකල් දන්නාවූ සෘෂිවරයෝ අඬන්ට පටන්ගත්තේ මාගේ රාජකුමාරයන් වහන්සේට වන දුකෙක්ද රටට වන දුකෙක්දැයි සිතසිතා කනස්සලුව සිටියාහ: රජ්ජුරුවන්ගේ සිතදුක් දැක තාපසයෝ කියන්නාහු රජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේගේ රාජකුමාරයෝ දසදහසක් සක්වළත් මේ මඟුල්සක්වලත් සදෙව්ලොවන් එක බණගෙයක් කොට ලොව්තුරා බුදුව සූවිසි අසංඛ්‍යයක් සත්වයන්ට අමාමහ නිවන් දෙනසේක, මාගේ කුසල් බැලිමි, කල්පාන්තරයකින් විනාශව අරූපභවය උපන් කල බුදුවරයන් දහසක් බුදුවුවත් ගොඩයා නොහෙන හෙයින් ඇඬුවෙමි කීහ; එවේලෙහි සුඩොදනරජ්ජුරුවෝ සතුටුව කිරිබරින් නැමුනු ඇල්පදුරක්සේ සිටගතනොහී සෙසුදරුවන් වැදුවන්ටත් මෙසේ සමාධිවේවයි කියා දෙහොන්මුදුනෝ තබාගෙණ සාධුකාර දිදී මේ මාගේ පළමුවන වැඳීමයයි කියා වැදහොත්තේය; ඒ ආශ්චර්‍ය්‍යය ඇසූ දෙව් බඹුන් විසින් එතන එක බණගෙයක්සේ සාධුකාර දුන්හ—මෙසේ පළමුවන වැඳීම ලැබූ ඉක්බිති සත්මැසි වයසට පැමිණිසේක; එකල්හි රජ්ජුරුවන්ගේ වප්මඟුල් කරවන වේලෙහි බලන්නාසේ එක්මධ්‍යයෙහි දඹසෙවනැල්ලෙහි යානාවක් කරවා බෝසතානන්වහන්සේ යානාවට වඩා වටතිර වියන් බඳවා කිරිමවුන් එතනට සලස්වා ඒසියක් රජදරුවන්ට රං නගුල් රං වියදඬු රංකෙවිටි රං සිවැල් සියලු රජ සේනාවට ගොනුන්ට රං සැට්ටයෙන් සරහා ඒසියයක් රජදරුවෝ ගොවිකර්මාන්තයට පටන්ගත්තාහ; ඒ ගොවිකර්මාන්ත ඓශ්චර්‍ය්‍යය ඇසූ සුඩොදන රජ්ජුරුවෝ බලාසිටියාහ; එවේලාවට ඉරිදෙවියෝ ඇවිදින් බෝසතානන්

වහන්සේට සෙවනකොට සිටිනලෙසත් දැක දඹසෙවනැල්ලේ ඔබ මොබ නොගොස් පිල්ගුඹයක්සේ දඹරුක් මුදුනේ සිටියා දැක සන්තෝෂව යහන් මස්තකයෙහි වැඩඋන්සේක.—කිරිමව් මේ ආශ්චර්‍ය්‍ය දැක රජ්ජුරුවන්ට නොසින් කියන්නේ ඉදිරියෙහි සමසකින් වන සමාධිනබා දුන්මවන සමාධියක් බැළුවමැනවයි නුඹවහන්සේගේ පුතනුවන්වහන්සේ සඳමඩලක්සේ යානාමධ්‍යයෙහි වැඩහිඳීනා සොඳකමක් බැළුව මැනවයි ආරාධනා කළාය.—එවේලෙහි රජ්ජුරුවෝ එබස්අසා දිවඅඳුන් අනේ පුතනුවන්වහන්ස දුටුදුටුවන්ගේ සිත්ගන්නා අරුම කොයේද්දයි ඉරුත් නුඹඇර නොයෙයි මනා වෘක්ෂසෙවනත් නුඹඇරනොයෙයි අද මම නුඹඇර ගියෙමි මාවැනි එතක්නු තබා දිව්‍යබ්‍රහ්මයන් නුදුටුවානුය; ඒ ආශ්චර්‍ය්‍යයක් නුමකන්නිසා සෙන්වනසේක්දැයි මෙසේවූ ආශ්චර්‍ය්‍යයකට මාගේ ජීවිතය පුදපියමිද සත්වන් රාජ්‍යය පුදපියමිදැයි රජ්ජුරුවෝ කියා දෙහොත් මුදුනෙහි තබාගෙණ කියන්නාහු සිද්ධාර්ථකුමාරයෙනි, නුඹව මේ මාගේ දෙවන වැඳිමසයි කියා වැඳ හොන්නේය—උන්වහන්සේ වැඳි කල්හි එසියයක් රජදරුවෝ දෙහොත් මුදුනෙහි තබා සාධුකාරදී වැඳ වැතිරගත්තාහ.—මෙසේ කලාවෙන් කලාවට වැඩෙන පූර්ණචන්ද්‍රයා මෙන් වැඩී සොළොස් ඇවිරිදි වයසට පැමිණිසේක.—එකල්හි සුද්ධෝදන රජ්ජුරුවෝ සිතනුයේ, එදවස් බමුණෝත් සෘෂිවරයෝත් රාජශ්‍රී නොවිඳ මහණව බුදුවෙතියි කීවුය, ඊට යාණොදී සිටුවා ගණිමිහි සිතා කෝලියවංශයෙන් බිසෝවරුන් දහසකට නායකවූ යසෝධරා දේවීන්වහන්සේ සරණපාවාදී ගෙවල් මඟුළුත් ඔටුනු මඟුළුත් තුන්මගුල්ම එකඳ කරවා එමද රට පාවාදීලා එකුන් තිස් අවුරුද්දක් චක්‍රවර්ති දේවේන්ද්‍ර ලීලාවෙන් රජකම් කොට උයන් කෙළිපිණිස වඩිනා දවසෙක දෙවියන් විසින් මවාපානලද එක්සිය විසිවයස්ගිය ඇස්දෙක මොරලොද දෙකක්වැනි යතුමට ඇකිලීගිය දදනසෙන්සුන් වේශයක් පැළුහ—බෝසතානෝ කිමෙක්දැයි විචාළසේක.—ස්වාමීනි මේ මහල්සත්වල උපන්නාහු මහළු කල විඳිනා අන්තරාය දුඃඛයයි කීහ; එදවස් අනිත්‍යය භාවනාකොට උයන් කෙළියට නොගොස් රජ ගෙටම වැඩිසේක.—දෙවනවාරයෙහි දෙවියන් මවාපානලද ව්‍යාධිරූවක් පැළුහ; කෙනෙක්විසින් ඔසවන්නාවූද, හිඳුවන්නාවූද, සතප්පන්නාවූද, කවන්නාවූද, පොවන්නාවූද, ආතුරවූ ගිලන්වූ දුකින් පෙළෙන ඒ ව්‍යාධිරූපදුක බෝසතානෝ කිමෙක්දැයි විචාළසේක—ස්වාමිනි මේ මඟුල්සත්වල උපන් මිනිස් සත්වයෝ ලෙඩවූකල විඳිනාඅන්තරාය දුඃඛයයි කීහ; එදවස් උයන්කෙළියට නොගොස් අනිත්‍යය භාවනාකොට රජගෙට වැඩිසේක.—තුන්වන වාරයෙහි දෙවියන් මවා පානලද මළරූවක් පැළුහ; නව දෙරින්

නික්මෙන පණුකැලඟා ඇස් උඳුරාකන කබරගොයින්ද දැක බෝධි සත්වයෝ මේ කිමෙක්දැයි වදාළසේක෴මගුල් කපුවා මේ මගුල්සක් වළ උපන් මිනිසුන් මළකල විඳිනා අනතුරාය දුඃඛයයි කීහ; එදවස් උයන්කෙළියට නොගොස් අනිත්‍යය භාවනාකොට රජගෙට වැඩිසේක෴සතරවන මාරයෙහි දෙවියන් මවාපානලද කුහුස් නොම්විවන් අඳනා බඳනා සිවුරක් ඒකාංශකොට වසාගෙණ ඉස් මුඩුව දත සුදුවන් මහණ වෙසක්පැලූහ; ඒ දැක මහණවීම ඉතා හොබනේයයි සිතා සතුටුවූසේක෴ එවේලෙහි ශක්‍රයාගේ පඩුඇඹුල්සල හුනුවගිය කල්හි ශක්‍රයෝ කාටවත් දුකෙක්ද‍ෙහෝයි දසදහස්සක්වළ නුව නැස් දහසක් ලා බැලූසේක෴ සිඩාර්ථකුමාරයන්වහන්සේ බුදුවන්ට කැමති නියාව දිවැසින් දැක විශ්වකර්ම දිව්‍යපුත්‍රයා ලඟට කැඳවා කියන්නාහු තෝ ගොස් සිඩාර්ථකුමාරයන් වහන්සේ සරහා එවයි කියා නියෝගකළසේක෴එවේලෙහි විශ්වකර්මදිව්‍යපුත්‍රයා කපුවෙසක් මවාගණිමින් තමාගේ දෙව්ලොවින් පුසැටක් ආභරණ ගණිමින් සළුදහසක් හරුනගමින් එක්සළුවක් අඳවමින් නිල්මෙඝකුලක් මෙන්ද සඳමඩලක්මෙන්ද බෝසතානන්වහන්සේ සරහා ඇතුපිට වඩා හිඳුවා මගුල්උයනේ උයන්සිරිවිඳිමින් මගුල් ස්ථානයෙහි වැඩ සිටුවා තමා දෙව්ලොවට ගියේය; බෝසතානන්වහන්සේ ශ්‍රියහන් මුඳුනෙහි රාජවිලාසයෙන් වැඩඋන්සේක෴එවේලෙහි සතලිස් දහසක් නාටිකාඟනාවෝ ආතතය විතතය ආතතවිතතය ඝනය සුසිරය යන පචතූර්‍ය්‍යනාදගෙණ ක්‍රීඩාකරන්ට පටන්ගත්තාහ; බෝසතානන්වහන්සේ සිහනසේක් කෙළිබලා උන්සේන්නම් මාගේ ගමනට අනතුරාය වන්නේයයි සිතා නොනිඳ නොගිඳ ගෙට දැව පිටිපා මා සම්කළසේක෴අපගේ ස්වාමින්වහන්සේ නොබලා නිදනකල අපි කාට සේවය කරමෝදැයි කියනියා තමතමන්ගේ තූර්‍ය්‍ය වැලඳගෙණ වැතිරයියාහ; සබ නිදන්නවුන්ගේ දත්කැවිලි නාසා පිඩි කැසිකැස සෙම් ගිලිම් මරණාහඩහැටි විකාර දුටු මහබෝසතානෝ එතන අමුසොහොනක්සේ සිතා මෙතනින් මා යාසුතුයයි සිතා යහනාවෙන් බැස දොරකඩ ඔත් ඡන්නනම් අමාත්‍යයා බනවා කන්තකනම් අශ්වයා සඳුගෙණෙවයි නියෝගකළසේක෴ඒ වේලෙහි ඇමතියා අසුසඳ ගෙණා කල්හි උරෙහිදු බැණ කෙණෙකුත් විසින් ගොතන ලදී,

නිබ්බුතා නූන සා මාතා, නිබ්බුතානූන සො පිතා
නිබ්බුතා නූන සා නාරි, යස්සායං ඊදිසොපති.

යනමේ ගාථාව අසා සුවහස්වටනා ගෙළෙහි තිබූ මුක්තාහාරයක් අසුනැඟී පවුරුපැනයම් සිතුවේලාවට යසෝධරා දේවීන්වහන්සේ රාහුලනම් පුත්රුවනක් වැදුහයි අසා ඒ වේලෙහි ගෙණහැර දක්

වනසේක්.—"රාහුලොජ්ඣතො බ්‍යඛුනා" යනාදීන් කුමාරස්සොද සත් දරුවෝනම් සසර සිටින මලෙක එසේවිනමුත් මපුතකුමරුන් වඩාගෙණ සනසාපියා යෙමි සිතා බිසෝගෙට වැඩිසේක.—ඇතුල්දොරින් එක් ශ්‍රීපාදයක් හෙයිනබා පුතනුවන් බැලූසේක් දිව්‍යාංගනාවක් මෙන් ඒ කුමාරයා ලෙහිලා නිදනා බිසවුන් දැක ඉදින් මබිසවුන්ගේ අත ඉවත්කොට මපුතකුමරුන් වඩාගෙණ සනසම් නම් බිසවු පිබිදිති නම් මාගේ ගමනට අන්තරායවන්නේයයි සිතා මේ එනම පුතකුමරුණකුන් සඳහා සමාවිම්නම් මාගේ මේ ලෝකයෙහි දුක්විඳිනා සුවිසිඅසංඛ්‍යයක් දරුවන්ට මා නොසිතන නියාවේදැයි සිතා එබඳුවූ රාජ්‍යයකුන් එබඳුවූ බිසෝකෙනෙකුන් මෙවෙනි පුත්‍රරත්නයකුන් හැර පියා ශ්‍රීපාදය පිටතට ගසාගත් මහබෝසතානන් වහන්සේ කවර නම් කෙනෙක්ද? එමවිටම බුදුබව හැයි කියති; එවේලෙහි අනගි පවුරු පැනගෙණයෙමි, සිතූවේලාවට අද්‍ය සිතන්නේ තාරකා දිව්‍යලෝකය උඩින්වත් පනිම්යි සිතුවාහ; අමාත්‍යයා සිතන්නේ සදිව්‍යලෝකය උඩින්වත් පන්නම්යි කිහ; එවේලෙහි දහසක් පියාලන දහසක් හරින දොර ජාතිජාතියෙහි ආ යාචකයන්ට තමන්වහන්සේගේ දොරට පැමිණි යාචකයන්ට දොරනොපියා කුසල්කල අනුහසින් සුලඟට ගිය වලාකඩක්මෙන් වාසල්දොර තෙමේම හැරීගියේය එදවස්හල දොරටුවෙන් අසුපැන් නැවූසේක.—එවේලෙහි වසවතී මාරයා සිතන්නේ බුදුන් බුදුවූ කල එක්සියසැතිස් නරකාදිවල් හිස්වන නියාවත් සදෙව්ලොව රැස්වෙනනියාවත් නිවන්පුර පිහිටුවනා නියාවත් දැක ඒ ගමන් යානොදෙම්යි සිතා නිල්මෙසකුලක්මෙන් අසෙකුට නැගී අවුත් වාසල්දොර පෙණිසිට සන්දවසකින් ඇතුළත සතිස්ලක්ෂ දසදහස් තුන්සිය තෙපනස් යොදුන් චක්‍රවාටය ඇතුළත සක්විති රාජ්‍යය පහළවේයි මේ ගමන් ගොසින් කවරනම් වැඩෙක් එව්ද නොයව නොයවයි කියා නවතින්ට කිය; එවේලෙහි මහාබෝසතානන්වහන්සේ සිතනසේක් මොහු අනිකෙක් නොවෙයි වසවර්තිමාරයයි සිතා ඒ සක්විති රාජ්‍යයට වඩා බුද්ධ රාජ්‍යය මට ප්‍රියවන්නේය, තාවැනි එක මාරයෙකු තබා දසදහසක් සක්වල මාරයෝ අවුත් කීනමුත් මා නික්මුන ගමන් නොනවතිම් අයත්පුරුෂය තෝ පලායවයි වදාළසේක.—එබසට රතැස් ඇතිව මහත් කෝපයෙන් කියන්නේ වරදක් දුටිම්නම් ඉස සත්කඩකට ගයා පන්නම්යි කියා තමාගේ දෙව්ලොවටම ගියේය; ඔහු ගිය පසු බෝධිසත්වයන්වහන්සේ බුදුබවපතා නික්මුනුසේක.—අසුගේ කුරය ගැස්ම දන්ඩෙක ගැසුනු ලෝම්තියක්සේ අඩගැසෙයි අසුගේ කුරගැස්ම ඇසුම් නම් නුවරවාසීහු අඩා මූරගා මා බුදුබන්ධ නොදෙති එවිට සූවිසි අසංඛ්‍යයක් මගේ දරුවෝ කාගේ මූනබලා ගැලවෙද්දැයි සිතූකල්

ඒ සිහිබිලි දෙවියෝ දිවසින් දැක අවුත් අසුපය අල්ලෙන්ගෙණ රාජ වීථිය ගෙවාහ; රාජවීථි කෙළවර සිට අනෝමා නම් ගංතෙරට බැස දකුණුදිගට සැටදහසෙක වමට සැටදහසෙක දෙපොල දෙසැටදහසෙක දෙවියෝ මිනිදඹු වැට පහන් පූජා කළාහ; දසදහස් සක්වළ දෙවියෝ බල්පිදුනා සලමින් සිටියාහ; දසදහස්සක්වල දෙවියෝ වීනාගායමින් සිටියාහ; දසදහස් සක්වල දෙවියෝ ෂේසත්ගෙණ සාධුකාරදිදී සිටියාහ; දසදහසක් සක්වල ශක්‍රයෝ එකවිට පිඹිකල සාරමස් දෙපෝයක් ශබ්දය සිටිනා එක්සිය විසිරියන් "ජය තුරාසක" පිඹිමින් සිටියාහ; බෝධිසත්වයන් වහන්සේ දෙවියන් කරණ පූජාසත්කාර විඳ තිස්යොදුන් සතර ගෙවා අනෝමානම් ගංතෙරට අසුපැන්නුසේක෴ දෙළොස් යොදුනක් පුළුලින් හා අට සිය රියනක් ගැඹුරුඇති ගඟේ අසුගේ ඛුරය නොතෙමා ගඟින් එතරට ගොස් අසුපිටින් බැස අනෝමානම් ගංතෙරදී විදුලියක් මෙන් මඟුල්කඩුවගෙණ කේසධාතුව කපා උඩට දැමූකල්හි බඹර වැලක්මෙන් ආකාශයට ගමන්කරණ කේසධාතුව දැක ශක්‍රයෝ අසූ රියන් උසඇති රන්කරඬුවක්ගෙණ කේසධාතුව කරඬුවෙහි ලාගෙණ ගොස් දෙලොස්යොදුන් උසඇති සිළුමිණි සෑයක්බැඳ පූජාකළේය; එවේලෙහි ඝටිකාරනම් මහාබ්‍රහ්මයා තමාගේ දෙව්ලොවින් ගෙණ අටපිරිකර පූජාකළාහ; අටපිරිකර පිළිගෙණ සිවුරු පැළඳ හත්සළුව අහින්ගෙණ මට බුදුබව සිඬවේනම් ගුවන්තෙලෙහි සිටිවයි අධිෂ්ඨානකොට අහසටදැමූසේක෴ කොකුගේ පියාසරයක්මෙන් සිටි මගිම දැක ඝටිකාරනම් මහාබ්‍රහ්මයා අසූරියන් උසඇති මැනික්කරඬුවක ලාගෙණ තමාගේ බඹලොවට ගෙණගොස් දෙළොස් රියන් උස ඇති සළුමිණිසෑයක් බැඳ පූජාකළාහ; කැප්‍ර කොස්වැටියත් ඇඳි සළුවත්, අහස්කුසෙහි රැඳිනියාදැක බුදුබව නියතයයි දැනගෙණ කැටුව ගිය අමාත්‍යයාත් අසුත් නුවරට එන්ඩ සමුදී තමන්වහන්සේ රජගහනුවරට වැඩ ගෙපිළිවෙළින් සිඟාවලදන්ට පටන්ගත්සේක෴

නුවර වැසියෝ ඒ දැක බිඹිසාර රජ්ජුරුවන්ට කියන්නාහු ස්වාමිනි සසලප ආකාශය හැර රාජවීථි මධ්‍යයෙහි ගමන්කෙරෙති කිහ; රජ්ජුරුවෝ ඒ අසා මේ කුමණ බසෙක්ද සසලප දෙරණයෙහි ගමන් කරන්නේ කවර කලකදැයි මතුමාලෙන් බැස අවුත් බෝධිසත්වයන් දැක කියන්නාහු ස්වාමිනි මේ නුවර මුළුරාජ්‍යය කළමැනවයි මම නුඹවහන්සේගේ අවසරින් යුවරජකම් කෙරෙමි කියා ආරාධනා කළාහ; මහබෝසතානන්වහන්සේ වදාරණසේක් නුඹගේ රාජ්‍යය තබා සත්‍රිස්ලක්ෂ දසදහස් තුන්සිය තෙපනස්යොදුන් චක්‍රවාටය ඇතුළත සක්විති රාජ්‍යය නොකමැත්තෙමි නිවන්පුර නිසා ආමි වදාළසේක෴ ඒ අසා රජ්ජුරුවෝ වැඳ එකත් පසව සිට

කියන්නේ, ස්වාමීනි බුදුව වැඩිකල පළමුව මට ධර්මදේශනා කළම්‍ැ
නවයි කියා ආරාධනා කළාහ; පිළි වදන්දී ගමන් පසුකොට සැත
පුනුසේක෴ එවේලෙහි බෝසතානන් වහන්සේ ඉසිපතන වෙහෙ
රට වැඩ බුඩකෘත්‍යයට පටන්ගත්සේක෴ උගුරානෙති හොපි කුමක්
කැමතිද තොපට පැනිකැමතිද සකුරු කැමතිද මම තොප සිතුවක්
නොකෙරෙම් මම්ම මා සිතුවක් කෙරෙමි, තොප සිතුවක් කෙලෙම්
නම් බුදුබව සාදුගත නොහෙම් මහාමේරු පර්වතය එක අතකින්
උසුලාගන්ඩ පුළුවන් නමුත් බුදුබව සිඩනොවන්නාහ; දවසකට
උඳැටක් සා ලදත් උඳටින් භාගයක් ලදත් කඩ සාලටයක් ලදත් ඒ
තමා නොලදත් ඉවසා ඉදිම් මෙසේම නොවලඳා ඉඳ බඩසම්පිට ඇලිපිට
සම් බඩඇලීගිය ඇස්දෙක වලවැදීගියේ දෙකන් සිදුරුවගිය නහර
වැල් ඉපිළගිය සන්ධි වෙනවෙන ගිය සුලඟ ගැද කල වැටිපියනසේක
සුලඟ නැතිකල නැගී සිටිනසේක; දවසක් බෝසතානන් වහන්සේ
සුලඟින් වැටී අත්පා සන් නැතිව ඔත් කල්හි එපවත් දේවතාදුවක් දැක
ලෙහි අත්ගසා අඬමින් යුහුවගොස් සුඩොදන රජ්ජුරුවන්වහන්
සේට කියන්නී නුඹවහන්සේගේ සිඩාර්ථකුමාරයෝ මළෝවේදැයි
කීහ; එම්බල දේවතාදුව ඒ නබා ශඞ්කයෝ කීනමුත් නොඅදහම් කීහ;
දෙවනුවත් දේවතාදුව යන කලට නැගීසිටිසේක෴ එසේම අවුත් රජ්
ජුරුවන්වහන්සේට නුඹවහන්සේගේ රාජකුමාරයෝ නැගීසිටිසේ
කැයි කීහ; එබස්අසා රජ්ජුරුවෝ සාධුකාරදුන්හ; එදවසේදී බෝස
තානන්වහන්සේ වෙල්මඩ්‍යාන සුවයෙන් වැඩඋන්සේක෴ ගො
පොල්ලෝ දෙන්නෙක් කළ අප්‍රසන්නය දැක නොමල ගසක් එල්බ
වාගණ සිතනාසේක් තදින් නොවලකී මොලකින් වන්ලෙස් සිතා
සීඝා වලඳන්ඩ පටන්ගත්සේක෴ පුරපසලොස්වක ලත් චන්ද්‍ර දිව්‍ය
පුත්‍රයෙකුසේ බබලන්ට පටන්ගත්සේක෴ ඒ වේලෙහි සිඟා වලඳා
අජපාලනම් නුගගසමුල වැඩඋන්සේක෴ වැඩඋන්තැනට සුජාතා
නම් ඒ කත දුන් කිරිපිඩු රන්තලිය අල්ලේ තබාගණ තිල්මේතර
නම් ගංතෙරට ගොස් එසින් වැලි පීරා එකතැන්කොට රන්තලිය
එහිතබා එදා ගඟට බසිමින් ගඟ මසුරන්වත් කෙරෙමින් විදුරුගිරි
කැලකට මෙඝනූඨයක් පවත්වන්නාසේ පය ක්‍රීඩාකෙරෙමින් විදුලි
යක් පරදවන රඟ පටිධාතුව බදිමින් වැල්ලේ සක්මන් කෙරෙමින්
අතුල් පිට අතුල්දි පතුල් පිට පතුල් දි ඝනරන් පිළිමයක්සේ වැඩ
හිඳ එකුන්පනස් දවසකට එකුන්පනස් පිඩුකොට වැලඳූසේක෴
වලඳා ඉක්බිති තලියගඟට දමා මෙසේ සිතූසේක; ඒ කෙසේදයත්?
මේ මාසිතූ බුදුබව සිඩවේනම් රන්තලිය උඩුගං බලා යේවයි
අදිෂ්ඨාන කළසේක෴ එවේලෙහි රන්තලිය සත්රියන්ගෙයි යට
යෙන් විසිඝටයක්පමණ තුන් උඩුගන් දිවගෙණගොස් සළා වැටුම්දී

පළමු කකුසඳ, කෝනාගම, කාශ්‍යප යයි යන බුදුහු තුන්දෙනාවහන්සේගේ තලිතුන යටහොට ක්‍රිං යන ශබ්දයෙන් වැටුනු හඬෑය, එසේම සතර අපායේ අකුල් වැටුනු හඬය, සදෙව්ලොවට නැගෙණ රුවන් ගිනිපෙත්තේ හඬය, නිවන්පුර දොර ඇරුනු හඬය, සූවිසි අසංඛ්‍යයක් සබ්බයන් අමාමහනිවන් දක්වන හඬයයි දෙහොත් මුදුනෙනි තබා සාධුකාරදෙනහඬය, ඒ ශබ්දය ඇසූ මහකෙළ නාගරාජයා කියන්නේ, පළමුදත් බුදුකෙනෙක් බුදුවූසේක෴පෙරයිද්දත් බුදුකෙණෙක් බුදුවූසේක෴ඊයෙත් බුදුකෙණෙක් බුදුවූසේක෴අදත් බුදුකෙණෙක් බුදුවූසේක෴උන්වහන්සේගේ බුදුමඟුලට යම්හයි කියා තමාගේ නවකෙළ ලක්‍ෂයක් නයින් පිරිවරාගණ බුදුමඟුලට එන්ට පටන්ගත්තාහ; බෝසතානන් වහන්සේ සල්වනයේ දිවා විහරණයකෙරෙමින් එහි සැතපී දවස් පසුකොට සොත්ථියනම් බමුණුදුන් කුසතණ අටමිටක් පිළිගෙණ අප්‍රධිතවූ පස්වාදහසක් කල් බුදුබව පවතීවයි සිතා බුදුබවට වැඩිසේක෴එවේලෙහි දෙලක්‍ෂ සතලිස් දහසක් යොදුන් ඝනකඩ මහාබොල්පොළොව සත් ආකාරයකින් කම්පිතවිය; ඒ ආකාරයනම් කවරේදයත්? මේ මහාපොළව නැගෙනහිරින් උඩනැගෙයි බස්නාහිරෙන් බසියි දකුණු දිගින් සැලී උඩනැගෙයි උතුරුදිගින් සැලී උඩනැගෙයි සතරදිගින් සලිතවද මැදිපොළව බසින්නාහ; මෙසේ ආකාර දුටු මහබෝසතාණෝ බස්නාහිර බැලූසේක ඒ දිසාවත් කම්පිතවිය; දකුණු දිශාව බැලූසේක෴ඒ දිසාවත් කම්පිතවිය; නැගෙණහිර දිසාව බැලූසේක; ඒ දිසාවත් කම්පිතවිය; ඒ ස්ථානහැර උතුරු දිසාව බැළුසේක; නිල්මේඝකුලක්මෙන්ද ලෝපහුරක්මෙන්ද ඉන්ද්‍රනීල මාණික්‍යයක්මෙන්ද රිදීකඳක්මෙන්ද සෝභාමත්ව බබලාසිටි ශ්‍රීමහාබෝධීන්වහන්සේදූක පෙරත් බුදුන් බුදුවූ ස්ථානය මේයයි සිතා විදුරස්නට හිමිතැන් දැක මට බුදුබව සිඬවේවයි අධිෂ්ඨාන කොට අතින්ගත් කුසතණ එතනදමූසේක෴ඒ වේලෙහි දෙලක්‍ෂ සතලිස්දහසක් යොදුන් ඝනකඩ මහපොළව අත්බඹරක්සේ ගුගුරන්ට පටන්ගත්තාහ; එවේලෙහි තුදුස්රියන් උසඇති වජ්‍රාශනයෙක් පැණනැංගාහ; එවේලෙහි සිතනසේක් මේ සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි මනුෂ්‍යයන් තබා දිව්‍යබ්‍රහ්මකෙණෙකුන්ටත් කරත්නාතබා සිතන්ටත් අවිෂයවූ දනාදි පින්කොට මේ වජ්‍රාශනය ලදිමි මේ ඇසිල්ලකුත් හැරනොයෙමි මුලුපොළවෙහි පස් පරදා මස්දන්දී මහසයුරේ දිය පරදා ලේ දන්දී අහස තරු පරදා ඇස් දන්දී මහමෙර පරදා ඉස්දන්දී අඹුදරුවන් යාචකයන්ට බැඳදුන් වැල්ගොඩ එමකී මහාමේරුව උසවත් උස්වන්නාහ; මෙසේම දන්දී ලද්දාවූ වජ්‍රාශනයත් බෝධි වෘක්‍ෂයත්

හැරපියා නොසෙමි අධිෂ්ඨානකොට මාගේ ඇස් සම් ඇටදිරා සුණුව ගියේනුමුත් ලොවුතුරා බුදුව මිස මේ ආසනයෙන් නොබසිමියි සිතා අතුල්පිට අතුල්තබා පතුල්පිට පතුල්තබාගෙණ ගිරු අස්තයට යන තුරු පස්වරු යවිලෙහි ශ්‍රීමහාබෝධීන් වහන්සේට පිටදී නැගෙණ හිරට මූනලා චතුරඞ්ගසමන්විත වියඹාධිෂ්ඨානයෙන් පාදබන්ධන කොට වියඹ පාරමිතාව ගෙණහැරදක්වා රන්පිළිමයක්සේ වැඩඋන් සේක... එවේලෙහි සතරවරම්දෙවියෝ සතරදෙන සතරදිග රැක වල් ගන්නාහ; මෙසේ ප්‍රමාණනැහි ශක්‍රබ්‍රහ්ම නාගාදි සියලු දෙවියෝ පූජාකරන්නාහ; වසවර්තිමාරයා ඒ බුද්ධශ්‍රිය බලා හිඳගත නොහී සිද්ධාර්ථකුමාරයාගේ විෂයඉක්මවනු පිණිස ඝුළුවක්කෙරෙම්ද අදකල් ඌසිතුවා සිද්ධියනොදෙමි ඌගේබලත් මාගේබලත් බලමි දසබිම රක් මරසෙනගමවා මෙසේ විධානකරලූය; ඒ කෙසේදයත්? කොල දෙදෙනෙක් එක්වෙසක් නොගණුව එක්වන් ආයුධයක් නොගණුව එක්වෙනි ආභරණයක් නොපලඳුව තොප තොපගේ යම්ආභරණ යෙහි නා පොලොන් ආදිවූ සර්පාභරණ පැලඳ නොයෙක් ආයුධගත් අත්ඇතිව ශරිර ගිනිසේ මවාගණ තොප තොපගේ එකෙකු දුටුවන් බයගන්වන වෙස්මවාගෙණ ගොස් සිද්ධාර්ථකුමාරයා සැඟවී පලායා නොදී අල්වාගෙණ සතුරා මා ඇස පෙනීයානොදී දෙකකුල අල්වා ගණ පරසක්වල ගසාපියව ආසනේ මට අරගණ දෙවයි කියමින් මරුවෙස්මවමින් වසවර්තිමාරයා යුද්ධයටවන්ග–ඒදක සහම්පතී මහා බ්‍රහ්මයා බුදුන්ට අල්වාගණසිටි සේසත සක්වගලපිට තබා සැඟවී පලාගියේය; සුමනනම් තුසිත සියලු දෙවියෝ කරණපූජා තබා ඒ ඒ අත දිවගන්නාහ; සතරදිග රැකවල්ගත් සතරවරම් දෙවියෝ තමතමන්ගේ පිරිවර නොබලා දිවගන්නාහ; මහාකෙල නාගරාජයා නාගසේනාවත් පිරිවරාගෙණ බුදුගුණ කියක්යා පූජාකරන්නෝ පොලව කිමිදගණගොස් තමාගේ නාග භවනයට ගියේය; එකල බෝ සතානෝ සාරාසංඛ්‍යකප්ලක්‍ෂයක් මුළුල්ලෙහි පිරුවාවූ දසපාරමිතාවෝ කොයිද්දසිසිතුව්ලෙහි දසදහසක්සක්වල මාරයෝ බිම්බරක් බැගින් ගෙන්වූනුමුත් අප දසදෙනා සිටිනාතැන ජය ගත නොහෙමි නුඹ වහන්සේ සිතා මැඩහුන් බුද්ධකෘත්‍යයසාදවැඩහුනමැනවයි මේමාර සටන් අපට ඇරවදලමැනවයි කියා බුදුන්අභින් අවසරගෙණ දාන පාරමිතානැමති යෝධයානෝ බිම්බරක්බිඳ ජයගත්තාහ; සීලපාරමිතා නැමති යෝධයානෝ බිම්බරක්බිඳ ජයගත්තාහ; නෛෂ්ක්‍රම්‍ය පාරමිතා නැමති යෝධයානෝ බිම්බරක්බිඳ ජයගත්තාහ; ප්‍රඥාපාරමිතා නැමැති යෝධයානෝ බිම්බරක් බිඳ ජයගත්තාහ; වියඹපාරමිතා නැමති යෝධයානෝ බිම්බරක් බිඳ ජයගත්තාහ; ක්‍ෂාන්තිපාරමිතා

නාමැති යෝධයානෝ බිම්බරක්බිඳ ජයගත්තාහ; සත්‍යපාරමිතා නැමති යෝධයානෝ බිම්බරක් බිඳ ජයගත්තාහ; අධිෂ්ඨාන පාරමිතා නැමැති යෝධයානෝ බිම්බරක්බිඳ ජයගත්තාහ; මෛත්‍රී පාරමිතා නැමැති යෝධයානෝ බිම්බරක් බිඳ ජයගත්තාහ; උපෙක්ෂා පාරමිතා නැමැති යෝධයානෝ බිම්බරක් බිඳ ජයගත්තාහ; මෙසේ දශ පාරමිතාවෝ දසදෙන තමතමන් බිම්බරක් ගැගින් බිඳ ජයගත්තාහ; වසවර්තිමාරයා තමාගේ මාරසේනාව බිඳී පලා ගිය කල කිසි ඛක්කොට ගන්ඩ අසමර්ථව සිටියාහ; මරසෙනග ගියේ කිම්ද? මම ගොස් ජයගණිමියි සිතා ගිරිමේඛලා නම් ඇතුපිට ගිඳ අංකුශයෙන් මෙහෙයා දක්‍ෂයක් අනින් ගිනිගෙණ දිලිහෙන ආයුධගණ මහබෝ සත්‍යනන් ඉදිරියට අවුත් සිද්ධාර්ථකුමාරය මාගේ ආසනයෙන් බැස සියට උන්නෙහිනම් තාගේ දෙකකුල අල්වාගෙණ පරයක්වල ගසා ඇට සුණුවිසුණුකොට නාගාසිටුවම්යි කීහ; ඒ වේලෙහි ස්වාමිදරුවානෝ වදුරන්සේක් මේ ආශනය තාගේ නියෝගයට දෙස් කියවාලිය හෙයිද්දැයි වදාළසේක; මාරයා කියන්නේ මේ ආසනය මාගේ නියෝගයට මාරසේනාව ලවා දෙස්කියවමියි මාරසේනාවට අත ඔසවා කියන්නේ ආශනය කාසන්තකද්දැයි ඇසීය. එවිට මාරසේනාවෝ මුළුල්ලම තමතමන් අත් ඔසවා කියන්නෝ තෙල ආසනය තොපගේ නියෝගයට අපිදෙස් දෙම්හයි කීහ; මරුලවා දෙස් කියවා ඉක්බිතිව කියන්නේ සිද්ධාර්ථකුමාරය මම මෙතෙක්දෙනා ලවා දෙස් කියවිමි තට දෙස්කී කවුරුද්දැයි කීහ; එකල ස්වාමිදරුවානෝ සිතනසේක් මට දෙන්හුනම්; පිටවහල්වූ ශ්‍රීමහාබෝධීන් විනා මෙතන කා අනින් දෙස් කියවම්ද? මා බුදුවන්ට විවරණ ලත්තැන් පටන් සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි ඉස් ඇස් මස් ලේ ආදීවූ නොයෙක් දන පරිත්‍යගයන් කරණකල මනුෂ්‍යයක් විසින් ඉතා නොකලහැකි දනයක මාදුන්නේ මෙතෙක් කල් කම් පාවූ මහිකාන්තාව අද කුමක් නිසා බැණ නොනැගේද එම්බල අද මට මෙතන දෙස්හුනම් මහිකාන්තායයි කීමට ශ්‍රීහස්තය පෙවූකල්හි බුදුමඟුලට නාගලොවින් නැගී නාග කන්‍යාවක්සේ මාරුක් මලින් යුත් පුන්කලසක් වමතින් අල්වාගත් බජ්‍රාශනයෙහි වැඩඋන් ස්වාමිදරුවන් ලඟ දකුණු දනමඩලට නුදුරු තැන ආශන කෙලවරින් පොලව පලාගන බැනනැගී දකුණත ඔසවා කියන්නේ එම්බල මාරය මේ ආසනය සිද්ධාර්ථකුමාරයන් සන්තකයයි මහිකාන්තාව තුන්විටක්ම දෙස් කීවාය; එකල ගිරිමේඛලා නම් ඇත්රජ ඡක්සරසිංහ රාජයෙකු දුටු ජරා කැනහිල් මහල්ලකුසේ බයින් තැතිගෙණ පිටහුන් මාරයා හෙලාපියා වැඳ ගියේය; මාරයා කිසි වක්කොට ගතනොහී සස්සෙන් සස්සට බැස කරබාගන පලාගොස්

තමාගේ විමානයයි යන්ධ ලජ්ජාවෙන් අප්‍රසිද්ධ වේශයකින් මාවත හිඳ ඉසකෙස්වනා සිද්ධාර්ථ කුමාරයෝ ඇතැදි දශ පාරමිතාවන් පුරා වෙනවෙනා ගොඩ කොට සිත ඇතනාසාදගත, මා පිරූ පාරමිතාවකුත් නැනැයි පාරමිතාව පැරදි බවටම ඉරිඅඳිමින් උන්නෝය; මාරයා සිතාන්නේ දසබිම්බරක් මාරයෝ බිඳි පැකිලගියාහ; පළමු පූජාවට ශක්‍රබ්‍රහ්ම නාග සුපර්ණ අසුරයන්හා සිද්ධවිද්‍යාධරාදී නොයෙක් දෙවියෝ අමුත් පූජාවට පටන්ගත්තාහ; ඉරු ගසානගනවිය; එවේලෙහි මහබෝසතාණෝ “අවිජ්ජාපච්චයා සංඛාරා සංඛාරා පච්චයා” යනාදීන් පටිච්චසමුත්පාදය උදන් බණ වදුරා පෙරයම දසපැය ඇතුළත පෙර විසූ කඳ පිළිවෙළ දත්තා නුවන ලැබගණ මධ්‍යම දසපැය ඇතුළත දිව්‍යැස්ලැබ තුන් යම් රාත්‍රියෙහි විදර්ශනාවඩා ධර්ම සම්පූර්ණකෙරෙමින් අළුයම දසපැය කෙලෙසුන් නසා ඉරු උද කරන්නාම ලොවුතුරාබුදුබව ලබාගත්සේක; මෙසේ ලොවුතුරා බුදුව වැඩහිඳ උදන් බනවදුරණසේක.—

“අනෙක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො. දුක්ඛාජාතිපුනප්පුනං
ගහකාරක දිට්ඨොසි, පුනගෙහංනකාහසි,
සබ්බා තෙඵාසුකා භග්ගා, ගහකූටං විසංඛිතං,
විසංඛාර ගතංචිත්තං, තණ්හානං ඛයමජ්ඣගා” ති.

උදන් බනවදුරා මේ විද්‍රරස්න නිසා මම සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි මාසේ වියයිය ඇතනාගට විනා වියයිනැතිවෙත්තු කරන් නාතබා සිතාන්වන් නොපිළිවන් දුස්කරක්‍රියා කෙළේ මේ ආශනය නිසාමය එබැවින් මේ ඇසිල්ලෙහි ඈර පියා නොයම් සිතා අතපය නොසොල්වා හුනස්නේම වැඩහිඳ විමුත්තිසැපයෙන් සතියක් දවස් යවූසේක දෙවන සතියෙහි අනිමිස ලෝචනයයි යන නෙත්‍රපූජාව කොට වැඩසිට තුන්වන සතියෙහි රුවන් සක්මනය සතරවන සතියෙහි රුවන් ආභරණයෙහිය, පස්වන සතියෙහි අජපාලනම් නුගවෘක්‍ෂ මූලයෙහිය; සවෙනි සතියෙහි මුචලින්ද නාදරණයෙහිය; සත්වෙනි සතියෙහි කිරිපළුරුක් මූලයහි මෙසේ සත්සති යවූසේක. මාරයා බිඳි පලාගොස් වියරුහුනු එකක්ගුමෙන් ඉසකෙස් වනා මාවතක හිඳ මෙසේ කිය කියා ඉරිඇඳ ලූහ; ගේ කෙසේද යත්? සිද්ධාර්ථකුමාරයා ඉස් ඉල්ලා ආ යාචකයන්ට එක්ලක්‍ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මහාමේරුපර්වතය පරයා ඉස් දන් දුන්නේය, මා දුන් එක ඉසකුත් නැත; දෙලක්‍ෂ සතලිස්දහසක් යොදුන්ඝනකඩ මහාබොල්පොළොව පරයා මස් දන්දුන්නේය මා දුන් මස්කැටියකුත් නැත පිනිබින්දුවක් සා ලේපොදකුත් නැත;

සිද්ධාර්ථකුමාරයා ඉල්වා ආ යාචකයන්ට තමාගේ අඹුදරුවන් දන්
දුන්නේය; මාදුන් කෙළිකොළුමාත්‍රාවකුත් නැතාහතවද සිද්ධාර්ථ
කුමාරයා ඉල්වා ආ යාචකයන්ට වස්ත්‍රාභරණ බත් වලන් පිටින් දන්
දින; දෑසි දස් ගවමහිසාදිවූ ඇත් අස් රථ සේසත් සත්රුවන් හා
නොයෙක් සැදි පලදනාවෙන් නිසි බිසෝවරුන් හා නොයෙක් ගම්
බිම් දන්දින, තමාදුන් මහුසුලයක්සා මිම්මකුත් නැත්තාහයි කියා ඉරි
ඇඳලූය—දානපාරමිතාවෙනුත් මම්ම පැරැද්දෙමි, සීලපාරමිතාවෙ
නුත් මම්ම පැරැද්දෙමි, ප්‍රඥාපාරමිතාවෙනුත් මම්ම පැරැද්දෙමි, වීර්‍ය්‍ය
පාරමිතාවෙනුත් මම්ම පැරැද්දෙමි, ක්ෂාන්තිපාරමිතාවෙනුත් මම්ම
පැරැද්දෙමි, සත්‍ය පාරමිතාවෙනුත් මම්ම පැරැද්දෙමි, අධිෂ්ඨානපාර
මිතාවෙනුත් මම්ම පැරැද්දෙමි, මෛත්‍රී පාරමිතාවෙනුත් මම්ම පැ
රැද්දෙමි, උපෙක්ෂා පාරමිතාවෙනුත් මම්ම පැරැද්දෙමි, නෛෂ්ක්‍රම්‍ය
පාරමිතාවෙනුත් මම්ම පැරැද්දෙමි, කියා ඉරිඇඳ නොයෙක් වලහම්
කියකියා සිද්ධාර්ථකුමාරයා මුහුනගෑ දැලි කවර දවසෙක පියා හරිම්
දෝහෝයි කියා තනිව ඉඳගන අනම්මනම් දෙඩ දොඩා උන්නාවූ
සවම්පයට ඔහුගේ තණ්හාය, රතිය, රගාය යන දූවරු තුන්දෙන
සිද්ධාර්ථකුමාරයා හා යුදයට ගිය දවස් බිම්බරක් පමණ මාරසේනාව
බිඳී නොආ කෙනෙක් නැත්තාහ; පියානන්ට කිමෙක්දෝහෝයි මහ
කුහුලින් ඇත් මැත් යන්නාහු දෙමන් සංඛ්‍යෙක ඉඳ ඉසවනාගෙණ
නොයෙක් වලහම් කියකියා කිසි අහරයක් නැතිව උන්නැනැත්තහු
දැක මෙසේ කියත්ලු; නුඹ මූනලා වසා සැකයක් නැතිව ඇය දල්වා
නොබලාව කිසි භයක් නැතුව අපහුණම පරදවා ජයයෙණ ලොවුතු
රා බුදුව මා මූන දැලිතෙමේ ගියේය; මම්ම පැරැද්දෙම් කීහ; ඒ අසා
තුන්දෙනම වෙන වෙනම වාසි කියන්නාහු අපතුන්දෙන පැලඳී
මල්දමින් ඔහු බැඳගන නොබෝ කාලයක්න් ගෙණවුත් පාවා දෙම්
හයි එවිට සිත්වූ පරිද්දෙන් කැමැත්තක් කළමැනවයි පියානන් අස්
වසා විමානයට ගමන් කරවා තුන්දෙනම නමකට සසියක් බැගින්
වෙස්මවාගෙණ; මෙලඳ ගොවා, විජ්ජා, මැන්ඩවාලා ආදිවූ නො
යෙක් දිව්‍යස්ත්‍රියන් හා එකදහස් අවසියයක් පිරිවර සමග තුන්දෙන
සියලු දිව්‍යාභරණයෙන් සැදිගොස් බුදුන් ඉදිරියේ සිට සාරා සම
ගින් නටනවා කියන මනා නෘත්‍යගීවාද්‍ය දූන සේවයමින් අලජ්ජින්
විනා ලැජ්ජා ඇතිය උන්නා ඇසුමනායෙක් අනම්මනම් දෙඩ දොඩා
වසන්නා වසන්නාවුන් බුදුන්ගේ ශ්‍රීමුඛයෙන් බසක් පමණ තබා
නුවන් කෙළවරින් බැල්මක් නොබලාම වැඩ උන්නාහ; ඔවුනො
වුන් අනේ නැගනියෙනි ගලකින් කළරුවක්මෙන් විනා පණ ඇති
පුෂියෙක් අපවැනි තුන්දෙනකු හා දිව්‍යස්ත්‍රී සමූහයක් හලා මෙසේ
නෑවෙද්ද මොහුඋපදිනද මහාබ්‍රහම තෙමේ ඉතා දූඩි ගලක් මොහුගේ

ලෙහිලා මැවීද ඉනුත් මෙසේම තදවෙද්ද මෙවැනි ගලකින් මැවූ රූවක්සේ ඉතා දැඩිවූ මහණ දුර්ජනයා ලඟසිටිනවාටත් මෙත නින් නැගිට යම්හයි කියා මුහුණ ගෑ දූලිගරින්ට ආ තුන්දෙන තුන් යම් රාත්‍රියෙහි වැස පෙර බාසක් පමණකුත් නොලදින් තමන් මුහුන දූලිගාගන යන්නාසේ ඉස අනතබාගෙණ ලැජ්ජාමෙන් පස්ස බල බලා ගියාහ; එදවස් මාරයා සහිත දසබිම්බරක් මරුවන් බිඳී පැරද පළමු රුස්වූ ශක්‍ර බ්‍රහ්ම නාග සුපණි සිඩවිද්‍යාධර ආදිවූ නොයෙක් දෙවියෝ අවුත් පූජාමට පටන්ගත් කල්හි මිහිකත නටන්ඩවන, බුදු රැස් සතරදිග විහිදෙන්නාහ; හැමගස් අග පටන් මුලදක්වා මලින් සැදුනාහ; නරකාදිවල ගිනි නිවිනා; අන්ධයෝ ඇස් ලද්දාහුය; ගො ළුවෝ ගී කියනි පිලුන් නටා ගමන්යෙති; තූර්‍යනාද තෙමේම නාද කෙලේය; තිරිසතුන්ආදි සියලු සත්වයෝ නටන්ඩ පටන්ගත්තාහ; නැගු ධජමෙන් දිවෙයි, සුවඳ සුණු වශ්‍රාවක් එකවිට පැහිරිනා; සහම් පති මහාබ්‍රහ්මයා සොළොස්ගව්වක් පමණ හෙළකුඩයක් සිරසට පූජා කෙලේය; යාමනම් දෙවියෝ දෙදෙනෙක් මැනික් තල්වැටගෙණ සලමින් පූජාකළාහ; රන් චාමර රිදී චාමර රන් තල්වැට රිදී තල් වැට ගෙණගොස් සුවහස් දෙවියෝ පූජාකළාහ; මහකෙළ නාගරාජ යා නවකෙළලක්‍ෂයක් නයින් පිරිවරාගණ නොයෙක් නොයෙක් වෙස් මවාගෙණ අවුත් පූජාකරන්නේය දසදහසක් සක්වළ ශක්‍රයෝ එකවිට පිඹිනල සාරමස් දෙපෝයක් ශබ්දය සිටිනා එක්සිය විසිරි යන් ජයතුරාසක පිඹිමින් පූජාකළාහ; මෙස් දසදහසක් සක්වල දෙවි බඹුන්හා සිඩවිද්‍යාධරයන් මේ එක මගුල්සක්වලට රුස්වූ පරිදි කෙසේදයත්? මස්සක් තැන අසූ අනූ බැගින් ඉසකෙස් රෝමයේ සූක්‍ෂම වෙස්මවාගෙණ නැගිසිට පූජාකරන්නාහ; මෙසේ සක්වළ පුරාන් පිටසක්වලපුරා දෙවි බඹුන් කරණපූජා ලැබ නොයෙක් ආශ්චර්‍ය පහලව සියලු සතුන් විසින් කාරණ සුගන්ධ නාද පූජා ලැබ එහි සත්දවසක් ඉක්මවා මුචලින්දනම් නාගරාජයාගේ විලට වැඩ නාගරාජයා බුදුන් කෙරෙහි ප්‍රසන්නවූ සිහින් සත්දවසක් මුළුල්ලෙහි ධාරානිපාතයෙන් වසිනා වැස්සෙහි මා වැනි ආනුභාව ඇති නාගරාජයකු බල බලා සිටීම සුදුසු නොවෙයි සිතා මානිකාය මයවූ දගැබක් වෙළන්නාසේ බුදුන් තමන්ගේ බෝගාවලියෙහි වැඩ හිඳුවා දහසක් පෙණ වසාගෙණ බුදුන්ගේ ශ්‍රීශරීරය පිනිබිඳුවක් පමණක් වැද්දනොදී වැසි නවතා සිටියේය; සත්දවසකින් වැසි පැවූකල රන්ගල් ගුහාවකින් නික්මුනු කේසර සිංහ රාජයෙකුසේ දිලිහි දිලිහී නාගරාජයා සරණ ශීලයෙහි පිහිටුවා පන්සිල්දී එතනින් නික්ම කිරිපළුනම් නුගරුකමුල විමුත්ති සැපයෙන් දවස් යවා වැඩඋන්සේක..... එසේම වැඩඋන් සත්දවසක් ඉකුත්වන් දවස

මහාවෙලඳ දෙබෑකෙනෙක් ගැල්පිරුණු බඩුගෙණ වෙළඳාමේ යන්
නාහු බුදුන් වැඩහුන්තැනට නුදුරු තැනක ලැගුන්ගෙණ පාන්වූ
දවසට යන්ඩයයි ගොන් යොදගන බැඳ කැව්පිඝන්දි ගොන් සෙල්
එය; ගොන් ගැල්සක් මුළුල්ලේම බිම එරවී ගියේය, එවේලෙහි බුදුන්
කෙරෙහි ප්‍රසන්නවූ දෙවියෙක් වෙලඳුන්ගෙන් එකෙකුට ආවේසව
කියන්නේ මාරපරාජයකොට ලොවුතුරා බුදුව අදට එකුන්පනස්
දවසක නිරාහාරව සත්සතිය ගෙවා අවුත් තෙලෙ "කිරිපළු රුක
මුල" වැඩඋන්සේක.... මහාගොස් උපස්ථානයක් කරවපුළුවන් ආහා
රයක් දුන්නේනම් ඒ අනුහසින් තොපිත් තොපගේ ගැළුන්. සුවයේ
යන්නේය; මහා ගොස් බුදුන් දකිවයි කීහ; එබස් අසා වෙළඳ ගොවී
යෝ බැය පිලඳ මීටක්ගෙණ ගොසින් බුදුන්ට පැවරූහ; එවේලෙහි
බුදුහු පෙර සර්වඥවරයෝ කෙසේ කුමකින් පිළිගත්සේක්දෝහෝයි
දිවැසින් බලා වදුරා පිළිගන්ට පාත්‍රා නැතිවන්නට කාරණා කිම්දැයි
මහණ දවස් ඝටිකාරනම් මහාබ්‍රහ්මයා දුන් පාත්‍රය සුජාතාව දුන්
කිරිපිඩු පිළිගත් දවස් අන්තර්ධානව ගියේය; කිරිපිඩු පිළිගත් රන්ත
ලිය නේරංජරානම් ගංතෙරදී වළඳා දියට පැලාවූහ; මහකෙළනම්
නාගරාජයාගේ නාලොවට ගියේය; එසේ හෙයින් පිළිගන්ට පාත්‍රය
නැතිව සිතා වැඩඋන් කල්හි සතරවරම් රජහු සතරදෙන ඉඳුනිල
මයවූ පාත්‍ර සතරක් ගෙණාහ; බුදුහු සිතා වදුරණසේක් මේ පාත්‍ර
සතර පිළගත්තෙම්නම් මතු සඞ්ඝයා බුදුඋනතැනම තමන්වහන්සේ
පාත්‍ර සතරක් පිලිගතැයි කියා වඤ්ඤුවෙති ලෝභව මතු අනාදරයයි
නොපිළිගෙණ වැඩඋන්කල්හි, එවිට සතරවරම් රජහු සතරදෙන
මත් පාත්‍ර සතරක් ගෙණාහ; බුදුහු පාත්‍ර සතර පිළිගත්සේක්වයි
ඝහු අපකෙරෙ දොම්නස්වන්නාහ; එබැවින් මට උවමනා එක පාත්‍ර
යක් ගනිම්නම් අනිකුත් දෙනා බලා පිළිගත්සේකැයි මාකෙරෙහි
දොම්නස් වන්නාහ; එබැවින් උත්සතුටුකරවම්යි සිතා තොප තොප
ගෙණා පාත්‍රසතර එක පාත්‍රයක්සේ ඊ ඊපිට තබවයි වදාළ සේක....
නැවත මේ පාත්‍ර සතර එක පාත්‍රයක්වේවයි අධිෂ්ඨානකළසේක; පාත්‍ර
සතර එකක්ව ගියේය; එනම් කුමණ බඝක්දැයි අදහා සිටියාහ; පාත්‍ර
ධාතුන්වහන්සේගේ මෝවිට සතරක් තුනත් තබාසැකගැර ගතුයි ඒ
වේලෙහි පාත්‍රයෙහිලා විලඳ මිටක් පිළිගැන්වූහ: ඔහු පූජා කරණ
පරිද්දෙන් කේසධාතු දී වදාළසේක—ඔහු සතුටින් පිනාගොස් පින්
කරමින් දෙවුලොව උපන්නාහුය, ඉන්පසු ශාක්‍යකුලතිලකායමානවූ
අප බුදුරජානන්වහන්සේ කිඹුල්වත් පුරයට වැඩියගමණෙහි තමන්
වහන්සේට වඳින්ට මැලිවූ ඥාතිගණයා මධ්‍යයෙහි වැඩහුන් බුඩාශ
නයෙන් ආකාශයට පැනනැගී අචින්තවූ අශද්‍රශවූ යමකප්‍රාතිහාර්‍ය්‍ය
දක්වා වදුරා කෙළවර සැරියුත්සාමීන් වහන්සේගේ ආරාධනාවෙන්

බුද්ධවංශදේශනාවට පටන්ගෙණ වදාළපරිදි සංක්‍ෂෙපයෙන් මෙසේ දතයුතු. කෙසේදයත්? අසව ශාරිපුත්‍රස්ථවිරය යටගිය දවස සාරාසංඛ්‍යකල්පලක්‍ෂයකින් යට එක්කල්පයක තණ්හංකරය මෙධංකරය සරණංකරය දීපඞ්කරයයි යන බුද්ධදිවාකරයෝ සතරදෙනෙක් ලොව පහළවූහ; එයින් බුද්ධශූන්‍යව කප් අසංඛ්‍යයක් ගියකල කොණ්ඩඤ්ඤ නම් බුදුකෙනෙක් ලොවපහළවූහ; එයින් අසංඛ්‍යයක් කප් බුද්ධශූන්‍යව ගියකල මංගලය, සුමනය, රෙවතය, සෝභිතයයි යන බුද්ධදිවාකරයෝ සතරදෙනෙක් ලොවපහළවූහ; එයින් අසංඛ්‍යයක් කප් ගියකල මේ භද්‍රකල්පයට ලක්‍ෂයක්වන කප පියුමතුරානම් බුදුකෙනෙක් ලොව පහළවූහ; එයින් ලක්‍ෂයක්වන පනස්සද්දහසක් කප් බුද්ධශූන්‍යව ගියකල මේ භද්‍රකල්පයට දහසක්වන කප සුමෙධය, සුජාතයයි යන සර්වඥවරයෝ දෙදෙනෙක් ලොව පහළවූහ, එයින් විසිනවදහස් අවසියදෙයානු කපක් ගියකල මිට එක්සිය අටලොස් වන කප පියදස්සිය, අත්තදස්සිය, ධම්මදස්සියයි, බුද්ධදිවාකරයෝ තුන්නමක් ලොව පහළවූහ; එයින් බුද්ධශූන්‍යවූ කප් සූවිස්සක් ගියකලටම එකානුකප සිද්ධාර්ථනම් බුදුකෙනෙක් ලොව උපන්නාහුය; එයින් බුද්ධශූන්‍යවූ පස්විසි කපක් ගියකල; තිස්සය, ඵුස්සයයි යන බුද්ධදිවාකරයෝ දෙදෙනෙක් ලොව උපන්නාහුය; මිට ඒකානු වන කප විපස්සිනම් බුදුකෙනෙක් උපන්නාහුය; එයින් බුද්ධශූන්‍යවූ කප් පනස් නවයක්ගිය කල්හි මිට එක්තිස්වන කප සිඛිය වෙස්සභූයයි යන සර්වඥවරයෝ දෙදෙනෙක් උපන්නාහුය; මේ මහා භද්‍රකල්පයෙහි; කකුසඳ, කෝනාගම, කාශ්‍යපයයි, යන සර්වඥවරයෝ තුන්දෙනෙක් ලොව උපන්නාහුය; දැන් මම සතරවෙනි ගෞතම නම් බුදුවීම්; මෙම කප තව මතු මෛත්‍රිනම් බුදුකෙනෙක් උපදින්නාහුය; එසේහෙයින් මේ කල්පය බුදුන් පස්දෙනෙකුගෙන් උතුන්වන හෙයින් “ මහාභද්‍රකල්පය ” නම් විය.

ශාරිපුත්‍රස්ථවිරය දීපඞ්කරාදීවූ සියලු සර්වඥවරයෝ සොළසාසංඛ්‍ය කල්පලක්‍ෂයක් හෝ අටාසංඛෙය්‍ය කල්පලක්‍ෂයක් හෝ සාරාසංඛෙය්‍ය කල්පලක්‍ෂයක්හෝ පාරමිතා පූර්ණයකළාවූමයයි යනාදීන් සියලු සර්වඥවරයෝ තුසිතපුරයෙන් සැව අවුත් වෙස්සන්තරාත්මභාවයෙහි ඉපිද මහපොළව ගුගුරවා පුත්‍රදාරාදී පරිත්‍යාගයෙන් මුළුලොව විස්මපත් කළාහුමයයි; ඒ සියලු සර්වඥවරයෝ තුසිතපුරයෙන් සැව අවුත් මව් කුස පිළිසිඳ මාසේම ලෝවැඩකළාහුමයයි යනාදීන් මෙසේ බුද්ධවංශ දෙශනාව විශෙෂයෙන් වදාරා තමන්වහන්සේ බුදුන් නොවරදවා දක කළාවූ කුසල්සම්භාරයන් වදාරණසේක්; තවද ශාරිපුත්‍රස්ථවිරය මම ඒ සර්වඥවරයන් වහන්සේ නොවරද රම්මවතීනම් නුවර උපන් අවුරුදු ලක්‍ෂයක් ආයුඇති අසූරියන් උසඇයි දීපඞ්කරනම් බුදුන්

සමයෙහි සුමේධනම් තාපසව අෂ්ටාංගධර්මයෙන් යෙදී ජීවිතයෙන් පූජාකොට එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි, රම්මවතීනම් නුවර උපන් අවුරුදු ලක්‍ෂයකට ආයුඇති අටඅසූරියන් උසඇති කොණ්ඩඤ්ඤනම් බුදුන් සමයෙහි විජිතාවීනම් චක්‍රවර්තිරජව ඉපිද බුදුන්ට මසක් අශදෘශ මහදන්දී සියලු චක්‍රවර්තිරාජ්‍යය බුදුන්ට පුද එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙමි; උත්තරනම් නුවර උපන් අනූදහසක් අවුරුද්දට ආයුඇති අසූඅටරියන් උසඇති මඞ්ගලනම් බුදුන් සමයෙහි සුරුචීනම් මානවකව ඉපිද දෙලොස්යොදුන් සත්රුවන් මඩුවකදී කෙළලක්‍ෂයක් රහතුන්හා සමග බුදුන්වඩාහිඳුවා චතුර්මධුර කිරිපිඩු සත්දවසක් වලඳවා කෙළලක්‍ෂයක් සිවුරුපිරිකරදී එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙමි, මේඛලානම් නුවර උපන් අනූදහසක් අවුරුද්දට ආයුඇති අනූරියන් උසඇති සුමන නම් බුදුන් සමයෙහි අතුලනම් දිව්‍ය නාගරාජව ඉපිද කෙළලක්‍ෂයක් බුදුපාමොක් මහසඟ පිරිසට මහා දිව්‍යභෝජන ගෙණවුත් වලඳවා කෙළලක්‍ෂයක් දිවසළු පුද එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙමි; සුධඤ්ඤවතීනම් නුවර උපන් සැටදහසක් අවුරුද්දට ආයුඇති අසූරියන් උසඇති රේවත නම් බුදුන් සමයෙහි අතිදේවනම් බ්‍රාහ්මණව ඉපිද බුදුන් දෙස බල බලා සිට විසිතුරුගී දහසක්බැඳ ස්තුතිකොට දහසක් වටිනා උතුරුසළුවක් පුද එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි, සුධර්මනම් නුවර උපන් අනූදහසක් අවුරුද්දට ආයුඇති අටපනස් රියන් උසඇති සෝභිතනම් බුදුන් සමයෙහි සුජාතනම් බ්‍රාහ්මණව බුදුන්ට තුන්මසක් අසදෘශ මහාදන්දී එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි; චන්‍ද්‍රවනම් නුවර උපන් අවුරුදු ලක්‍ෂයකට ආයුඇති අටපනස්රියන් උසඇති අනෝමදස්සී නම් බුදුන් සමයෙහි මහෙශාක්‍ය නම්වූ යක්‍ෂරාජන්ව ඉපිද සත්දවසක් මහසඟපිරිසට දිව්‍යභෝජනාදි කෙළලක්‍ෂයක් වටනා පනස්රියන් දිවසළුපුද එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙමි; චම්පකනම් නුවර උපන් අවුරුදු ලක්‍ෂයක් ආයුඇති පනස් අටරියන් උසඇති පදුමනම් බුදුන් සමයෙහි සිංහරාජන්ව ඉපිද හිමාලයෙහි ධ්‍යාන සුවයෙන් වැඩහුන් බුදුන් දැක ප්‍රීතීන් පිනා තුන්යලක් පැදකුණුකොට තුන්යලක් සිංහනාදකොට සත්දවසක් ඇසිපියනොහෙලා බුදුන්දෙස බලබලා සිට ඇස්දෙකින් පූජාකොට එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙමි, ධඤ්ඤවතීනම් නුවර උපන් අනූදහසක් අවුරුද්දට ආයුඇති අසූඅටරියන් උසඇති නාරදනම් බුදුන් සමයෙහි ජටිලනම් තාපසව අසූකෙළක් රහතුන් සමග තමා කරා වැඩි බුදුන්දැක සත්දවසක් උතුරුකුරුදිවයිනින් දිව්‍යආහාර ගෙනැත් වලඳවා අනඝිවූ රත්සඳුන් හරයක් පුද එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙමි, හංසවතීනම් නුවර උපන් අවුරුදු ලක්‍ෂයකට

ආයුඇති පනස්අටරියන් උසඇති පියුමතුරානම් බුදුන්සමයෙහි ජටිලනම් මහාසාමිව ඉපිද බුදුපාමොක් මහසඟපිරිසට මහදන්හා සිවුරු පිරිකරදී එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි, සුදස්සනම් නුවර උපන් අනූදහසක් අවුරුද්දට ආයුඇති අසූඅටරියන් උසඇති සුමේධනම් බුදුන් සමයෙහි උත්තරනම් මානවකව අසූකෙළක් ධන වියදම්කොට දන්දී බුදුසසුන් වැද මහණව එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි, සුමගලනම් නුවර උපන් අනූදහසක් අවුරුද්දට ආයුඇති පනස්රියන් උසඇති සුජාතනම් බුදුන්සමයෙහි උත්තරනම් මානවකව සියලු අභිවෘද්ධියෙන් සම්පූර්ණවූ රජව ඉපිද ඒ යසඉසුරු හා සමග රාජ්‍යයපුද මහණව එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි; සුධඤ්ඤවතීනම් නුවර උපන් අනූදහසක් අවුරුද්දට ආයුඇති අසූ රියන් උසඇති පියදස්සීනම් බුදුන්සමයෙහි කාශ්‍යපනම් මානවකව ඉපිද කෙළලක්ෂයක් ධනවියදම්කොට සංඝාරාමයක් කරවා බුදුන්ට පිළිගන්වා එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙමි; සෝභිතනම් නුවර උපන් අව්රුදු ලක්ෂයකට ආයුඇති අසූරියන් උසඇති අත්ථ දස්සීනම් බුදුන් සමයෙහි සුසීමනම් තාපසව බුදුන් අයාසිට එක ණෙහි ආකාශයට පැනනැග දිවගෙණගොස් ශක්‍රයාගේ පරසතු රුක සලා මල්වෂ්ඨාවක් වස්වවා පරසතුමලින් බුදුන්සිරසට මල්කුඩයක් පුද එදද .මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි, සරණ නම් නුවර උපන් අවුරුදු ලක්ෂයට ආයුඇති ධම්මදස්සීනම් බුදුන්සමයෙහි ශක්‍රව ඉපිද දඹදිවට අසල නුවූ සියක් යොදුන් උසඇති මහ දඹගසින් දඹගෙණ වුත් නවකෙළලක්ෂයක් රහතුන් හා සමග බුදුන්ට දඹ වළඳවා එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි, වේභාරනම් නුවර උපන් අවුරුදු ලක්ෂයකට ආයුඇති සැටරියන් උසඇති සිද්ධාර්ථනම් බුදුන් සමයෙහි මඞ්ගලනම් තාපසව ඉපිද යොදුනක්සා කරඬුවකින් දිවමල් ගෙණ දිවසුවඳින් බුදුන් සිරසට පුද එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි, ඛෙමනම් නුවර උපන් අවුරුදු ලක්ෂයකට ආයුඇති සැටරියන් උස ඇති තිස්සනම් බුදුන් සමයෙහි සුජාතානම් ජරව ඉපිද යොදුනක් සා කරඬුවකින් දිවමල්ගෙණ දිවසුවඳින් බුදුන් සිරසට පුද එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි; කසීනුවර උපන් අනූදහසක් අවු රුද්දට ආයුඇති අටපනස්රියන් උසඇති ඵුස්සනම් බුදුන් සමයෙහි විජිතනම් චක්‍රවර්තීරජව ඉපිද රාජ්‍යයහැර බුදුසස්නෙහි මහණව පිටකත්‍රගෙවාදැන ධර්මකතිකයන් කෙරෙහි අග්‍රවූ ප්‍රතිපත්ති පූජාකොට එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙමි, බන්ධුමතීනම් නුවර උපන් දහසක් අවුරුද්දට ආයුඇති අටපනස්රියන් උසඇති විපස්සීනම් බුදුන් සමයෙහි අතුලනම් දිව්‍යනාගරාජන්ව ඉපිද සඳමඩලක්වැනි මඩුවකදී බුදුපාමොක් මහසඟපිරිස් වළඳවා අනගිවූ මිණිපළගයක්

පුද එදද මම් බුදුබවට ප්‍රාර්ථනාකෙළෙම්, අරුනවතීනම් නුවර උපන් තිස්හත්දහසක් අවුරුද්දට ආයුඇති තිස්හත්රියන් උසඇති සිඛිනම් බුදුන් සමයෙහි අරින්දමනම් රජව ඉපිද සත්දවසක් මහ දන්දී මගුලැතු සරහා ඇතුළුසට කප්පියභාන්ඩ පුද එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙම්: අනුපනම් නුවර උපන් සැටදහසක් අවුරුද්දට ආයුඇති වෙස්සභූනම බුදුන් සමයෙහි උත්තරනම් රජව ඉපිද අසූකෙළක් ධන වියදම්කොට මහදන්දී එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙම්, ඛෙමවතිනම් නුවර උපන් සතලිස්දහසක් අවුරුදුදට ආයුඇති සතලිස් රියක් උසඇති කකුසඳනම් බුදුන් සමයෙහි ඛෙමනම් රජව ඉපිද සතලිස්දහසක් රහතුන් හා සමග බුදුන් පවරා මහදන්දී සතලිස්දහසක් පාත්‍රා සිවුරුහා හඳුන් ආදිවූ නොයෙක් බෙහෙත්බඩු දන්දී එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙම්; සෝභවතිනම් නුවර උපන් තිස්දහසක් අවුරුද්දට ආයුඇති තිස්රියන් උසඇති කෝනාගමනම් බුදුන් සමයෙහි පබ්බතනම් රජව ඉපිද වස් තුන්මසක් මහ දන්දී බුදුපාමොක් මහසඟපිරිසට සළුපිළි කරදී අනගිවූ රුවන් මිරිවැඩිසඟලක් බුදුන්ට පුද එදද මේ බුදුබවට ප්‍රාර්ථනා කෙළෙම්; බරණනම් නුවර උපන් විසිදහසක් අවුරුද්දට ආයුඇති වඩුරියනින් විසිරියන් උසඇති කාශ්‍යපනම් බුදුන් සමයෙහි ජෝතිපාලනම් මානවකව ඉපිද ඝටිකාරනම් කුම්භකාරයාගේ මිත්‍ර බලයෙන් බුදුසසුන්වැද මහණව පිටකත්‍රය ගෙවාදන ප්‍රතිපත්ති පූජාකොට එදද මේ බුදුබවට ප්‍රාර්ථනාකෙළෙම්; කිඹුල්වත්නම් නුවර උපන් එක්සියවිස්සට ආයුඇති දෙලොස්රියන් උසඇති සතරවැනිව ගෞතමනම් බුදුවිමි; මෙම කප පස්වැනිව අනාගතයෙහි කෙතුමතීනම් නුවර උපදනා අසූදහසක් අවුරුද්දට ආයුඇති අසූඅටරියන් උසඇති මෛත්‍රිනම් බුදුවෙති වදාරණලදී; ශාරිපුත්‍රස්ථවිරය ලොවුතුරා බුදුබවනම් එසේ මෙසේ සාදගතහැකි සම්පත්තියක් නොවෙයි; යම්සේ ලක්ෂගණන් ගඟාවේ ජලය අනවකාශයෙන් මහමුහුදට වැද පුරාඋතුරුවා ලියනොහැක්කේය; තවද කප්ලක්ෂයක් මුළුල්ලෙහි වස්නා වර්ෂාවේ ජලයෙන් මුහුද පුරවා ලියනොහැක්කේ ලොවුතුරා බුදුබව කෙණෙක් කුශල සම්භාරය රැස්කොටත් පුරා උතුරුවා ලියනොහැක්කේය—පාරමිතාවන් වැඩුවැඩුසේ බුඩශ්‍රී වැඩෙන්නේමය; එහිවිභාග මඟලනම් බුදුන්ගෙන් දතයුතු—මෙසේ දීපඞ්කරාදි හැම බුදුන් නොවරදවා දැක මෙසේ මාගේ දනපමණින් කරණ කුසල් නැමති නැව පාරමිතා නැමති මහමුහුදට සාරාසංඛ්‍ය කප්ලක්ෂයකින් මුහුද උතුරුවා දම්සිල්නැමති නැවෙහි හිඳ සිත්සේ දැන සුවයෙන් නිවන්කෙළියට පටන්ගතිමි; මෙසේ මාගේ ස්වාමිදරුවෝ විසිතුරුවූ ගාථා දහසකින් ප්‍රතිමණ්ඩිතවූ මේ බුඩවංශදෙශනාව වදාරණලදි.

නමො දිස්වා උභොපුත්තා මද්දිදෙවී තදිස්සියා
සබ්බඤ්ඤුතා පියංමය්හං තස්මාපියෙ අදාසහං.

යනාදී වශයෙන් චරියාපිටකයෙන් මේ බුඩවංශ දේශනාව නිමවා වදාළසේක. මේ දෙශනාවගේ කෙළවර අසංඛ්‍යයක් දෙවියෝ සෝවාන් ඵලයෙහි පිහිටියාහ, අසංඛ්‍යයක් දෙවියෝ සේදගාමි ඵලයෙහි පිහිටියාහ.

බුඩවංශදෙශනාව නිමි.

# නිර්වාණපුර වර්ණනාව.

නමෝ තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

දෙවපුත්තා දයො මාරා රයො යොජෙය්‍ය එකකො
බුජ්ඣාසි බොධි මූලස්මිං තං නාමෙ සිරසාදරා.
තමුත්තමං පණාමෙත්වා සුතනයාගං මුදුවහං
කරිස්සාම් සමාසෙන නිබ්බාණපුර වණ්ණනන්ති.

මෙසේ දේවපුත්‍රාදි පස්මරුන් තනිව ජයගෙණ යම් මහෝත්තමෙ
යෙක් තෙමේ ලොව්තුරාබුදුවූ සේක්ද, ඒ උත්තමයානන්වහන්සේට
හිස කරණකොටගෙණ ආදර ඇතිව නමස්කාරකොට ඇසුඇසූවන්
ගේ සිත්පහදවන්නාවූ "නිර්වානපුරවර්ණනා" නම් ප්‍රකරණයක් ලක්
දිව් වාසී සියල්ලන්ටම සුවසේ තේරුම්යන පරිද්දෙන් පාලිභාෂා
වෙන් සිංහලට නගා සංක්‍ෂෙපවශයෙන් කරන්නෙමි. පින්වත්
ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයෙනි මාවිසින් කරණලද මේ ප්‍රකරණය ආද
රයෙන් රැගෙණ භාවිතාකිරීමෙන් නිර්වාණපුරයෙහි විසිතුරු අල
ඞ්කාර වර්ණනාව දුනඇඳින "පරංජසදිපනියෙනි" ප්‍රකාශකරණලද
ධූතාඞ්ග ප්‍රතිපත්තියෙහි හා පිළිකුල්භාවනාවෙහිද යෙදී, මෙතෙකැයි
පමණනැති දුක් ගෙනහැරදෙන සංසාරයෙන් මිදී ඒකාන්ත සානන්ත
ප්‍රීතික උතුම් සැප ඇති නිර්වාණපුර ප්‍රවේශවව මොක්සිරි සුවවිඳින්ට
උත්සාහකරව්යයි පූර්වාරම්භ ගාථාදෙකින් මේ අදහස දක්වූයේය–
මේ මහාභද්‍රකල්පයට සාරාසංඛ්‍ය කල්පලක්‍ෂයකින් මත්තෙහි බුදුවූ
දීපංකරනම් බුදුරජානන්වහන්සේ හමුයෙහිදී අතට පත් නිවන්
හැර යම් වීරපුරුෂකෙනෙක් සංසාරදුකින් පීඩිත සත්වයන් සසර
දුකින් මුදවන මහාකරුණා සිතින් සසර දුක් විඳිමට ප්‍රවිෂ්ටව සාරා
සංඛ්‍ය කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි මහත් දුක් විඳීමෙන් පඤ්චමහා
පරිත්‍යාගාදී දුස්කරයන් කෙරෙමින් සමත්‍රිංසත් පාරමිධර්මයන් පූර
ණය කොට ඇසටු බෝරුකමුල පැනනැගී ජයවීර පර්‍යඞ්කාරූඪව
වැඩහිඳ නොයෙක් භයානක වෙස්ගෙන, ඛඩ්ග තුංග තෝමරාදී
නොයෙක් ආයුධ ගත් අත්ඇතිව දසබිම්බර මාරසෙනග සහිත
යෙලසියයක් යොදුන් උසඇති ගිරිමෙඛලානම් ඇත්රජපිටට පැන
නැගී බුදුවන්ට නොදෙම්මැයි යුදයට තමන්වහන්සේ වෙතට පැමිණි
මාරදිව්‍යපුත්‍රයා ආදී පස්මරුන් ප්‍රඥානැමති කඩුවෙන් සුනුවිසුනු

කෙරෙමින් පාරමිතා නැමති මහායෝධයන් මෙහෙයා ජයගෙණ දින්නලද සංග්‍රාම මණ්ඩලය ඇතිව මුළුලෝ බබුලුවමින් පෘථිවිකම්පනාදී නොයෙක් ආශ්චර්‍ය අත්භූත ධර්මයන් පහළකරමින් සිටියදී දසදහස් සක්වළ දෙව්බඹුන් ආදීන් විසින් කරණලද අපමණ පූජාසත්කාර ලබමින් මහාකරුණා නැමති ජලාභිසේකයෙන් අෂ්ටවිද්‍යා සධර්මනැමැති ඔටුනුපැලඳ සියලු බුද්ධ ගුණනැමති රාජාභරණයෙන් සැරසී අභිධවල පරම රමණියවූ විමුක්ති සේසත නගා සියලු ලෝකයාහට රාජාධි රාජරාජන්වූ ලොවුතුරා බුද්ධරාජ්‍යයට පැමිණ සකල නගරාභශ්‍රීයෙන් සම්පූර්ණවූ ජරාමරණ සෝක පරිදෙවදුක් දෙම්නස්ආදී කිසිත් උපද්‍රවයක් නැති සියලු භය විරහිත උතුම්වූ නිවන්පුර නුවරක් මවා වදාළසේක....

එහි විස්තර කෙසේදයත්?

අප ලොවුතුරා බුදුරජානන්වහන්සේ විසින් මවනලද ඒ නිර්වාණපුරයෙහි කෙලෙස් සතුරන්ට වැද්දනොදෙන පිණිස ඉතාඋස්ව බඳනාලද සීලමය ප්‍රාකාරයෙක් ඇත්තේය; ඒ ප්‍රාකාරය වට පිහිටාසිටි ලජ්ජාමය මඩඅගලක් ඇත්තේය; වීර්‍යමය අටළු ඇත්තේය; සමාධිමය දොර ඇත්තේය; එහි ගැඹුරුකොට සිටුවනලද ඥානමය ඉන්ද්‍රඛීලනම් මහත් කණුවක් ඇත්තේය; ඉන්ද්‍රියයන්ගේ සංවරයයි කියනලද දොරටු පාලයෙක් ඇත්තේය; සද්ධර්මමය මහත් රාජභවනයක් ඇත්තේය; එහි යහපත්කොට සරහනලද සූත්‍රපිටකමය රාජසිංහාසනයෙක් ඇත්තේය; ඒ සිංහාසනය මතුයෙහි නගනලද අභිධවලවූ විමුක්ති සේවතච්ඡත්‍රයෙක් ඇත්තේය; අභිධර්මපිටකමය සතරමංසන්ධි ඇත්තේය, විනයපිටකමය විනිශ්චයශාලාවල් ඇත්තේය, නවාංගබුද්ධවචනමය ධර්මශාලාවක් ඇත්තේය; තවද ඒ නිර්වාණනුවරෙහි වාසයකරන්නාවූ බුදුරජානන් වහන්සේහැර සියලු ලෝකවාසීන්ට වැඩිප්‍රඥාවක් ඇතිහෙයින් මේ ශාසනයෙහි ඥානවන්තයන්ගෙන් අගතැන්පත්වූ බුදුරජානන්වහන්සේට අනුව ධර්මචක්‍රයපවත්වන්නාවූ ශරිපුත් මහාස්ථවිරයන්වහන්සේ අප බුදුරජානන්වහන්සේගේ සේනාව පාලනයකරණ සේනානායකවූ සෙනෙවිරත් මහඅමාත්‍යයානම් වන්නේය, සෘද්ධිවන්තයන්ගෙන් අගතැන්පත්වූ මුගලන් මහා ස්ථවිරයන්වහන්සේ අපබුදුරජානන් වහන්සේගේ පුරෝහිත මහාමාත්‍යයානම් වන්නේය, සියලු ධූතාංගධරයන්ගෙන් අගතැන්පත්වූ මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ අපබුදුරජානන් වහන්සේගේ සියලු ධර්මාධිකරණ විනිශ්චය අමාත්‍යයන්ගෙන් ප්‍රධානවූ අක්ෂදර්ශී මහාමාත්‍යයානම් වන්නේය; සියලු විනයපිටකයෙහි පරතෙරට පැමිණි සියලු විනයධරයන් කෙරෙන් අගතැන්පැමිණි උපාලිස්ථවිරයන් වහන්සේ අපබුදුරජානන්වහන්සේගේ විනය විනිශ්චය අධි

කරණ ප්‍රධාන අමාත්‍යයානම් වන්නේය; ධර්ම භාණ්ඩාගාරිකවූ ආනන්ද ස්ථවිරයන්වහන්සේ අපලොව්තුරා බුදුරජානන්වහන්සේගේ නිර්වාන නුවරයෙහි සද්ධර්මරාජ භාණ්ඩාගාරය රක්නා භාණ්ඩාගාරික මහාමාත්‍යයානම්වන්නේය; තෙසජ්ජික ධුතාංගය රක්මින් නිදි දුරු කොට වාසයකරණ භික්ෂූන්වහන්සේලා අපබුදුරජානන්වහන්සේගේ නිර්වාන නුවර රක්නා නගරගෝපක අමාත්‍යයෝනම් වන්නේය දිව්‍යඥනය ඇතියන්ගෙන් අගතැන්පත්වූ අනුරුද්ධස්ථවිරයන්වහන්සේ ආදී දිව්‍යඥනලාභී භික්ෂූන්වහන්සේලා අපබුදුරජානන් වහන්සේගේ මේ නිර්වාන නුවර බබුළුවන අමාත්‍යයෝනම් වන්නේය, සර්ධාධනය, සීලධනය, ලජ්ජාධනය, පාපයට භයවන ඔතප්ධනය, පිට කාන්‍රය ඇසූපිරූතැන්ඇති ශ්‍රැතධනය, ත්‍යාගධනය, ප්‍රඥධනය යන මේ සප්තආර්යධනයෙන් යුක්තවූ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ අපභාග්‍යවතුන්වහන්සේගේ නිර්වාණ නුවර වාසයකරණ සිටුවරයෝනම් වන්නාහුය. තවද අපලොව්තුරා බුදුරජානන්වහන්සේගේ නිර්වානපුරවරෙහි මෙබඳු ජනයෝ වාසයකරන්නාහුය; කෙබඳු ජනයෝදයත්? සූත්‍රය ගෙණහැරදක්වන්නාවූ සූත්‍රාන්තිකයෝය, විනය ගෙණහැර දක්වන්නාවූ වෛනයිකයෝය, අභිධර්මධරයෝය, ධර්මකථිකයෝය, දික්සඟිධරයෝය, සංයුත්සඟිධරයෝය, මැදුම්සඟිධරයෝය, පසළොස් ප්‍රකරණයෙන් යුත් ඛුද්‍රගොත්සඟිධරයෝය, සීලයෙන් යුක්තයෝය, සමාධියෙන් යුක්තයෝය; බෝධ්‍යාඞ්ග භාවනාවෙන් යුක්තයෝය, විදර්ශනාවඩන්නෝය, ධුතාංගධරයෝය, සෝවාංඵලයටපැමිණියෝය, සකෘදගාමිඵලයට පැමිණියෝය, අනාගාමි ඵලයට පැමිණියෝය, පෙරවිසූ කඳපිළිවෙළ සිහිකරණ ඥණය, පරසිත්දන්නා ඥණය, සියලු කෙලෙස් නසන ඥනය යන මේ ත්‍රිවිද්‍යාවෙන් යුක්තවූවෝය, දිවැස්ඇත්තෝය, දිවකන් ඇත්තෝය, නොයෙක්ලෙස ඍද්ධිකරන්ට සමර්ථයෝය, සියලු සමාපත්තියෙහි දක්ෂවූවෝය යනමේ සත්වසමූහයෝද, ඒ නිර්වානනුවරෙහි වාසයකරන්නාහුය; මේ ශාසනයෙහි ධර්ම ප්‍රතිවාක්‍ය පැවැත්වීම් ඇතිව ධර්මකාමීව සූත්‍රාභි ධර්මවිනයයි කියන ලද ත්‍රිපිටක ධර්මයෙහි මහත් ප්‍රීතිඇතිව රුක්මුල්, ශූන්‍යාගාර, වනාන්ත්‍ර යන මේ තැන්වලට ගියේනමුදු කයින් වචසින් මනසින් ධර්මරස පානය කෙරෙමින් ධර්මය සෙවිමෙහි ලොල්ව යම් යම් තැනකට ගියේනම් ඒ ඒ තැන්හි සීලකථාය, සමාධිකථාය, ප්‍රඥකථාය විමුක්තිකථාය, සන්තුෂ්ටකථාය, පවිවෙකකථාය, අසංසර්ගකථාය, වීර්‍යාරම්භකථාය, යන මේ දසකථාවන්ගෙන් යුක්තව ඒ ඒ කථා රසය පානය කෙරෙමින් වාසයකරන්නාවූ භික්ෂූන්වහන්සේලා අප බුදුරජානන්වහන්සේගේ නිර්වාණ නුවරෙහි සුරාසොඬ ජනයෝනම් වන්නාහුය; අපගේ ස්වාමිදරුවූ ලොව්තුරා බුදුරජානන්

වහන්සේගේ නිර්වානනුවර මෙකී සමූහයාගෙන් පිරී අලංකාරව බබ
ලන්නේය; තවද අපලොවුතුරා බුදුරජානන්වහන්සේගේ නිර්වාන
නුවරෙහි සතරදිසාවෙහි පිහිටාසිටි සතරසතිපට්ඨානමය මහාවීථි සත
රෙක් ඇත්තාහුය; ඒසතරසතිපට්ඨාන මහවීථියෙහි පුෂ්පාපනය,
සුගන්ධාපනය, ඵලාපනය, අගදපනය, ඖෂධාපනය, අමෘතාපනය,
රත්නා රත්නාපනය, සර්වාපනයයි කියා සල්පිල් හෙවත් විකි
නියයුතු බඩු දමාතිබෙන කඩ අටෙක් ඇත්තාහුය, එහි පුෂ්පා
පනයයි කියනලද මල්කඩයනම් කවරහයත්? බුද්ධරාජ්‍යයට පැමිණි
අප බුදුරජානන්වහන්සේ විසින් වදාරණ ලද්දවූ පඤ්චස්කන්ධය
අනිත්‍යවශයෙන් සැලකීමයයි කියනලද අනිත්‍ය සඤ්ඥා භාවනාවය,
ඇස් කන් නාසාදී කොටස් අනාත්ම වශයෙන් සැලකීමයයි කියන
ලද අනාත්ම සඤ්ඥා භාවනාවය, මේ ශරීරය, කෙස් ලොම් ආදී
දෙතිස් කුණු කොටසින් ආකූලවූයේයයි අසුභාකාරයෙන් සැලකීමය
කියනලද අසුභ සඤ්ඥා භාවනාවය, මාගේ මේ ශරීරයට අටඅනූවක්
රෝග, නවඅනූවක් ව්‍යාධි, පැමිණෙනහෙයින් මහත් දුක් ඇත්
තේයයි ආදිනව වශයෙන් සැලකීමය කියනලද ආදිනව සඤ්ඥා
භාවනාවය; සිතෙහි උපදින රාගාදි අකුශලධර්මයන් නොඉවසීම
යයි කියනලද ප්‍රහාන සඤ්ඥා භාවනාවය, නිවන රාගාදි කෙලශයන්
ගෙන් දුරුවූහෙයින් ශාන්තවශයෙන් මෙසේ සැලකියයුතුයයි කියන
ලද ප්‍රහාන සඤ්ඥා භාවනාවය, නිවන සියලු දුක් නිරුද්ධකරන්නේ
යයි මෙසේ සැලකීමය, කියනලද නිරෝධසඤ්ඥාභාවනාවය, සිතට
සුභවශයෙන් වැටහෙන සියලු රූපාදී අරමුණු කෙරෙහි නොඇලීම
යයි කියනලද අනභිරතසඤ්ඥාභාවනාවය, වෘක්ෂමූල ශූන්‍යාගාරා
දියට පැමිණ සොළොස් ආකාරයකින් භාවනාකිරීමයයි කියන
ලද අනාපානසඤ්ඥාභාවනාවය, අමුසොහොන් ආදියෙහි දමන
ලද ඉදිමිගිය මළකඳක් දැක මාගේ ශරීරයටත් මෙලෙස වන්නේ
යයි පිළිකුල්කොට සිතීමයයි කියනලද උද්ධුමාතක සඤ්ඥා භාවනා
වය, එසේම නිල්වගිය මළකඳක් දැක මටද මේ සවභාව ඇතිවන්නේ
යයි සිතීමය කියනලද විනීලකසඤ්ඥාභාවනාවය, ඉදිමි ගොස් කන්
නාසාදී සිදුරුවලින් කුණුදිය වැහෙන මළකඳක් දැක මටත්
මෙසේ වන්නේයයි සැලකීමය, කියනලද විපුබ්බකසඤ්ඥාභාවනා
වය; එසේම සිදුරුඇති මනුෂ්‍ය කුණපය දැක මාගේ ශරීරයටත්
මෙබඳු සවභාවක් ඇතිවන්නේයයි සැලකීමය, කියනලද, විච්ඡිද්දක
සඤ්ඥා භාවනාවය, අමුසොහොන් ආදියෙහි දමනලද බලු කපුටු
ආදීන් විසින් කඩාකන මිනීකුණුදැක මාගේ ශරීරයටත් මෙබඳු සව
භාවක් ඇතිවන්නේයයි සැලකීමය, කියනලද විකඛායිකසඤ්ඥාභාව
නාවය, අමුසොහොන් ආදියෙහි ඒ ඒ තැන අතපය කපාදමනලද

මිනීකුණුදක මාගේ ශරීරයටත් මෙබඳු සවභාවක් ඇතිවන්නේයයි
සිතීමය කියනලද වික්ඛිත්තකසඤ්ඤාභාවනාවය, කඩුආදී ශස්ත්‍ර
යෙන් කඩ කඩකොට සිඳුම්ව කපා අමුසොහොන්හි දමනලද මිනී
කුණු දක මමද මෙබඳු සවභාව නොයික්මූයෙමියි මෙනෙහිකෙරෙ
මින් සැලකීමයයි කියනලද හතවික්ඛිත්තකසඤ්ඤාභාවනාවය, රාජ
නියෝගයෙන් මිනීමරණ තැන වැගිරෙණ ලේදක මටත් මෙබඳු සව
භාවක් ඇතිවන්නේයයි භාවනාකිරීම්වශයෙන් සැලකීමය කියන
ලද ලෝහිතකසඤ්ඤාභාවනාවය, ඒ ඒ සිදුරුවලින් පණුවන් කාව
දිමින් අමුසොහොන් ආදියෙහි පණුවන්ගෙන් ගැවසීතිබෙන මිනී
කුණුදක මටත් මෙබඳු සවභාව ඇතිවන්නේයයි සැලකීමය කියන
ලද පුළවකසඤ්ඤාභාවනාවය, අමුසොහොන්හි දමනලද මස් ලේ
නැතිව නහරවැල් සමූහයෙන් වැලඳ සිටිනා මිනීකුණුදක මටත් මෙ
බඳු සවභාවක් ඇතිවන්නේයයි සැලකීමය කියනලද අට්ඨිකසඤ්ඤා
භාවනාවය, වෛරි නොවෛරී සියල්ලන්කෙරෙහි මෛත්‍රිය පැතිර
වීමය කියනලද මෛත්‍රීභාවනාවය, එසේම වෛරි නොවෛරී සියලු
සත්වයන් අතුරෙන් යමෙකුට දුකක් පැමිණ තිබෙනවා දුටුවිට මෙ
යින් මොහු මිදේවයි කරුණාව උපදවන්නාවූ කරුණාභාවනාවය;
ඉසුරුමත් සත්වයන්දක එයට ඊර්ෂ්‍යා නොකොට යහපත යහපතැයි
කියා සතුටුවීමය කියනලද මුදිතාභාවනාවය, වෛරී නොවෛරී
හිතාහිත සියල්ලන්කෙරෙහි මධ්‍යස්ථව පැවති සිත ඇතිබවයයි
කියනලද උපෙක්ෂා භාවනාවය, සියල්ල මැරෙන්නේය, එලෙස
මටත් මරණයවන්නේයයි සිතීමය කියනලද මරණානුස්සතිභාවනාවය,
අත්ථි ඉමස්මිං කායෙ කෙසා යනාදියෙහි පිළිකුල්භාවනාවය, මෙනෙ
හිකිරීමය කියනලද කායගතාසති භාවනාවය යනාදීන් අප ලොව්
තුරා බුදුරජානන්වහන්සේ විසින් වදාරණලද භාවනාමය මල්වගී
විකිණීම පිණිස තිබෙන සල්පිලෙක් ඒ සතිපට්ඨාන මහාවීථියෙහි
ඇත්තේය; ඒ සල්පිලයයි කියනලද මල්කඩය අපභාග්‍යවතුන්වහන්
සේගේ පුෂ්පාපනය නම් වන්නේය; එබඹ පින්වත් සඞ්ඛ්‍යාවන්ත සත්
පුරුෂයෙනි කුශලකර්මමය මිලගෙණ මේ සල්පිලකරා පැමිණ මෙකී
මල්මාලාවන් පැලඳ සැරසී භාවනාමය මල්විකිණීම පිණිස ඒ කඩ
යෙහි ඉන්නා භික්ෂූන්වහන්සේලාගෙන් ඒ මල්මාලාවන් ලබාගෙණ
තමන්ගේ ශරීරවල පැලඳගෙණ සසරදුකින් මිදී නිවන්පුර වැද
උතුම්වූ මොක්සිරි විඳිනට උත්සාහ කරව්—එයින් වදාළහ.—

> ‘කම්මමූලං ගහෙත්වාන ආපනං උපගච්ඡථ,
> ආරම්මණං කිණිත්වාන තතො මුච්චථ මුත්තියා’ යි.

තවද ඒ සතිපට්ඨාන මහ වීථියෙහි අප බුදුරජානන්වහන්සේගේ
සුගන්ධාපනයයි කියනලද විකිණියයුතු සුවඳබඩු තිබෙන සල්පිල

කවරහයත්? අප ලොවුතුරා බුදුරජානන්වහන්සේ විසින් වදාරණ ලද පඤ්චසීලය, අෂ්ටාඞ්ගසීලය, දසාඞ්ගසීලය, ප්‍රාතිමොක්ෂසංවරසීලය යනාදී සීලමය සුගන්ධද්‍රව්‍යයන් විකිණීම පිණිස තිබෙන සල්පිලෙක් ඒ සතිපට්ඨාන මහාවීථියෙහි ඇත්තේය. ලෝකයෙහි විද්‍යමානවූ සපු දුනුකේ දෑසමන් ආදී පුෂ්පයන්ගේ සුගන්ධයද, සඳුන් තුවරලා අගිල් කොකුන් ආදීන්ගේ සුගන්ධයද, යටිසුලඟට පමණක් හමන්නේ ය, එසේ නොව සීලසුගන්ධය උඩුසුලඟෙහි හා යටිසුලඟෙහි දසදිසාවෙහිද පැතිර හමන්නේය, සඳුන් තුවරලා අගිල් කොකුන් මහනෙල් සිනිඳු බෝලිද්ද ආදීන්ගේ සුගන්ධයට වඩා මේ සීල සුගන්ධය උතුම් වන්නේමැයි—එයින් වදාළහ.

" නපුප්ඵගන්ධො පටිවාතමෙති
න චන්දනං තගර මල්ලිකාවා
සතං ච ගන්ධො පටිවාතමෙති
සබ්බාදිසා සප්පුරිසො පවාති.

චන්දනං තගරං වා පි උප්පලං අථවස්සිකී,
එතෙසං ගන්ධජාතාන සීලගන්ධො අනුත්තරො" යි.

දෙවාති දෙවවූ අපබුදුරජානන්වහන්සේගේ නිවන්පුර සතිපට්ඨානමහවිථියෙහි මේ සුවඳබඩු විකිණීම පිණිස තිබෙන සල්පිලනම් වන්නේය; වැඩකැමති එබා පින්වත්නි මේ සල්පිලකරා එළඹ සීල සුගන්ධයෙන් ආලේපකරණලද ශරීර ඇතිව සීලසුගන්ධයන් විකිණීම පිණිස මෙකී සල්පිලෙහි ඉන්නා බුඩපුත්‍රයන්ගෙන් මේ සුවඳජාතීන් ලබාගෙණ තෙපිද ශරීරාලේපකොට දසදිසාව සුවඳකෙරෙමින් නිවන්පුරවැද මොක්සුවසිරි විඳිනට උත්සාහ කරව්—තවද ඒ සතිපට්ඨාන මහවීථියෙහි අප ලොව්තුරා සර්‍වඥයන්වහන්සේගේ ඵලාපනයයි කියනලද විකිනියයුතු ගෙඩිජාති තිබෙන සල්පිලනම් කවරහයත්? ත්‍රිභුවන ජනවන්දනීයවූ අපබුදුරජානන්වහන්සේ විසින් වදාරණලද, සෝවාන්ඵලය, සකෘදගාමිඵලය, රහත්ඵලය, රාගාදි අකුසලයන්ගෙන් ශූන්‍යවූ සුඤ්ඤතඵලසමාපත්තිය, රාගාදී අකුසලයන්ගේ කිසි ග්‍රහනයක් නැති අනිමිත්ත ඵලයමාපත්තිය, රාගාදී අකුසලයන්ගේ කිසිත් ප්‍රාර්ථනාවක් නැත්තාවූ අප්‍රනිහිත ඵලසමාපත්ති යන මේ සත්වැදෑරුම් ගෙඩිජාති විකිනිමපිණිස තිබෙන සල්පිලෙක් ඒ සතිපට්ඨාන මහවිථියෙහි ඇත්තේය; මෙකී ගෙඩිජාති විකුණනු සඳහා ඒසතිපට්ඨානමහවිථියෙහි තිබෙන සල්පිල අපබුදුරජානන්වහන්සේගේ ඵලාපනයනම් වන්නේය, පින්වත් සඞ්ඛාවනතායෙනි කර්‍මස්ථාන මිලගෙණ මෙකී සල්පිලකරා එළඹ මෙකී ඵලජාති විකුණනු පිණිස මෙකී සත්වැදෑරුම් ඵලඅනුභවකොට සුවපත්වූ ව්‍රම් කඩයෙහි

ඉන්නා ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ගෙන් කර්මස්ථාන මිලදී මේ ශෙඩ්මශී ඇරගෙන අනුභවකොට සුවපත් නිවන්පුරවැද උතුම් සැපවිඳිනට උත්සහකරව්—එයින් වදාළහ.

“කම්මමූලං ජනාදත්වා ගණ්හන්ති අමතප්ඵලං
තෙන තෙ සුඛිතාහොන්ති යෙකීතා අමතප්ඵලං

තවද අප භාග්‍යවතුන්වහන්සේගේ ඒ සතිපට්ඨාන මහවීථියෙහි අගදාපනයයි කියන ලද විකිණියයුතු බෙහෙත් තිබෙන බෙහෙත් කඩය කවරහයත්? සකලලෝකසිවංකරවූ අපබුදුරජානන්වහන්සේ විසින් වදාරණලද දුඃඛසත්‍යය, සමුදයසත්‍යය, නිරොධසත්‍යය; මාර්ග සත්‍යය යන මේ සතර ධර්ම නැමැති බෙහෙත්හු විකිණීම පිණිස තිබෙන සල්පිලෙක් ඒ සතිපට්ඨාන මහවීථියෙහි ඇත්තේය; අප බුදු රජානන්වහන්සේ විසින් ඒ සතිපට්ඨාන මහවීථියෙහි සදනලද මේ අගදනම්වූ බෙහෙත් කඩයනම් වන්නේය; ජාතිජරාමරණාදි සසර දුකින් මිදී සුවපත්වනු කැමති ශ්‍රද්ධාවන්තයෙනි චතුරාර්‍ය්‍යසත්‍යමය බෙහෙත් අනුභවකොට සුවපත්ව මෙකී සල්පිලෙහි චතුරාර්‍ය්‍යසත්‍ය බෙහෙත් විකිණීම පිණිස වැඩවසන ශ්‍රමණශාක්‍යපුත්‍රයන්ගෙන් මේ බෙහෙත් ලබාගෙන අනුභවකොට තෙපිද සුවපත්ව නිවන්පුරවැද සුවසිරි විඳිනට උත්සාහකුරව්—එයින් වදාළහ.

“යෙකෙචිලොකෙ අගදා විසානං පටිබාහකා
ධම්මාගදං සමං නත්ථි එතං පිවථ භික්ඛවො” යි,

තවද අපලොව්තුරා භාග්‍යවතුන්වහන්සේගේ ඒ සතිපට්ඨාන මහාවීථියෙහි ඖෂධාපනයයි කියනලද විකිණියයුතු බෙහෙත්බඩු තිබෙන සල්පිලනම් කවරහයත්? තිලොකතිලකවූ අපබුදුරජානන් වහන්සේ විසින් වදාරණලද සතරසතිපට්ඨානය, සතරසම්‍යක් වීර්‍ය්‍යය, සතරසෘද්ධිපාදය, පඤ්චෙන්ද්‍රියය, පඤ්චබලය, සප්තබොධ්‍යඞ්ගය, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය යන මේ සත්තිස්බොධිපාක්ෂිකධර්මමය බෙහෙත් ද්‍රව්‍ය විකිණීමපිණිස තිබෙන කඩයෙක් ඒ සතිපට්ඨාන මහාවීථියෙහි ඇත්තේය; අපබුදුරජානන්වහන්සේ විසින් සතිපට්ඨාන මහාවීථි යෙහි සාදනලද මේ ඖෂධාපනයයි කියනලද කඩයනම් වන්නේය; රාගාදි දෝෂ ව්‍යාධියෙන් මිදී සුවපත්වනුකැමැති පින්වත් සත්පුරුෂ යෙනි, තෙපිද මේ සල්පිල කරා පැමිණ මේ ධර්මමය බෙහෙත් සේව නයකොට සියලුදුකින් මිදී ලෝවැසියන්ටද ඒ බෙහෙත්දී සුවපින් කරවනු කැමතිව ඒ සල්පිල වසන ශ්‍රමණශාක්‍යපුත්‍රයන්ගෙන් මෙකී බෙහෙත් ලබාගෙන සෙවනයකිරීමෙන් රාගද්වෙෂ මොහ මදමාන

මාත්සර්‍ය්‍යාදි අකුසලධර්මමය දෝෂයන් වමනවිරේචනයෙන් පහකොට සුවපත්ව නිවන්පුර ප්‍රවිෂ්ටව උතුම් මොක්සිරි විඳිනට උත්සාහ කරව්—එයින් වදාළහ.

'යෙකෙචි ඔසධා ලොකෙ විජ්ජන්ති විවිධා බහූ
ධම්මොසධං සමං නත්ථි එතං පිවථ භික්ඛවො ' යි.

නවද ඒ සතිපට්ඨාන මහාවීථියෙහි අමෘතාපනයයි කියනලද විකිණියයුතු අමෘතය තිබෙන සල්පිල කවරහයත්? අප බුදුරජානන්වහන්සේ විසින් " අත්ථි, ඉමස්මිං, කායෙ, කෙසා, ලොමා, නඛා, දන්තා, තචො " යනාදීන් වදාරණලද ද්වාතිංසාකාර භාවනා සංඛ්‍යාත අමෘතය විකිණීම පිණිස ඒ සතිපට්ඨාන වීථියෙහි සාදාතිබෙන සල්පිල අමෘතාපනයනම් වන්නේය; සංසාරව්‍යාධියෙන් පීඩිතවූ පින්වත්නි තෙපිද සතිපට්ඨාන මහාවීථියෙහි තිබෙන අමෘතාපනනම්වූ කඩය කරා ගොස් ඒ අමෘතය අනුභවකොට සුවපත්ව ඒ කඩයෙහි අමෘත විකිණීම පිණිස වාසයකරණ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ගෙන් කර්මස්ථාන මිලදී ඒ අමෘතය ලබාගෙණ අනුභවකොට සංසාරව්‍යාධියෙන් මිදී නිරෝගීභාවයට පැමිණ නිවන්පුරයට ගොස් එහි විඳියුතු උතුම්වූ ලොව්තුරා සැපවිඳින්ට උත්සාහකරව්—එයින් වදාළහ.

' ව්‍යාධිතං ජනතං දිස්වා අමතාපනං පසාරයි'
කම්මෙනතං කිණිත්වාන අමතං ආදෙථ භික්ඛවො ' යි.

නවද ඒ සතිපට්ඨාන මහාවීථියෙහි අප බුදුන්ගේ විකිනියයුතු රත්නයන් තිබෙන රත්නාපනනම්වූ සල්පිල කවරහයත්? අපබුදුරජානන්වහන්සේ විසින් වදාරණලද සීලරත්නය, ප්‍රථමධ්‍යානාදි සමාධිරත්නය කුසල් අකුසල් හා චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන් ඇතිසැටියේ දැනගන්නා ප්‍රඥාරත්නය, අර්හත් ඵලයයි කියනලද විමුක්ති රත්නය, නසනලද කෙලෙසුන් සහ ඉතුරු කෙලෙසුන්ද සෝවාන්ආදි සතරමග සතර ඵලය හා නිර්වාණයද, ප්‍රත්‍යවේක්ෂාකරණ විමුක්ති ඥානදර්සනාරත්නය, අර්ථය, ධර්මය, නිරුක්තිය, ප්‍රතිභානය යන මේ සිව්පිළිසිඹියාවෙහි නොපැකිල පවත්නා ඥානමතියයි කියනලද ප්‍රතිසම්භිදාරත්නය, සතිසම්බොධ්‍යංගය; ධර්මවිචයසම්බොධ්‍යංගය, වීර්‍ය්‍යසම්බොධ්‍යංගය, ප්‍රීතිසම්බොධ්‍යංගය; ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යංගය, සමාධිසම්බොධ්‍යංගය, උපෙක්ෂාසම්බොධ්‍යංගය, යන සප්ත බොධ්‍යංග රත්නය යන මෙකී රත්නයන්ගෙන් පිරීතිබෙන්නාවූ සල්පිලෙක් ඒ සතිපට්ඨාන මහාවීථියෙහි ඇත්තේය; ඒ සල්පිල සර්වඥරාජෝත්තමයානන්වහන්සේගේ රත්නජාති තිබෙන කඩයනම් වන්නේය; දෙව්බඹුන් සහිත සියලු ලෝකවාසීන්ගෙන් වැඳුන් පිදුන් සත්කාර ලැබීමට කැමැති පින්වත්නි, තෙපිද මෙකී සල්පිලකරා පැමිණ මේ රත්නාලඞ්කාර

යෙන් සැරසී සියලු දෙව්බඹ ආදීන්ගෙන් වැඳුම් පිදුම් ගරුකාර සත්කාර ලබමින් මේ රත්නයන් විශුණනු කැමතිව මෙකී සල්පි ලෙණ් වාසයකරණ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ගෙන් කර්මස්ථාන මිලදී මෙකී ප්‍රකාශ රත්නයක් ගෙණ පැළඳ සියලු ලෝකවාසීන්ගෙන් පූජා සත්කාර වැඳුම් පිදුම් ලබමින් නිර්වාණපුර ප්‍රවිෂ්ටව උතුම්වූ සුවසිරි විඳිනට උත්සාහ කරව්—එයින් වදාළහ....

'සීලාදිරතන මාලානං උපධගණ්හන්ති සදෙවකා
කමෙමින තං නිබ්බාන රතනං වො පිලන්ධථ'

තවද අප බුදුරජානන්වහන්සේගේ ඒ සතිපට්ඨාන මහාවිපියෙහි සර්වාපනයයි කියනලද සියලු බඩු දමා විකිණීමට තිබෙන සල්පිල හෙවත් කඩය කවරගයන්? සියලුම සම්පත් තිබෙන සර්වාපනයයි කියනලද කඩයෙහි සූත්‍රගෙය්‍ය වෙය්‍යාකරණාදි නවාංග බුද්ධවචන යන් ඇත්තේය; සාරීරික, පාරිභෝගික, උද්දේසික, යන මේ ත්‍රිවිධ චෛත්‍ය ඇත්තේය; සංඝරත්නයද ඇත්තේය; අපබුදුරජානන්ව හන්සේ විසින් ඒ සල්පිලෙහි දිව්‍යබ්‍රහ්ම මනුෂ්‍ය සම්පත් සඳනලද් දේය; භෝග සම්පත් සඳනලද්දේය; ආයු සම්පත් සඳනලද්දේය; ආරෝග්‍ය සම්පත් සඳනලද්දේය; වර්ණ සම්පත් සඳනලද්දේය; ප්‍රඥ සම්පත් සඳනලද්දේය; නිර්වාණසම්පත් සඳනලද්දේය; අප බුදුරජානන්වහන්සේගේ සතිපට්ඨාන මහාවිපියෙහි සරහාතිබෙන මේ නිර්වාපනයයි කියනලද, කඩයනම් වන්නේය, එබා පින්වත් සත්පුරුෂයිනි, මේ කඩයකරා පැමිණ කුසල්නැමැති මිලදී සිතුපැතූ සියලුම සම්පත් ගතහැකිවන්නේය; එසේ හෙයින් තෙපි කැමතිනම් මෙකී කඩයෙන් බ්‍රහ්මසම්පත්ද ලබාගතහැකිවන්නේය; දිව්‍යසම්පත්ද ලබාගතහැකිවන්නේය; මනුෂ්‍යසම්පත්ද ලබාගතහැකි වන්නේය; භෝගසම්පත්ද ලබාගතහැකිවන්නේය; ආයුසම්පත්ද ලබාගතහැකි වන්නේය; නිරෝගිසම්පත්ද ලබාගතහැකි වන්නේය; වර්ණසම්පත්ද ලබාගතහැකිවන්නේය; නිර්වාණසම්පත්ද ලබාගතහැකි වන්නේය සියලුම ලෞකික ලෝකෝත්තර සම්පත් ලබාගතහැකි වන්නේය; ස්වල්පවූ මිලයෙන්ද මෙකී සම්පත් ඒ කඩයෙන් ලබාගතහැකිවන් නේමැයි....එසේහෙයින් ත්‍රිවිධ පුණ්‍යක්‍රියා මිලය හෝ ශ්‍රද්ධාමිලය හෝ ස්වල්පයක් නමුදු මෙකී දිව්‍යබ්‍රහ්ම මනුෂ්‍යසම්පත් ආදී ලෞකික සම්පත් හෝ උතුම් නිවන්සම්පත් හෝ ලබාගෙණ සියල්ලෙන් සමෘද්ධව වාසයකරව්—එයින් වදාළහ....

"ආයු ආරොග්‍යතා වණ්ණො සග්ගො උච්චා කුලීනතා,
අසංඛතංච අමතං අත්ථි සබ්බං ජිනාපනෙ.
අප්පෙන බහුකෙනාපි කම්මමූලෙන ගන්හති,
කිණිත්වා සද්ධාමූලෙන සමිද්ධා හොථ භික්ඛවො" යි.

නිර්වාණ මහනුවර සතිපට්ඨාන මහාවීථියෙහි අපබුදුරජාණන්ව හන්සේ විසින් කිසිවකින් අඩුවක් නොකොට සියලු උපභොග පරි භොග වස්තුවෙන් සම්පූර්ණකොට සදනලද සල්පිල් අට ගෙවත් කඩ අට මෙසේ දතයුත්තේය; මෙතෙකින් මේ "නිර්වාණනගරවර්ණනා" නම්වූ ප්‍රකරණය නිමවන ලදි.

ඉතිඑවං සීහළානන්තු නිබ්බාණපුරවණ්ණනං
කතංමයා තමාදය ජානිත්වා තස්ස ලක්ඛණං
පටිපජ්ජන්තිංසුප්පුරෙත්වා අසන්තං කස්සචූපද්දවං
පප්පාතිබ්බාණ නගරං විඤ්ඤුන්තු පරමං සුඛන්ති.

යනුහෙයින් සිංහලදිපවාසීන්ට වැඩපිණිස මාවිසින් දෙශනාපාළි යෙන් රැගෙණ සිංහලටනගා කරණලද මේ ප්‍රකරණයෙහි ප්‍රකාශිත සියලු නුවර අලංකාරයෙන් යුක්තවූ කිසිත් අඩුවක්නැති ඒ නිර්වාණ නුවරෙහි ලක්ෂණ දැනඇදින පරංජසදීපනියෙහි ප්‍රකාශ ප්‍රතිපත්තිය මනාකොට පුරා පිළිකුල්භාවනාවද භාවිතාකොට ජාති ජරා මරණ ශොකපරිදෙව දුක්දෙම්නස් ආදි කිසි උපද්‍රවයක් නැත්තාවූ ශාන්ත ප්‍රණීත උතුම් නිවන්පුරයටපැමිණ උතුන් සැපසම්පත් සියල්ලෝම විඳිත්වයි; මේ ප්‍රකරණය කළාවූ මාගේ අදහස මෙහි අවසාන ගාථා දෙකින් මෙසේ දැක්වූයේයයි දතයුතු.

නිර්වාණපුර වර්ණනාව නිමි.

---

# මෛත්‍රී වර්ණනාව.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

තවද මේ බුද්ධවංශදෙශනාව නිමිකල දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන්වහන්සේ දේවතාවන්ගේ ධර්මලෝභය තමන්ම සුවසේ දැක සිවුරු ඒ කාංශකොට රුවන් සක්මනදී වැඩසිට බහාගෙණ චක්‍රවර්ති රජක්හු ඉදිරියට ප්‍රෞඪායන නායක පුත්‍රුවනක්සේ පිය වර ඔසවා ගොස් බුදුන්ට ලන්ව සිට දෙහොත්මුදුනේ තබාගෙණ මාගේ ගැලවුන්කාර පියවූ බුදුරජාණෙනි නුඹවහන්සේගේ මේ විශෙෂවූ දේශනාවඅසා මාගේද සියලු සතුන්ගේද කාංශාව දුරුවගියාහ; තවද නුඹවහන්සේ විසින් මතු මෛත්‍රි නම් බුදුකෙනෙකුන් උපදි තියි වදාරණලදි, ඒ මෛත්‍රිනම් බුදුහු කවර කලක උපදිද්ද කෙසේවූ බුද්ධශ්‍රීයාහුදැයි විශෙෂයෙන් අසනු කැමැත්තෙමියි ආරාධනාකළ සේකා... කිසේ මැනො...

'සාරිපුත්තො මහාපඤ්ඤො උපතිස්සො විනායකො
ධම්මසෙනාපතිධීරො ඨපෙත්වාලොක නායකො.
අනාගතං ජිනා රම්හා ආපුච්ඡිකංඛ මතතානො
තුය්හං කථන්තරිකා ධීරො බුද්ධෙකීදිසකොහවෙ,
විත්ථ තෙවගංසොතුං ඉච්චමා චක්ඛ චක්ඛුමාඃති.

මෙසේ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුන් වර්ණාවක්පිට වර්ණාවක් වසිනාසේ නැවතත් අනාගතවංශ දෙශනාවට පටන්ගෙණ වදාරණසේකා... ශාරිපුත්‍රස්ථවිරය, මේ මාගේ උත්සාහයෙන් ක්‍රමයෙන් පිරිහි දසඅවුරුද්දකට ආයු ඇතිවෙයි එකල සත්වයෝ තිරිසනුන් වැනියාහ; මවුපියෝයයි වෙනසක්නො දනිති නැගනියෝය, බුහුනනියෝය, මසිලනුවෝය, බෑනනුවෝය, දියනියෝය; යනාදීන් ව්‍යවහාරයක් නැතිව තමතමන්කෙරෙහිම ප්‍රේමකෙරෙති; පස්වැසි කුමාරිකාවන් සරණපාවාදෙති සියලු රසම අනන්තඝනවෙයි; මින් වරාසාලේ බත් රජදරුවන්ට අග්‍රභෝජනවෙයි මෙසේ ලොව සියළු දෙසින්ම හීනවූකල්හී ත්‍රිවිධවූ අන්තඃකල්පයන් අතුරෙන් දූන් සත්වයාගේ වෙෂවූ උත්සන්නවීම හේතුකොටගෙණ සත්ථන්තරනම්කල්පයෙන් ලොවවිනාශකෙරෙති, හේකෙසේදයත්? අන්තඃකල්පයන් නසින්නට පළමුව සත්වන දවසෙහි කාමාවචර නම් දේවතාකෙනෙක් අවමඟුල් වේෂයක්ගෙණ සත්වයෙනි මෙසින්

සත්දවසක් ගියකල මෘගසන්වශීාවක් වසිනවාායි යන විනාශකරවූ වැස්සෙන් සත්දවසක් ධාරානිපාතයෙන්වැසි වැස්සෙහි තෙමුනු කෙනෙක් ඔවුනොවුන් ඇසට මුවන්සේ පෙණී ඔවුනොවුන්ගේ ජීවිත විනාශයකොරෙති, දිවිරකිනාකෙනෙක් ඒ සත්දවසකට දර පැන් බත් සාල් එණු ඇඹුල් රැස්කොට තබාගෙණ ගල්ගුහාආදියෙහි වැදහිඳ දිවිරකුවයි කිය කියා කෙළලක්‍ෂයක් සක්වළ දිව්‍යරාජයා විසින් කියකියා ඇවිදිති; එබස්ඇසූ සත්වයෝ තමතමන් අඥාන හෙයින් ඒ දුටුවෝ කව්රුද ඇසුවෝ කව්රුද? එනම් කුමනබසෙක් දැයි නොගිවිස සිනාසෙති; සමහර නුවනැතිකෙනෙක් කව්රුදනිද් දැයි දෙවියන් කීසැටියේ ගල්ගුහා පර්වතගුහාආදියෙහි දෙදෙනෙක් ඔවුනොවුන් ඇසට නොපෙණෙනසේ හිඳිති; එකල මෘගසන්වශීාව කෙළලක්‍ෂයක් සක්වල මුළුල්ලෙහි එකපැහැර ධාරානිපාතයෙන් වසින්ට පටන්ගන්නී; පොදබිඳුවකින් තෙමුනු යම්කෙනෙක් ඔවු නොවුන් ඇසට මුවන්සේ පෙණෙති කොල තෙල මුවාගණුව අසුක රවා ගණුවයි කිය කියා ඔවුනොවුන් එනුබඳවාගනිති තණපත් පර ඬලාපත් සිසුම් මුවහන් ඇති කඩුපත්සේ මැවියෙයි, ඒ සද්ද මුළුල් ලෙහි සත්වයෝ මෙසේ ඔවුනොවුන් මරා එකසේම කලවිටක්සේ කොට ලොව ලේවුහුද කෙරෙති, ඉක්බිත්තෙන් වැසිහළ කල ජීවත් වූකෙණෙක් හෙලිබැස මළ මළ නෑයන්ගේ පොළගෙණ තිබෙන අතුල් පතුල් ඉස් කන් නාසා ආදිවූ ඇඟමස්දැක අපගේ නෑයෝ අප කියමන් නොගෙණ හැම්දෙනම දැන් නටහයි මහත්වූ කරුණා උප දවා අපිහැම ජිවත්වූගත්ත, ඔවුනොවුන්ගේ ආත්ම රක්‍ෂාවෙහි අප්‍ර මාද වම්හයි ඔවුනොවුන්කෙරෙහි මෛත්‍රිව එතැන්පටන් ප්‍රාණඝාත නොකරම්හයි පළමුකොට පාණාතිපාතය හැරපියති; ඒ කුශලයෙන් උන්වැදූ දරුවන්ට විසි අවුරුද්දට ආයුවෙයි, ඔහු දෙවැනිව අදත් තාදානය හැරපියති උන්වැදූ දරුවන්ට හිස්අව්රුද්දට ආයුවෙයි; තුන්වැනිව පරදාරය හැරපියති උන්වැදූ දරුවන්ට සතලිස් අව්රුද් දට ආයුවෙයි; සතරවෙනිව මුසාවාදය හැරපියති උන්වැදූදරුවන්ට පනස් අව්රුද්දට ආයුවෙයි; පස්වැනිව පිසුනාවාචය හැරපියති උන් වැදූ දරුවන්ට සැට අවුරුද්දට ආයුවෙයි යනාදීන් මෙම ක්‍රමයෙන් දශවිධ කුසලධර්මයෙහි පිහිටායෙති; ඒ කුශල ධර්මයන්ගේ ආනුභාව යෙන් ක්‍රමක්‍රමයෙන් දෙසියයක් අවුරුද්දට ආයුවෙයි එකල දඹදිව ඉතා සමෘඬව බරණැස්නුවර නම්නොපෙරලී එම නමින්ම ව්‍යවහා රවෙයි; තවද එසින් මත්තෙහි කුශල ධර්මයන් වැඩි වැඩීයෙයි; සත්වයන්ගේ ආයු ක්‍රමයෙන් වැඩී අනූදහසක් අවුරුද්දට ආයුවෙයි එකල් බරණැස්නුවර නම්පෙරලී උප්පලනම් නුවරක්වෙයි; එනුවර දිගින් පළලින් යොදුනක්පමණ මහත්ව සමෘඬවෙයි එසින් මත්තෙහි

තවද ආයුක්‍රමයෙන් වැඩී ලක්‍ෂයක් ආයුකල උත්පලනම් නුවර පෙරලී අයම්විතරින් සත්යොදුනක් පමණ ඇති පදුමනම් නුවරෙක් වෙයි; තවද වඩ වඩා කුශලධර්මයන්ගේ බලයෙන් අසංඛ්‍යයක් අවුරුද්දට ආයුවෙයි, එකල පදුමනම් නුවර පෙරලී දෙලොස් යොදුන් අයම්විතරින් මන්දරනම් නුවරෙක්වෙයි, ඒ අවදිය මිනිස්ලොව දෙව්ලොවට වඩනේය; උපන්කල් නොදනිති, ජරා පිළිකුල් නැත රෝගාන්තරායන්නැත මෙසේ සුවවිඳිව හේතුකොටගෙණ දුක්නම් කෙසේ බවක් නොදන සත්ත්වයෝ කුසල්කිරිමෙහි ප්‍රමාදවෙති, ඒඅකුශලයෙන් ආයුප්‍රහීනයට පැමිණ ක්‍රමක්‍රමයෙන් අසූදහසක් අවුරුද්දට ආයුවෙයි; එකල්හි මඤ්ජුරනම් නුවර පෙරලී කෙතුමතීනම් රාජධානි වෙයි—වදාළේ මැනො....

‘තදකෙතු මතීනාම රාජධානි භවිස්සති
පාදු යොජනතායාම සතනයොජන විත්ථතා’ සි

තවද ශාරිපුත්‍රස්ථවිරය ඒ නුවර දිගින් දෙළොස්යොදුන, පුළුලින් සත්යොදුන, වටින් අටතිස් යොදුනක් ඇත්තේය; පොළො පළා නැගී සත්රුවන් පවුරු සතෙක් නුවර සිසාරාසිට රෑ වෙනසක් නොදන්වා ප්‍රභාමත් කෙරෙයි එයින් අන්තයෙහි රිදීමයවූ කඳඇති ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ පත්ඇති ස්වර්ණමයවූ ඵලඇති ඒ තාලවෘක්ෂ පන්තිහු සත්වලල්ලක් විටින්විට ගසාසිටගන්නී; සතරදිසාවෙහි සත්රුවන් වාසල් සතරෙක් පොළොවපළාගෙණ පැණනැගී නාන්විසිතුරු සම්පත්තීන් සැදී සිටි මුළුදඹදිව සත්ත්වයන් කැමැති කැමැති වස්ත්‍රාභරණ ඉන්එක කප්රුකෙකින් ගෙණගියත් ඒ අසූදහසක් අවුරුදු මුළුල්ලෙහි ඈඳ නිමවාගතනොහැක්ක; තවද ඒ නුවර මැද නැගී සත්රුවන්මයවූ ශාලාවකුදු ඇත, ඒ ශාලාව වට සතරදිග මහා කප්රුක් සතරෙක්මැවිතිබෙයි, ඒ කෙතුමතීනම් රාජධානියෙහි දන්ඩෙන් පතින් කළගෙයක වසන්නාවූ එකද සත්ත්වයෙක් නැත සත්රුවන් ගෙවල්වලම වාසයකෙරෙති, දිව්‍යමයවූ උයන් හා දිව්‍යමයවූ පොකුණේ ගැවසීගත, එකල ඒ සා දඹදිව මුළුල්ලෙහි සත්ත්වයන් කෙරෙන් සානා වපුරණ කෙණෙක් වේවයි බඩනිසා දුක්ගන්නා එකද මනුෂ්‍යකෙනෙක් නැත පොළොවපළාගන සයංජාතවූ රත්හැල්පැණනැගෙයි කරල්වල තුඩුතෝ නැතිව මුතුදැල්සේ සාල්ගෙණ තිබෙයි එක්බිජුවටක්හු නැගීතැනින් නැඟිපදුරෙහි කඩා මැඩගන්කල දෙදූස්දෙසිය සැත්තෑ ගැලක්පුරා සොලසාමුණු අටළාසක් ඉතිරිවී තිබෙයි, සාල් මැනික් බඳනෙඟිලා මැනික් උදුනෙහිදී මපිසවාම හැමසත්ත්වයෝම අනුභවකෙරෙති සත්ත්වයන් මලමූත්‍ර කෘත්‍යකරම්හයි සිතුවේලෙහි නිල්වලාකඩෙක් දිවගණ අවුදින් නිරයක්සේ රාසිවගන්නී; එකල්හි පොළොවපැලී මහවලෙක් මැවියෙහි එහි

ශරීරකෘත්‍යයකළකල්හි එවේලේම අනතඝනව පැන්පොකුණෙක් මැවීයෙයි එයින් උදකකෘත්‍යය කළකල්හි වලාකඩ අනතඝන වෙයි මෙසේ ඒ කෙතුමන්නම් රාජධානියනම් දිවපුරයක්වැන්න; නවද ශාරිපුත්‍රසත්ථිරය පෙර දිඹුල්දන්ඩෙන් ගෙයක් නහ්වා වස්වස වා පින්කළ කුළුපොතු දෙපොතු පියන් අතුරෙන් පුතනුවෝ මාගේ සාසනයෙහි භද්දියනම් සිටුව නිවන්දක්නේය, පියානෝ තමන්කළ පින් මුහුකළහෙයින් මේ බුඩාන්තරය මුළුල්ලෙහි සදෙව්ලොව සැරිස රා ඇවිද එකල කෙතුමතීනම් රාජධානියෙහි සංඛනම් චක්‍රවර්තිරජව උපදින්නාහුය; එරජ පෙරකළ ආවාසදනයාගේ කුශලයෙන් පෙර මහාජනන්දනම් රජ්ජුරුවන් අසංඛ්‍යයක් අවුරුදු හිඳ රාජ්‍යය කළ පස්විසියොදුන් උසඇති සියක් මහල් ඇති සවාසුදහසක් සත් රුවන් ගබඩා ඇති ඉදුම්නි නිල්මයවූ බිම්ඇති ඝනරත්මයවූ වැම් ඇති රිදීමයවූ කොතුරුහා ජේකඩඇති ප්‍රවාලමයවූ ව්‍යාග්‍ර පත්හි ඇති රන්මයවූ පලසෙවෙනි ඇති පස්විසියොදුන් ඒ රන්පාය ආකා ශයට පැනනැගී දෙවෙනි සඳක්සේ අවුදින් නුවරමැද පිහිටියේය, චක්‍රරත්නය, හස්තිරත්නය, අශ්වරත්නය, පරිනායකරත්නය, ගෘහ පතිරත්නය, ස්ත්‍රීරත්නය, පුත්‍රරත්නය යන මේ සත්රුවන් පහළ වෙයි, එරජ තමාගේ සමබලඇති පුතුන් දහසක් ඇතිවෙයි; ආකාශ යෙන් යන සෘධිඇතිවෙයි සඳුන් සුවඳ වහනය වන්නාවූ ශරීරඇති වෙයි; මහනෙල්මල් සුවඳ හමනය වන්නාවූ මුඛ ඇතිවෙයි, දෙව් යෝ සතරදිග කඩුගත් අත්ඇතිව රැකවල්ගෙණ සිටිති; සතරමහ ම්පයෙහි මහසෙන් සමග එද ඇවිද සියලුසතුන්ට පන්සිල් රකුවයි අවවාදදී දවල්බතට සියනුවරට එහි; මෙසේ ඒ සංඛනම් චක්‍රවර්තී රජ දිඹුල් දණ්ඩෙහි ගෙයි පිනින් සවාසුදහසක් ඒසාමහත් සත්රු වන් පායක් ලබන්නේය; ඒගෙයි ලාළුවක් ඇදෙහි පිනින් සවාසුදහ සක් යහන් ලබන්නේය; එකඇතිරිලියෙහි පිනින් සවාසුදහසක් වස්ත්‍රලබන්නේය; බැලමෙහෙකොට සපයාදුන්ආහරදනයෙහිපිනින් දිව්‍යභෝජන ලබන්නේය; ඒ ගෙයිලාළු පුටුවේ පිනින් සවාසුදහ සක් සිංහාසන ලබන්නේය; සැදූසිතින් දන්පිසූ ස්ත්‍රී ප්‍රධානකොට සවාසුදහසක් බිසෝවරුන් ලබන්නේය; ඒ පන්සල වැඩකරවාලූ පිනින් නුවරවට සත්රුවන් පවුරු සතෙක් මැවෙන්නේය; ඒ පන් සලවට ඉදුවාලූ තල්පැල වැටෙහි පිනින් සත්රුවන්මය තල්ගස් සත්වළල්ලෙක් නුවර සිසාරා වටකරසිටින්නේය, සත්දවසක් වස් වැසවූ පිනින් සප්තවිධරත්නය පහළවන්නේය; වස්අන්තයෙහි දුන් නාවූ වස්වාසික සිවුරු පිළියෙහි පිනින් ඒසාමහත් කප්රුක් ලැ බෙන්නේය; මෙසේ සංඛනම් චක්‍රවර්තීරජ එකල කෙතුමතීනම් රාජ ධානියෙහි මාසේම සුවවිඳින්නේය—වදුළේ මැනෝ.

'සඞ්ඛො නාමකො රාජා අනන්තබලවාහනො,
සත්තරතනසම්පන්නො චක්කවත්තී මහබ්බලො' යි.

ශාරිපුත්‍රස්ථවිරය, ඒ මෛත්‍රීනම් බුදුහු පෙර මුහුණිනම් බුදුකෙනෙකුන් සමයෙහි ප්‍රභාවත්නම් චක්‍රවර්තිරජව මාසේම අෂ්ටාඞ්ගධර්මයෙන් යෙදී ප්‍රාර්ථනාභිනිහාරයිලදින් එතැන්පටන් සොළසාසංඛ්‍ය කප්ලක්ෂයක් පෙරුම්පුරා එදතුරෙහි බුදුවූ දහසක් බුදුන් අභින් මාසේම විවරණලදින් කෙළවර වෙස්සන්තරාත්මභාවයෙන් චුතව තුසිතපුරයෙහි ඉපිද එතැන්පටන් මේ බුද්ධාන්තරය මුළුල්ලෙහි දිව්‍ය විඳ එකල දසදහසක් සක්වල දිව්‍යබ්‍රහ්මයන්ගේ ආරාධනාව ඉවසා පස්බැළුම්බලා බ්‍රාහ්මණවංශය උතුම්සේ දැක; මෛත්‍රී බුදුහු කේතුමතීනම් රාජධානියෙහි සංඛනම් චක්‍රවර්ති රජ්ජුරුවන්ට අග්‍රපුරෝහිතවූ සුබ්‍රහ්මනම් බමුණු උතුමානන්ගේ බ්‍රහ්මවතීනම් බැමිණිදේවින්ගේ කුසපිළිසිඳ දසමස්පුරා වැස දසදහසක් සක්වළ දෙව්බඹුන් මධ්‍යයෙහි මෛත්‍රීපිඩක්සේ මහාබ්‍රහ්මයා අතට බිහිව අජිතනම් කුමාරයකි ප්‍රසිද්ධව තරුපිරිවැරූ පුන්සඳක්සේ දෙලොස් දෙලොස් ගව් උසඇති සිරිවඩ්ඪමානවකය, සිද්ධාර්ථකය. චන්ද්‍රකය යන නම් ඇතිව සත්රුවන්මය තුන්සෘතුවට සුදුසුවූ තුන් ප්‍රාසාදයෙක්වෙයි එකි එකි ප්‍රාසාදයෙන් සත් සත් මහල එකි එකී මහලයෙහි ලක්ෂයක් කුළුගෙවල එකි එකී ප්‍රාසාදයට සත් සත් රුවන් පවුරුය සත් සත් රුවන් වහල තුන්ප්‍රාසාදයෙහිම පසඟතුරු රැව් විහිදුවන රන්රසුඳැල් එල්වා තිබෙයි මුදුනෙහි සත්රුවන්මය ධ්වජනගාතිබෙයි ඒ ධ්වජ කකුල්වල බඳිනාලද රන්මිනි ඝොෂාවෙන් නුවර එකනින්නාදවෙයි ඒ ප්‍රාසාදයන් තුන්දෙනාගේම භිත්තිවල සත්රුවන්මයවූ තාල පන්තිය, මකර පන්තිය, ව්‍යාඝ්‍රපන්තිය, හස්තිපන්තිය, අශ්වපන්තිය, රථ පන්තිය, මයුරපන්තිය, හංසපන්තිය යනාදීන් නිර්මිත කර්මාන්තයෙන් සෝභාමානව දවස්පතා මල්වැසිවස්නේ, එකි එකී මාලෙක සත්සියයක් රුවන් ගබඩාය, සත්සියයක් සිංහාසනය, සත්සියයක් සේසතය, සත්සියයක් යහනය, එකිඑකී යහන පිරිවරා ඡද්දන්තනම් හස්තිරාජයා පිරිවරා සත්දහසක් මඟලහස්තිහු සැරහිසිටිති, වලාහක අශ්වරාජයා ප්‍රමුඛවූ සත්දහසක් අශ්වරාජයෝ සැරහිසිටිති, සත්රුවන්ධ්වජනැඟූ හිරමඬලවැනිවූ සත්සියයක් සත්සියයක් රථපන්ති සරහා තිබෙයි; එකි එකී මාලෙහි සත්දහසක් නාටකස්ත්‍රීහු සැරහිසිටිති, මෙසේ මහත්වූ ශ්‍රී විභූතීන් ඒ මෛත්‍රීනම් බෝධිසත්වයෝ මෙසේවූ තුන්ප්‍රාසාදයෙහි තුන්සෘතුයෙහි සත්දහසක් නාටකස්ත්‍රීහු සැරහී වෙසෙති සංඛනම් චක්‍රවර්ති රජ්ජුරුවන් ආදීවූ දඹදිව සුවාසූදහසක් රජදරුවෝ මගුල්කඩු ගෙණ බෝසතුන් කරා අවුදින් හිමි නුඹට සේවය කරම්හයි කියති, මාගේ පිරිස බෝව තොපතොපගේම රාජශ්‍රී විඳුවයි

සත්වන්නාහ; කැටිව දෙව්ලොවසිට අවුදින් එකදළපත් අටලොස්කෙළක් අමාත්‍යයෝ නිතරම ඒ බෝධිසත්වයන්ට ආරක්ෂාගෙණ සිටිති.

මෙසේ අජිතනම් මෛත්‍රී බෝසතාණෝ බුදුබුබයකිනුන් කියා නිමවාගතනොහැක්කාවූ මහත්වූ ශ්‍රී සම්පත්විඳ අටදහසක් අවුරුදු ගිහිගෙයි වැස තුන්පූර් නිමිත්ත දැක සසර කලකිරී සතරවැනිව දෙවියන් මවාපෑ නවුස්වෙස්දැක මහණවනුකැමතිව චන්‍ද්‍රමුඛිනම් අගමෙහෙසුන් දේවින් බ්‍රහ්මවර්ධනනම් පුත්රුවන වැදූද මහණවෙම් සිතා එකෙණෙහි එම රුවන්පායෙහි මතුමහල්තෙලෙහි පලක්බැඳ හිඳ සත් දවසක් දුස්කරක්‍රියා පුරන්නාහුය; ඒ වේලෙහි සංඛනම් චක්‍රවර්තිරජ්ජුරුවෝ සවාසූදහසක් රජදරුවන් හා සවාසූදහසක් බිසෝවරුන්හා පිරිවර පූජාභාණ්ඩගෙණ ප්‍රාසාදය සිසාරා ඒ සත්දවසම අරගෙණසිටින්නාහුය; මෙසේ සත්දවසක් දුස්කරක්‍රියා පුරා කිසිකෙනෙකුත් හා මුවෙන් නොබැණ කිසිකෙනෙකුත් හා මුහුන නොබලා දවස්යැවූකල්හිම බුදුන් බුදුවන වෙසහ මැදිපොහෝද මහාභිනික්මන් කෙරෙම් සිතූ ක්ෂණයෙහිම එරන්පාය සත්පවුරු සත්දොරවූ පිරිවරාසිටි මහසෙනග හා සමගින් ආකාශයට පැනනැගී බෝමඩල දිසාවට නික්මෙති; කැටිව මහණවනු කැමති සියලු සත්වයෝම සිටිතැනින් අහසටපැනනැගී පියුම්විලකට දිවන රාජහංස පෙලක්සේ යෙති; මෙසේ මහත්වූ පුණ්‍යප්‍රභාවයෙන් ගොස් රන්පෑය මහසෙනග හා බෝසතුන් ගෙණ බෝමැඩකරා බස්සී; එකණෙහි මගුල්කඩුවගෙණ විදුලිය පතක්සේ හයා කෙස්වැටියකපා ආකාශයට දමා මහබඹු දුන් සිවුරු පිළිගෙණ මහණවෙති චතුර්වේදයෙහි නිපුණ බ්‍රාහ්මණයෝ සවාසූදහසක් එමවිටම මහණවෙති; මේ ශාසනයෙහි පින්කල ඉසිදත්තය, පුරාණයයි යන දෙබෑ කෙනෙක් සවාසූදහසක් පතිත්ගෙණ මහණවෙති, තවද ජිතය, මිත්‍රය යන මහා පණ්ඩිතවරු දෙදෙනෙක් සවාසූදහසක් සවාසූදහසක් පතිත්ගෙණ මහණවෙති, තවද මේ ශාසනයෙහි පින්කල සිඩාඪිනම් සිටාන කෙනෙක් සුඩානම් සිටුදියනිකෙණෙක් සුවාසූදහසක් පුරුෂ ස්ත්‍රීන් හා සමග මහනවෙති, තවද මේ ශාසනයෙහි පින්කල සංඝනම් උපාසක කෙනෙක් හා සංඝනම් උපාසිකාකෙණෙක් සුවාසූදහසක්; පුරුෂ ස්ත්‍රීන් හා සමග මහණවෙති, තවද මේ ශාසනයෙහි යසවතීය, විසාඛාය යන යෙහෙලිනියෝ දෙදෙනෙක් සවාසූදහසක් ස්ත්‍රීන් හා සමග මහණවෙති; අවශෙෂ රජ බමුණු වෙළඳ ගොවි ලක්ෂගණන් මහණවෙති; ඉක්බින්තෙන් බෝධිසත්වයෝ මහණවෙලා එම චන්‍ද්‍රමුඛිනම් බ්‍රාහ්මණ දේවින් දුන් කිරිපිඬු වලඳා එමදා සවස අපරාජිත ස්ථානයෙහි පැනනැගී විදුරසුන් නැගී නාගශ්‍රිබෝධියට පිටලා හිඳිනාහුය, ඒ නාගශ්‍රීබෝධියනම් රිදීකඳක්සේ සුදුව වටවූ කඳ එක්සිය

විසිරියන් උසය මූලපටන් අගදක්වා දෙසියසතලිස්රියන් උසය,
පූර්ව ශාඛාග්‍රය පටන් පශ්චිම ශාඛාග්‍රය දක්වා දෙසිය සතලිස්රියන්
උසය, උත්තර සාඛාග්‍රයෙහිපටන් දක්‍ෂිණ සාඛාග්‍රයට දෙසිය සතලිස්
රියනය, සාඛාමණ්ඩලය වටින් සත්විසිරියනය, ඉඳුනිල්මිනිසතක්සේ
හැමකල්හිම ශොභාමත්ව තිබෙයි, ඒ නාගබෝධියෙහි විසලි වැශි
රෙණ පතෙක්වත් පරඬලාවත් පැහැවන පතෙක්වත්නැත, මුහුකළ
පත් ඉන්ද්‍රනීල මාණික්‍යමයවූ අසුඅස්සෙහි ලියහා අකුරු ප්‍රවාලමය
එකෙණෙහි නාගබෝධිය මුලපටන් අගදක්වා මලින්සැදී සිටිනේය,
දෙලොස්නැලියක් පමණ නගන්නා කැකුළු වෙයි, පිපි මල් මහ
ගැල් සකක් පමණ වෙයි, එකිඑකි මලෙහි නැලියක් පමණ රේණු
වෙයි, එද පිපිමල් අසූදහසක් අවුරුදු පරනොවී තිබෙයි, ඒ බුදුන්
ගේ පරිනිර්වාණයෙහි හා සමග හැම මල් පරව නටුවෙන් ගිලී පෙත්
තකුත් බිමනොහී ආකාශයෙන් ගොස් දරසෑයෙහි වැගිර බුදුන් හා
සමග ආදහනවෙයි, තවද බෝමැඩ සිසාරා වටින් දෙගවු දෙගවු
පමණ තැන් සත්රුවන් වැලි ඇතිව තිබෙයි, ඒ වට සත්රුවන්මය
පවුරෙක් වෙයි, එයින් පිටත වට දෙලොස් දෙලොස් ගවු පමණ
තැන් නන්විසිතුරුවූ සුවඳ මල්ගස් සමූහයෝ හැමදෙනම ඒ නාග
බෝධියට වැඳුම්කොට ඒකපාතියෙන් සිටිනාහුය, මෙසේ ඒ මෛත්‍රී
බුදුහු තමන් සොළසාසංඛෙය්‍ය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි උග්‍රව පිරූ
පාරමිතාවන්ගේ මහිමයෙන්ම ලබනලද මෙබඳුවූ නාගශ්‍රීබෝධියට
පිටලා අටපණස්රියන් විදුරසුන් නැගී චතුරාංගවීර්‍ය්‍යාධිෂ්ඨානයෙන්
දසදහසක් සක්වල දෙවිබඹුන්ගේ පූජා විඳවිඳ හිඳිනාහුය; එකෙ
ණෙහි වසවර්තිමාරයා මහත්වූ මරසෙන් ගෙණ ඔහු අද බුදුවිය
නොදී කකුල්දෙක ගෙන පරසක්වල ගසමි කිපී දිවඅවුත් සක්වල
ගල මුවවිට සිට ඒ මෛත්‍රීබුදුන්ගේ මෛත්‍රීපිඬක් බඳුවූ ශ්‍රීමුඛය දැක
ලන්විය නොහී භයින් වෙවුලා පැරදපියයි මෙසේ මරසෙන්බිඳ එද
රෑ අළුයම් රාත්‍රියෙහි ලොවුතුරා බුදුව අනන්තාපර්‍ය්‍යන්තවූ මුළුලොව
බවුළුවන්ට පාපතරයන් දමනයකර බුදුරැස්විහිදුවති. තවද සාරිපු
ත්‍රස්ථවිරය ඒ මෛත්‍රීනම් බුදුහු අසොකය බ්‍රහ්මදෙවය යන අගසව්
වන් දෙදෙනෙකු හා සමග මහත්වූ ශ්‍රාවකයෝ ඇතියාහ; හැම දවස්
හිම දිවාරාත්‍රියෙහි පස්විසියොදුනෙක පවත්නා ව්‍යාමප්‍රභාමණ්ඩල
ඇතියාහ; තවද ඒ මෛත්‍රීබුදුන්ගේ බුද්ධකය අටඅසූරියන් උසය
ශ්‍රීපාදයෙහි පටන් දනමඬලට දෙවිසිරියන් උසය දනමඬලෙහි
පටන් නාභිමණ්ඩලයට දෙවිසිරියන් උසය, නාභිමණ්ඩලයෙහි පටන්
අකුධාතුවට දෙවිසිරියන් උසය, අකුධාතුවෙහි පටන් සිරො
ධාතුවට දෙවිසිරියන් උසය, දකුණු උරමණ්ඩලෙහි පටන් වම් උර
මණ්ඩලයට පස්විසිරියන් පළලය; විදුලි දෙකක්වන් කන්පටදෙක

සත්සත්රියනය, එකීඑකීඇස දිග පස්පස්රියනය, දේදුනුදෙකක්වන් බැමසගල පස්පස් රියනය; දෙබැමඅතුර පස්රියනය; නාසිකාව සත් රියනය; සුරක්තවූ තොල්සගල පස්පස් රියනය; සුරක්තවූ දිව දස රියනය; සිරෝධාතුවෙහි වට පස්විසි රියනය; රන්වන්වූ ශ්‍රීමුඛමඬලය පස්විසිරියන් වටය, රන්මිහිගක්සේ වටවූ ග්‍රීවාධාතුව පස්රියන් උසය; රන්වන්වූ ශ්‍රීහස්ත දෙක හතලිස් හතලිස් රියනය, එකී එකී අතුල් පස්පස්රියනය; ශ්‍රීපාදදෙක තෙලෙස් රියන් එක්වියත් සාඟුල් පමණ දිගඇත්තේය; මෙසේ ශ්‍රීමත්වූ බුඩකයකින් යුක්තව දම්සක් පැවතුන් සූත්‍ර දෙශනාදී අප්‍රමාණ ධර්මදේශනාකොට සියලු සත්‍වයන් සංසාර සාගරයෙන් ගොඩනගා ඒ මෛත්‍රි බුදුන් අසූදහසක් අවුරුදු ආයුශ්‍රී වළඳා හිඳිනාහුය. එකල සංඛනම් චක්‍රවර්තී රජ්ජුරුවෝ තමන්ගේ පස්විසියොදුන් රන්පාය සංඝාරාමකොට බුදුන්ට දන්දී සියලු චක්‍රවර්තිරාජ්‍ය බුදුන්ට පුද පෙර තමන් දිඹුල්දණ්ඩෙහි ශෙය නගා සත්දවසක් වස්වසවා කල පින්බලයෙන් කැටිව පින්කළ සත්‍රිය හා සමග නවකෙළදහසක් අමාත්‍යයන් ගෙණ බුදුසසුන් වැද මහණව අමාමහ නිවන් දකින්නාහුය; ඒ මෛත්‍රි බුදුන් නොදක් කෝ කවිරුද? දක සසරින් ගැලවෙන්නෝ කවරුදයි යනහොත්? මවුන් මැරුවෝද, පියන් මැරුවෝද, රහතුන් මැරුවෝද, බුදුන් ඇඟින් ලේ සෙල්ලුවෝද, සංඝයා භෙදකළෝද යන මේ පඤ්චානන්තරිය කර්මය කළාවූ සත්වයෝ එනමෙතේ බුදුන් දක්ක නොහෙන්මය, දගැප්බිඳ බෝධිසාඛා කපා රන්පිළිම පොතුහෙලා බන පොත් සිඳබිඳ මේ පව්කිරීමද; ආනන්තරිය කර්මයට ඇතුළත්වන හෙයින් ඒ බුදුන් දක්ම නොහෙත්මය. සංඝයාවහන්සේට අක්‍රොශ පරිභව බිනුවාහුද, සිල්වතුන්වහන්සේට බොරුවෙන් වෛර ඉපද වූවාහුද, ධර්මයට අනාදර බිණූ සත්වයෝද යන මේ සියල්ලෝම ඒ බුදුන් දක්ම නොහෙත්මය; දන්වැට ගසාකෑවෝද කුසලාම් ගසාකෑවෝද බුදුන් සතුදෙය කෑවෝද ධර්මය සතුදෙය කෑවෝද සාංඝික දේ නැසුවෝද යන මේ සියල්ලෝම ඒ බුදුන් දක්ම නොහෙත්මය; මේ බුඩොත්පාදකාලයෙහි නපුරු මිථ්‍යාදෘෂ්ටි ගෙණ මේලොව පරලොව නැතුව ඇවිදින අසත්පුරුෂයෝ ඒ බුදුන් දක්ම නොහෙත්මය; හිරසඳ දෙවියන්ටද වැසිවලා දෙවියන්ටද දෙස්කළාවූ සත්වයෝ ඒ බුදුන් දක්ම නොහෙත්මය. නරනාදි තිරිසන් අසුර නිකාය යන තුන් අපායෙහි උපන්නාවූ සත්වයෝද ඒ බුදුන් දක ගැලවිය නොහෙත්මය. අරූතල අසඥතල පරසක්වල යනාදී තැන්වල උපන්නාවූ සත්වයෝද ඒ බුදුන් දක්ම නොහෙත්මය. තවද

බුද්ධොත්පාදයෙහි පස්පව් දස අකුසලෙන් දුරුව බණ අසා මෙලෝ පරලෝ දැන තමතමන්ගේ ශක්ති පමණින් දන්පින් කලෝ දකිති; තවද සිල්රක්‍ෂාකලෝ දකිති; බඹසර වස්රැක්කෝ දකිති; දාගැබ් දාකරඹු කරවූවෝ දකිති; බෝධි පිහිටුවෝ දකිති; පුෂ්පාරාම ඵලාරාම කරවූවෝ දකිති; ඒදඬුලෑවුවෝ දකිති; අම්බලම් කරවූවෝ දකිති; මංමාවත් හෙලිකලෝ දකිති; ගොනාවුකඳ කරවූවෝ දකිති; ලිත් පැන්පොකුණු කරවූවෝ දකිති, නටබුන් වෙහෙර කරවූවෝ දකිති; බණ කියා ලෝවැඩ කලෝ දකිති; බණ කිවූවෝ දකිති; ධර්මාසන කරවූවෝ දකිති; ධර්මශාලාවෙහි වියන් බැන්දෝ දකිති; බණ පොත් ලියවා ඒ පොතේ අකුරු ගණනේ චක්‍රවර්ති සම්පත් ආදිවූ බොහෝ සැපත් ලදින් සුවවිඳ එනමෙනේ බුදුන් දැක නිවන් දකිත්මය; කබලි දණ්ඩාගන බණවසුන් ලැවූවෝ දකිති; ධර්මකථිකයන්ගේ පා සේදෙව්වෝද උපචාරකොට සත්කාරයෙන් වඩා ගෙණාවෝ දකිත්මය; බණ කියනකල සාධුකාර දුන්නෝ දකිත්මය; බණ අසන්ට අඬගැසුවෝ දකිත්මය; වටාපත් දුන්නෝ දකිත්මය; වටාපත් අතට ඔසවාදුන්නෝ දකිත්මය; ධර්මාශනයෙහි මල්සුවඳ පිදුවෝ දකිත්මය; වස්ත්‍රාභරණ පිදුවෝ දකිත්මය; බණකියන ගෙයි පහන් ලැවූවෝ දකිත්මය; සියල්ලම නිමවා බණ පැවැත්වූවෝ දකිත්මය; ගිලනුන්ට අත්පා මෙහෙකලෝ දකිත්මය; අවාසකරවා දන්දුන්නෝ දකිත්මය; චීවර පිණ්ඩපාත සේනාසන ගිලානාදි දුන්නෝ දකිත්මය; ලාබත් පෝබත් අවදිබත් දුන්නෝ දකිත්මය; මව්පියන්ට අත්පා මෙහෙකලෝ දකිත්මය; යටත් වශයෙන් එකමලක් එකපහණක් එක බත්කෙනෙස්සක් දන්දී වේවයි තුනුරුවන් කෙරෙහි සිත් පහදවා යම්කෙනෙක් මෛත්‍රිබුදුන් දකුම්හයි කියා මාගේ බුද්ධොත්පාදකාලයෙහි ප්‍රාර්ථනාකලාහු විනම්, සාරිපුත්‍රස්ථවිරය ඔහු මතු මෛතේ බුදුන් දැක සංසාර සාගරයෙන් ගැලවෙන්නාහුමයයි මේ අනාගතවංශදෙශනාව නිමවා වදාළසේක.

මෙසේ මාගේ ස්වාමිදරුවෝ තමන් නොවඳිම්හයි මානකල ඥාති ගණයා මධ්‍යයෙහි ආකාශයට පැනනැගී ඒ රුවන් සක්මනදී මහත්වූ යමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වා දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේගේ ආරාධනාවෙන් අනාගතවංශදේශනාව නිමවා නෑයන්ගේ මින්බිඳ ආකාශයෙන් බස්නා පුන්සඳමඬලක්සේ බැස පළමුව වැඩ

උන් බුඩ්ඩාශනයෙහිම පෙණීගියසේකැයි ආශ්චර්‍ය්‍යයි දුටු සුඩොදන
රජ්ජුරුවෝ පුතනුවන්වහන්සේගේ ශ්‍රීපාදමූලටගොස් දෙගොත් මුදු
නෙහි තබාගෙණ සන්තෝෂයෙන් දෙනුවන් තෙමතෙමා ස්වාමිනි
මාගේ බුදුරජානෙනි, මාගේ සිඬාර්ථකුමාරයෙනි, මාගේ පුතනුවන්ව
හන්ස, පුත්‍රව්‍යඤ්ජනයෙන් ලොවට වැඩපිණිස මාගේ ගෙයි උපන්
මාගේ පියානන්වහන්ස, අදපටන් නුඹ මට දරුනොව දූන් නුඹගේ
දරුවෙමි; එසේහෙයින් මාසේවූ නුඹගේ දසයකුත් නොවටිනා හීනවූ
පියක්හට මෙබඳුවූ ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වා මුළුලොව වෙව්ලවා කුමක්
පිණිස දුක්ගෙණ වදාළසේක්ද? මම නුඹවහන්සේ උපන්දා කාලදෙ
වල නම් රුසින්ගේ නලලමැද නුඹවහන්සේගේ තෙල ශ්‍රීපතුල්
දෙක නලල්හි පෙණීගියද ප්‍රාතිහාර්‍ය්‍යය දැක සතුටුවවම එදද මම මේ
දෙපතුලේ නලලතබා වැන්දෙමි මේ මාගේ පළමුවන වැඳීමය; තවද
නුඹවහන්සේ පස්මැසි කල වප්මගුල් කරණද දඹගස මුලදී කළාවූ
ප්‍රාතිහාර්‍ය්‍යය දැක සතුටුව එදද මේ ශ්‍රීපතුල්දෙක වැන්දෙමි ඒ
මාගේ දෙවෙනි වැඳීමය; අද මා වැනියකුත් තබා දිව්‍යබ්‍රහ්මයෙකුත්
නුදුටු නොඇසූ මෙබඳු ප්‍රාතිහාර්‍ය්‍යය දැක රාජ්‍යය පුදපියම් නම් ඒ
නුඹවහන්සේ අළුයමදුටු කෙලපිඩක්සේ පිළිකුල්කොට හැරපියා රජ
උව ජීවිතය පුදපියම්නම් තවත් නුඹවහන්සේගේ බුඩශ්‍රී වඩාවඩා
දක්නා ලෝභය මාගේ බොහෝසෙයිනුත් ඒ ජීවත්වූ පූජාව නුඹ
නොඉවසන සෙයිනුත් ජීවිතයත් පුදපිය නොහෙමි යනාදීන් කිය
කියා බුදුන්ගේ ශ්‍රීපාදදෙක ඉස්මුදුනෙහි තබාගෙණ මේ තුන්වෙනි
වැඳීමයයි කිය කියා සුඩොදන රජ්ජුරුවෝ සිටගහනොයී මුලින්
සිඳහෙළූ කනකරුපයක්සේ බුදුන් පාපිටම වැද පෙරලී ගියාහ; එක
රජකුත් බුදුන් නොවැඳ සිටිනට සමර්ථනූවූයේය, හැම ශාක්‍යයන්
ගේ මානය සුලන්දුටු වලාකඩක්සේ සිඳීගියේය. ඉක්බිත්තෙන්
ස්වාමිදරුවෝ ඥාතිසමාගමයෙහි යමකප්‍රාතිහාර්‍ය්‍යය දුටු දස දහසක්
සක්වල දිව්‍යබ්‍රහ්මරාජයන් කළාවූ දෙලක්ෂ සතලිස් දහසක් නමස්
කාර පූජාය, ශාක්‍යරජදරුවෝ කළ එක්ලක්ෂ සැටදහසක් නමස්කා
රපූජාය, ශක්‍රයාකල පුෂ්පාපුෂ්පාකාර වර්‍ෂානම් පූජාය, විසිදහසක්
මහරහතුන් විසින් කරණ ප්‍රතිපත්ති පූජායයි මෙසේ සාරලක්ෂ විසි
දහසක් එකතුව මහපූජාවක් ලන්හෙයිනුත් මෙසේවූ වික්‍රමයෙන්

පූජාවිඳීමට සුදුසු හෙයිනුත් ශාක්‍යකුල සිංහවූ ශාක්‍යකුල තිලකවූ ශාක්‍යකුල ධවලච්ඡත්‍රවූ ශාක්‍යකුලකෙතුවූ ශාක්‍යකුල ක්‍රීඩාවූ ශාක්‍ය කුල මාණික්‍යවූ ශාක්‍යකුල කල්පද්‍රැමවූ ශාක්‍යකුල මහා නිධානවූ ශාක්‍යකුල ප්‍රදීපායමාණවූ මාගේ ස්වාමිදරුවූ බුද්ධරාජානන්වහන්සේ අභිනිෂ්ක්‍රමණ කළසේක.

මෛත්‍රීවර්ණනාම නිමි.

# පරංජසදීපනිය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස.**

බුද්ධං තිලොකතිලකං ජිතපඤ්චමාරං
ධම්මං සුදුල්ලභතරං මුනිනා පණීතං
සංඝඤ්ච සුප්පටිපදාදි ගුණෙහුපෙතං
නිච්චං නමාමි සිරසා සරණං අනග්ඝං.

සම්මාභිවාදීයපසන්නමනොභිවන්ද්‍යං
සබ්බූපසග්ග විහතො ජනතංහිතාය
සඞ්ඛවාදිතො තරුණියා කරුණාය සම්මා
වක්ඛාමහං භජ පරංජසදීපනිං භො.

මෙමසේ දසපෙරුම් පුරා පස්මරුන් මරා විදුරසුන් අරා ලොව්තුරා බුදුවූ තුන්ලෝ වාසීන්ගේ නලල්තෙලෙහි ඇඳි තිලකයක් බඳුවූ අනල්පකල්පොපචිත පුණ්‍යසම්භාරයෙන් ජනිත, දෙතිස්මහාවර පුරුෂ ලක්ෂණයෙන් හා, අසූඅනුව්‍යංජන ලක්ෂණයෙන් විරාජමානවූ, අප සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේද, එම බුදුරජානන්වහන්සේ විසින් දෙශනාකරවදාරණලද අතිදුර්ලභවූ මධුරතර ශ්‍රී සද්ධර්මයද, සුප්‍රතිපන්නතාදී සාධුගුණොපෙත අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සංඝයාද, යන අනර්ඝ රත්නත්‍රයට කායාදිවාරත්‍රයෙන් සකසා වැඳ ඒ ගෞරවය කරණකොටගෙණ නසනලද සියලු උපද්‍රව ඇතියෙමි; ලක්දිව් වැසියන් කෙරෙහි පතලාවූ කරුණා නැමැති තරුණිය විසින් චොදනාකරණලදුව ලඞ්කාවිප වාසීන්ට වැඩපිණිස "පරංජසදීපනී" නම් ප්‍රකරණයක් හෙවත් නිවණට පැමිණියහැකි මාර්ගය ප්‍රකාශ ප්‍රකරණයක් පාලිභාෂාව සිංහලට නගා සිංහලජනයන්ට සුවසේ තේරුම්ගතපරිද්දෙන් මනාකොට කියන්නෙමි.—

එඹා පින්වත් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයෙනි, මේ ප්‍රකරණය රැගෙණ සෙවනයකරව් හෙවත් භාවිතාකරව්යයි මෙහි පූර්වාරම්භ කාව්‍යයෙන් මේපොත කරන්නාවූ මාගේ අදහස දැක්වූයේය—මේපොත භාවිතාකිරීමෙන් ඔවුනොවුන්ට ලැබෙන ප්‍රයොජන කිමයත්? ධූතාඞ්ගයන් සමාදන්ව රක්ෂානොකළවූන්ට නිවන් නොලැබෙන්නේය, ධූතාඞ්ගයන් රක්ෂාකළවූන්ට නිවන් ලැබෙන්නේයයිද, කායගතා

සතියයි කියනලද පිළිකුල්භාවනාව භාවිතා නොකරන්නවුන්ට නිවන් නොලැබෙන්නේයයි, පිළිකුල් භාවනාව භාවිතාකරන්නවුන්ට නිවන් ලැබෙන්නේයයිද, අපබුදුරජානන්වහන්සේ විසින් මේ දෙකාරණයම වදාරණලද්දේය, එබැවින් මේපොත රැගෙණ කියවන්නාවූ බලන්නාවූ මනාකොට මෙනෙහිකරන්නාවූ ජනයෝ නුවනින් මෙහෙයා කල්පනාකොට මෙහි දක්වනලද ධූතාගයන්ද රක්ෂාකෙරෙමින් පිළිකුල්භාවනාවද භාවිතාකිරීමෙන් පරමරමනීයවූ නිවන්පුරයට පැමිණ උතුන්වූ නිවින් සිරිසැප විඳින්ට උත්සාහ කෙරෙත්මැයි, මේ මෙහි ප්‍රයොජනයනම් වන්නේය—තමතමන්ට වැඩකැමති එඹා පින්වත් ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයිනි, ධූතාගයන් සමාදන්ව නොරක්කවුන්ටද, “අත්‍ථි, ඉමස්මිං, කායෙ, කෙසා” යනාදීන් ප්‍රකාශිත පිළිකුල්භාවනාව භාවිතා නොකරන්නවුන්ටද නිවන් නොලැබෙන්නේය; ධූතාගයන් රක්ෂාකළවුන්ට හා පිළිකුල් භාවනාව භාවිතාකරන්නවුන්ට නිවන් ලැබෙන්නේයයි අපබුදුරජානන්වහන්සේ විසින් මනාකොට සවිරව මේ දෙකොටසම දෙසනාකරවදාළ බැවින් අති දුකඛිතවූ දිළින්දෙකුවිසින් මහානර්‍ඝ රත්න නිධානයක් ලද්දක්මෙන් මහත්ප්‍රීතියෙන් මේ පොත රැගෙණ මෙහි දක්වනලද ධූතාගයන්ද අත්‍යාදර ගෞරවයෙන් සමාදන්ව රක්ෂා කෙරෙමින් පිළිකුල්භාවනාවද භාවිතාකිරීමෙන් ඒ හෙතුව කරණ කොටගෙණ සසර දුකින්මිදී ජරාමරණාදි කිසි උපද්‍රවයක්නැති ඒකාන්ත සුන්දරතර උතුම් සැපඇති නිවන්පුර වැද මොක්සිරිසුව විඳිනට උත්සාහ කරව්.

‘චත්තාරො භාසිතො බුද්ධ භාසිතො සාවකභාසිතො
අථොපි දෙවභාසිතො ඉසිනඤ්චාපි භාසිතො’ යි.

යනු, හෙයින් බුඩ්භාසිතය, ශ්‍රාවකභාසිතය, දේවභාසිතය, සෘෂිභාසිතයයි කියා භාසිත සතරෙක් වෙත්, හෙවත් සර්‍වඥතාඥනයට පැමිණි බුදුවරයෝය, සිව්පිළිසිඹියාපත් රහත්භාවයට පැමිණි ශ්‍රාවකයෝය, දෙවියෝය, සෘෂිවරයෝය යන මේ සතර දෙනාගේ දෙශනා සතරෙක් වන්නාහුය; එහි මාගේ ස්වාමිදරුවූ ලොව්තුරා බුදුරජානන්වහන්සේ විසින් දෙශනාකරවදාරනලද ත්‍රිපිටකධර්‍මදේශනාව බුඩ්භාසිතයනම් වන්නේය, සැරියුත් තෙරුන්වහන්සේ ආදි සිව්පිළිසිඹියාපත් රහතන්වහන්සේලා විසින් දෙශනාකරණලද අනගනසූත්‍රය, සම්මාදිට්ඨිකසූත්‍රය, මහාවෙදල්ලසූත්‍රය, චුල්ලවෙදල්ල සූත්‍රය, අනුමානසූත්‍රය ආදී පිටකත්‍ර ධර්‍මයටම ඇතුළත් සූත්‍රදෙශනාව ශ්‍රාවකභාසිතය නම් වන්නේය; දේවතාසංයුත්ත දේවපුත්තසංයුත්තාදියෙහි දෙවියන්විසින් කියනලද ආදිය දේවභාසිතයනම් වන්

ණෝය; ඍෂීන් විසින් කියනලද සියල්ලම ඍෂිභාෂිතය නම් වන්නේය; මෙහි දේවභාසිතයෙහි හා ඍෂිභාසිතයෙහිද ගතයුතු නොගතයුතු දෙකොටසම ඇතිවන්නේය; බුඬභාසිතයෙහි හා ශ්‍රාවකභාසිතයෙහි කිසිත් හැරදැමියයුත්තක් නැත්තේය; සියල්ල එලෙසටම ගතයුතු වන්නේමැයි. ලෝකස්වාමිවූ අපබුදුරජානන්වහන්සේ පිරිනිවී තැන් පටන් පන්සියයක් අවුරුදු ඉකුත්වගියකල දඹදිව සාගල නම් නුවර රජකළ මිලිඳු මහරජානන්ගේ සියලු වාදයන් සිඳබිඳ හැර ජයගත් නාගසෙන ස්ථවිරයන්වහන්සේද සිව්පිළිසිඹියාපත් රහත් කෙනෙක් බැවින් උන්වහන්සේ විසින් වදාරණලද සියල්ලම අන්‍යආකාරයක් නොවන්නේය, සියල්ලන්විසින් එලෙසටම පිළිගතයුතු වන්නේමැයි. තවද අප බුදුරජානන්වහන්සේ විසින් යම්සේ මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන්වහන්සේ දක්නා ලද්දේද, එමෙන්ම මේ නාගසේන ස්ථවිරයන්වහන්සේ හා මිලිඳුමහරජානෝද දක්නාලද්දාහුය, හේ කෙසේදයත්? මාගේ පරිනිර්වාණයෙහි පටන් අවුරුදු පන්සියයක් ඉක්ම ගියකල නාගසේන යන තෙරකෙනෙක් හා මිළිඳුය, යන රජෙක් උපදින්නාහුය; මාවිසින් ඉතා සියුම්වශයෙන් දෙශනා කරණලද යම් ධර්මවිනයෙක් ඇත්තේද, එයින් මිලිඳු මහරජානන් විසින් විචාරණලද සියලු සියුම්වූ අඹිවත් ප්‍රශ්නයන් මේ නාගසේනයන් විසින් උපමාවශයෙන් යුක්තිවශයෙන් කාරණාවශයෙන් අවුල්හැර විභජනය කරන්නේයයි අප බුදුන් විසින් වදාරණයෙහි සිට දෙශනාකල බැවින් ඒ නාගසෙන ස්ථවිරයන්වහන්සේ විසින් මිලිඳු මහරජානන්ගේ වාද මර්දනය කරණුසඳහා මිලිඳු ප්‍රශ්නයෙහි වදාරණලද සියල්ලම ශ්‍රාවකභාසිතය නොව බුඬභාසිතය වන්නේමයයි කිසිත් සැකයක්නොකොටම නිශ්චලයට යායුතු. එක් සමයෙක්හි පරවාදීන් නැමති හස්තීන්ගේ කුම්භය පැලීමට කෙසරසිංහරාජයෙකු වැනිවූ නාගසේන ස්ථවිරයන්වහන්සේ අසූදහසක් ශ්‍රමණ සමූහයා විසින් පිරිවරණලදුව දඹදිව සාගලනම් නුවර සංඛෙය්‍යනම් විහාරයෙහි වැඩවාසයකර වදාරණසේක; එකල්හි මිලිඳුමහරජානෝ නාගසෙන ස්ථවිරයන්වහන්සේ කරා එළඹ ප්‍රශ්න විචාරමින් තමන්සිතළපත් සැක ඒතාක් දුරුකොට වාසය කරණසේක්, එක්දිනයෙක තමන්ගේ රාජභවනයෙහි ශ්‍රීයහන් මස්තකයෙහි වැදහෙව තමන් නාගසේනස්ථවිරයන්වහන්සේහෙන් විචාලතාක් අභිධර්මයන් මෙනෙහිකරත්; සර්වඥශාසනය නිර්මලසේකැයි, ප්‍රීතියෙන් පිනා නැවතත් ප්‍රඥාවෙන් විමසන්නේ තෙලෙස්ධුතාංග ගුණයටබැස වනාන්තරයෙහි වාසයකරණ භික්ෂූන් දුටුයේය; නැවත සෝවාන්, සකෘදාගාමි, අනාගාමි ඵලයට පැමිණිසාවූ ගෘහස්ථයන් දුටුයේය. ඒ දෙපක්ෂය බලා, ඉදින් ගිහිගෙයි

ගිහියෝව සිටිත් මාර්ගඵල ධර්මය අවබෝධකරන්නේවීනම් දුෂ්කරවූ තෙලෙස් ධුතාංගය නිෂ්ඵල වන්නේයයි කියා ඒ මිලිඳු මහරජහට මහත් කුකුසෙක් ඉපිද පරවාදමර්දනයට සමර්ථවූ පිටකත්‍රයෙහි අභිදක්ෂවූ නාගසේන ස්ථවිරයන්වහන්සේගෙන් විචාරා මේ සැකය දුරුකරන්නෙමියි සිතුයේය; එහෙයින් කියනලදී.

'පස්සතාරඤ්ඤකෙ භික්ඛු අජ්ඣොගාළ්හ ධුතෙගුණෙ
පුන පස්සති ගිහිරාජා අනාගාමි ඵලෙ ඨිතෙ.
උභොපි තෙ විලොකෙත්වා උප්පජ්ජි සංසයො මහා
බුජ්ඣෙය්‍ය චෙ ගිහී ධම්මෙ ධුතඞ්ගං නිප්ඵලං සියා.
පරවාදි වාද මථනං නිපුණං පිටකත්තයෙ
හන්ද පුච්ඡෙ කථී සෙට්ඨං සො මෙ කඞ්ඛං විනෙස්සති' යි.

ඉක්බිති මිලිඳු මහරජානෝ ආයුෂ්මත්වූ නාගසේන ස්ථවිරයන්වහන්සේ යම් තැනෙක වැඩවාසයකර වදාරණසේක්ද? එතනට එළඹ නාගසේන ස්ථවිරයන්වහන්සේට නමස්කාරකොට එකත්පසව හිඳ මෙසේ සැලකෙළේය; ස්වාමිනි නාගසේන ස්ථවිරයන්වහන්ස ගිහිගෙයි වාසයකෙරෙමින් පඤ්චකාම සේවනය කරන්නාවූ අඹුදරුවන් සමග ගැවී වාසයකරන්නාවූ සඳුන්සුවඳ ආදිය ඇඟගල්වන්නාවූ මල්පලඳින්නාවූ, රන්, රිදී, මසු, කහවණු, ගණු දෙණු කරන්නාවූ මුතු මැණික් ආදියෙන් විසිතුරුකළ ඔටුනු පලඳින්නාවූ යම්කිසි ගෘහස්ථයෙක් ඇත්තේද? ඒ ගෘහස්ථයා විසිනුත් පරමාර්ථවූ අමෘතමහා නිර්වාණය අවබෝධකරණ ලද්දේදැයි විචාළේය; එකල්හි නාගසේන ස්ථවිරයන්වහන්සේ මහරජානෙනි ගිහි භූමියෙහිම සිට නිවන් දුටුවාවූ සත්වයෝ එකසියයකුදු නොවන්නේය, දෙසියයකුදු නොවන්නේය, තුන්සියයකුදු නොවන්නේය, සාරසියයකුදු නොවන්නේය, පන්සියයකුදු නොවන්නේය, දහසකුදු නොවන්නේය, ලක්ෂයකුදු නොවන්නේය, සියක් කෝටියකුදු නොවන්නේය, කෝටිලක්ෂයකුදු නොවන්නේමැයි, මහරජානෙනි මේ ප්‍රශ්නයෙහි මාගේ ප්‍රඥාවෙන් බොහෝසේ කාරණා දක්විය යුතුවන්නේය, එහෙයින් මේ අර්ථය මනාකොට විභාග කරණලද වන්නේය, විසිතුරු කරණලද වන්නේය; පරිපූර්ණ කරණලද වන්නේය, සිතින් බුහුමන් කරණලද වන්නේය, මහරජානෙනි, යම්සේ දක්ෂවූ සුශික්ෂිත ලියන ආචාර්යයෙක් තමාගේ මිත්‍රාදීන්ට ලියමනක් යවනු කැමතිවූයේ ඔවුන්ට තමාගේ දක්ෂබව හඟවනු පිණිස තමාගේ ව්‍යක්ත ප්‍රඥාවෙන් නොයෙක් කාරණා දක්වීමෙන් කිසිත් අඩුවක් නැතිව ලියමන ලියා සම්පූර්ණ කරන්නේය. මහරජානෙනි, එපරිද්දෙන්ම මාගේද සියලු ආකාරයෙන් ව්‍යක්තවූ පැතිර පවත්නාවූ ප්‍රඥාවෙන්

මේ ප්‍රශ්නයෙහි නොයෙක් කාරණා දක්විය යුතුවන්නේය; එහෙයින් මේ අර්ථය මනාකොට විභාගකරණලද වන්නේය, විසිතුරු කරණලද වන්නේය; පරිපූර්ණකරණලද වන්නේය, සිහින් බුහුමන් කරණලද වන්නේය. මහරජානෙනි, සැවැත්නුවර අප ලොව්තුරා සර්වඥයන් වහන්සේගේ උපාසක උපාසිකාවූ පස්කෝටියක් පමණ සෝවාන් සකෘදාගාමි අනාගාමි ඵලයට පැමිණීමෙන් නිවන්දුටු ආර්‍ය්‍යශ්‍රාවකයෝ වාසයකරන්නාහුය; ඔවුන් අතුරෙන් තුන්ලක්‍ෂ පනස් සත්දහසක් දෙන අනාගාමි ඵලයෙහි පිහිටා නිවන් දුටුවෝය, මහරජානෙනි ඒ සියල්ලෝම පැවිද්දෝ නොව ගිහියෝ වන්නාහුමය. තවද මහරජානෙනි අප බුදුරජානන්වහන්සේ එම සැවැත්නුවර ගණ්ඩනම් වෘක්‍ෂමූලයෙහි වැඩහිඳ කරවදාළ යමකප්‍රාතිහාර්‍ය්‍යයෙහිද දෙවිමිනිසුන්ගෙන් විසිකෝටියක් නිවන් දුටුවාහුය; මහරජානෙනි, ඒ සියල්ලෝම පැවිදිවූවෝ නොව ගිහියෝම වන්නාහුය. තවද මහරජානෙනි අපබුදුරජානන් වහන්සේගේ මහාරාහුලොවාද සූත්‍රදෙශනායෙහිද, මහාමංගල සූත්‍රදෙශනායෙහිද, සමචිත්තපරියාය සූත්‍රදෙශනායෙහිද පරාභව සූත්‍රදෙශනායෙහිද, පුරාභෙද සූත්‍රදෙශනායෙහිද කලහවිවාද සූත්‍රදෙශනායෙහිද චූලබ්‍යූහ සූත්‍රදෙශනායෙහිද මහාබ්‍යූහ සූත්‍රදෙශනායෙහිද, තුවටක සූත්‍රදෙශනායෙහිද, සාරිපුත්‍රසූත්‍රදෙශනායෙහිද, මෙපමණැයි ගණනක් නැත්තාවූ දෙවිමිනිසුන් නිවන් දුටුවාහුය; මහරජානෙනි, ඒ සියල්ලෝම පැවිදිවූවෝ නොව ගෘහස්තයෝම වන්නාහුය. තවද මහරජානෙනි රජගහනුවර ලොව්තුරාබුදුන්ගේ උපාසක උපාසිකාවූ නිවනට පැමිණි ආර්‍ය්‍යශ්‍රාවකයෝ තුන්ලක්‍ෂ පනස්දහසෙක් වාසයකරන්නාහුය, ඒ සියල්ලෝම පැවිද්දෝ නොව ගිහියෝම වන්නාහුය තවද මහරජානෙනි අප බුදුරජානන්වහන්සේ විසින් එම රජගහනුවර ධනපාලනම් ඇතු දමනයකල දිනෙහි අනූකෝටියක් ප්‍රාණීහු නිර්වාණට පැමිණියාහුය; මහරජානෙනි ඒ සියල්ලෝම පැවිද්දෝනොව ගිහියෝම වන්නාහුය; තවද මහරජානෙනි අප බුදුරජානන්වහන්සේ මගදරට ගල්තලා මස්තකයෙහි පාසානක නම් දේවස්ථානයෙහි වැඩහිඳ අජිත නම් තව්සා ප්‍රධාන දහසදෙනෙක් තාපසයින් සහිත දොළොස් යොත්තක පැහිරසිටි පිරිසට පාරායනවර්ගයෙහි සූත්‍රදෙශනාව කළදිනෙහි තුදුස්කෙලක් ප්‍රාණීහු අමාමහ නිවන්දුටුවාහුය; මහරජානෙනි, ඒ සියල්ලෝම පැවිද්දෝ නොව ගිහියෝම වන්නාහුය; තවද මහරජානෙනි අපබුදුරජානන්වහන්සේ එම මගදරට වෙදියනම් පර්වතයෙහි ඉන්ද්‍රසාල ගුහායෙහි වැඩහිඳ සක්දෙව් රජහු ආදී දෙව්පිරිසට සක්කපඤ්හ සූත්‍රය දෙශනාකළ දිනයෙහි අසූකෙළක් පමණ දෙවියෝ නිවන් දුටුවාහුය; මහරජානෙනි ඒ සියල්ලෝම

පැවිද්දෙනොවූ ගිහියෝම වන්නාහුය; තවද මහරජානෙනි බරණැස් නුවර ඉසිපතනාරාමයෙහි වැඩහිඳ ප්‍රථමයෙන් කළ දම්සක්පැවතුන් සූත්‍රදෙශනායෙහිදී තුන් අසාංඛ්‍යයක් සත්වයෝ නිවන් දුටුවාහුය; එදුම දහඅටකෙළක් බ්‍රහ්මයෝ රහත්වූවාහුය; තවත් මෙතෙකැයි ගණනක් නැති දෙවියෝ නිවන්දුටුවාහුය; මහරජානෙනි, අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන්වහන්සේ හැර සෙසු සියල්ලෝම පැවිද්දෙනොව ගිහියෝම වන්නාහුය; තවද මහරජානෙනි අපබුදුරජානන්වහන්සේ තව්තිසාභවනයෙහි පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වැඩහිඳ කරවදාළ අභිධර්ම දෙශනායෙහිදී අසූකෙළක් පමණ දෙවියෝ නිවන් දුටුවාහුය; මහරජානෙනි ඒ සියල්ලෝම පැවිද්දෙ නොව ගිහියෝම වන්නාහුය; තවද මහරජානෙනි තව්තිසාදෙව්ලොවෙහිදී අභිධර්ම දෙශනාකොට සක්දෙව් රජහු විසින් මවනලද මැණික් හිනිමගින් මිනිස්ලොව සංකස්පුර දොරට අපබුදුන් වඩනාකල තමන්වහන්සේ දක්වා වදාළ පෙළහර දැක සතුටුවූ දෙව්මිනිසුන්ගෙන් තිස්කෙළක් සත්වයන් නිවන් දුටුවාහුය; මහරජානෙනි ඒ සියල්ලෝම පැවිද්දෙ නොව ගෘහස්ථයෝම වන්නාහුය; තවද මහරජානෙනි අපබුදුරජානන් වහන්සේ තමන්වහන්සේගේ ඤාතිසමූහයාවන ශාක්‍යරජුන් නිසා කපිලවස්තුපුරයට වැඩිය ගමනෙහි නිග්‍රොධාරාමයෙන් අහසට පැනනැගී රුවන්සක්මන වැඩහිඳ දෙශනාකළ බුද්ධවංශදෙශනායෙහි හා චර්‍ය්‍යාපිටක දෙශනායෙහිද මහා සමය සූත්‍රදෙශනායෙහිද මෙතෙකැයි ගණනක්නැති දෙව්මිනිසුන් නිවන් දුටුවාහුය; මහරජානෙනි ඒ සියල්ලෝම පැවිද්දෙ නොව ගිහියෝමවන්නාහුය; තවද මහරජානෙනි සුමන මාලාකාර සමාගමයෙහිද, ගරහදින්න සමාගමෙහිද, ආනන්ද සෙට්ඨිසමාගමෙහිද, ජම්බුකාජීවක සමාගමෙහිද, මණ්ඩුක දෙව්පුත්‍ර සමාගමෙහිද, මට්ඨකුණ්ඩලී දේවපුත්‍ර සමාගමෙහිද, සුලසා නම් වෛශ්‍යාවගේ මරණය ගැණ රැස්වූ සමාගමයෙහිද, සිරිමා නම් වෛශ්‍යාවගේ මරණය ගැණ රැස්වූ සමාගමයෙහිද, පෙසකාර දුහිතෘ සමාගමෙහිද, චූල සුභද්‍ර සමාගමෙහිද, සාකෙත බ්‍රාහ්මනයාගේ ආදාහනයට රැස්වූ සමාගමෙහිද, සුනාපරන්ත සමාගමෙහිද, "සබ්බදානං ධම්මදානං" යනාදීන් වදාළ ශක්‍රප්‍රශ්න සමාගමෙහිද, තිරෝකුඩ්ඩ සූත්‍රදෙශනා සමාගමෙහිද, රතනසූත්‍රදෙසනා සමාගමෙහිද යන මේ පසළොස් සමාගමෙහි අප බුදුන්ගේ ධර්මදෙශනාව අසා වෙනවෙනම සුවාසූදහස සුවාසූදහස බැගින් සත්වයෝ නිවන් දුටුවාහුය; මහරජානෙනි ඒ සියල්ලෝම පැවිද්දෙනොව ගිහියෝම වන්නාහුය. තවද මහරජානෙනි අප භාග්‍යවතුන්වහන්සේ යම්තාක්කල් ජීවමානව ලෝකයෙහි වැඩසිටි සේක්ද, ඒ තාක්කල් දඹදිව නානිමණ්ඩලාකාරයෙන් පිහිටි බෝධිමණ්ඩලය

වරින් තුන්සියයක් යොදුන් පමණ ඇති අන්තොමණ්ඩලයෙහිද සයසියයක් යොදුන් ඇති මධ්‍යමණ්ඩලයෙහිද, පශ්චිමදිග්භාගයෙහි ථූනනම් බමුණුගම පටන් පූර්වදිග්භාගයෙහි කජංගලානම් නියම්ගමෙහි පිහිටි මහ සල්රුක දක්වා තුන්සියයක් යොදුන් දිග ඇත්තාවූ දකුණුදිගින් සෙතකර්ණිකනම් නියම්ගම පටන් උතුරුදිසාවෙහි උසිරධ්වජනම් පර්වතය දක්වා දෙසියපනස් යොදුන් පළල ඇත්තාවූ නවසියයක් යොදුන් වට ඇත්තාවූ මහාමණ්ඩලයෙහිද යනමේ බුද්ධප්‍රත්‍යෙක බුද්ධ ආග්‍රශ්‍රාවක. චක්‍රවර්තීන්ගේ උත්පත්තිස්ථානවූ ත්‍රිවිධ මණ්ඩලයෙහි බොහෝසෙයින් සැරිසරා වැඩ ධර්මදෙශනාකර වදාරණසේක; එසින් පිටත් අඞ්ග, මගධ, කාසි, කෝසල වැදූ, මල්ල, චෙතිය, වංශ, කුරු, පංචාල, මත්ස්‍ය, සූරසෙන, අශ්මක, අවන්ති, ගන්ධාර, කාම්බොජ යන මේ සොළොස්මහා ජනපදයෙහිද, යම් යම් තැනක අපභාග්‍යවතුන්වහන්සේ වැඩවාසයකළසේක්ද? එහි තන්හි බොහෝසෙයින් එක්කෙනෙක, දෙදෙනෙක, තුන්දෙනෙක, සතරදෙනෙක, පස්දෙනෙක, සියයක, දහසෙක, ලක්‍ෂයෙක යනාදීන් ගිහිභූමියෙහි සිටියාවූ දෙවියෝ හා මනුෂ්‍යයෝද බණඅසා ශාන්තවූ උතුම් අමාමහ නිවන් දුටුවාහුය; මහරජානෙනි යම් ඒ සත්වකෙනෙක් මහණනොවීම නිවන් දුටුවාහුද; ඒ සියල්ලෝම පැවිද්දේ නොව ගිහියෝම වන්නාහුය; මහරජානෙනි මේ ගණින් දක්වූ දෙව්මිනිසුන් හැර තවත් මෙතෙකැයි පමණනැති කාමභොගීවූ ගිහිභූමියෙහි සිටි දෙව්මිනිසුන් ශාන්තසුඛප්‍රණීතවූ පරමවර අමෘතමහානිර්වාණයට පැමිණියාහුයයි වදාළසේක."ඉක්බිති මිලිඳු මහරජානෝ යහපත ස්වාමීනි, නාගසේනයන්වහන්ස නුඹවහන්සේ බොහෝවූ ධර්මරාශියෙක් වදාළසේක; ඒ වදාළ ධර්මයෙහිත් ගිහිගෙයි වාසයකාරණ කාමභෝගීවූ ගෘහස්ථයෝ උතුම් නිවනට පැමිණෙන්නාහුයයි ප්‍රකාශවූයේය, එසේවූකල මේ තෙලෙස්ධූතාංගයෝ කවර අර්ථයෙක් සිඬකරන්නාහුද ඒ කාරණයෙන් තෙලෙස් ධූතාංගයෝ කිසිත් වැඩෙක් සාදනොදෙන්නාහුය; ඉදින් ස්වාමීනි නාගසෙනයන්වහන්ස මන්ත්‍ර හා බෙහෙත් ඖෂධයක් නැතිව ලෙඩ රෝග සුවවෙත් නම් බෙහෙත් කවා පොවා වමන විරෙචන කොට ශරීරය දුර්වල කිරීමෙන් කවර ප්‍රයෝජනයක්ද? ඉදින් ගුටි පහරින් පරසතුරන්ගෙන් ජය ගන්ට හැකිවේනම් දඬුමුගුරු කඩු දුනු තෝමර ආදියෙන් කම්කිම්ද වැල් ගැට අතුවල එල්ලී යම් රුකකට නැගෙන්ට හැකිනම් ඉනිමන් සෙවීමෙන් කම්කිම්ද? ඉදින් හුනපතුරු ආදියෙන් කළ මැස්සෙහි සැතපීමෙන් දෙහධාතු සමණයවේ නම් යහපත් සුවපහස ඇති කොට්ට මෙට්ට ඇතිරිලි එළා සරහනලද ආසනයෙන් කම්කිම්ද? ඉදින් හැඟ සහිතවූ කාන්තාරයෙන් තනිව එතරවන්ට හැකි

නම් මහත් සෙනඟක් සෙවීමෙන් කම්කිම්ද? ඉදින් මහත් ගඟාව
කින් පීනා එතරවන්ට හැකිනම් ඔරුපාරු සෙවීමෙන් කම්කිම්ද?
ඉඳින් තමන්සන්තකදෙයින් බඩගිනි සහනායකරගන්ට හැකිවන්
නේවීනම් අනුන්සේවනයකොට කන බොනදේ ලබාගැණීමට උත්
සහ කිරීමෙන් කම්කිම්ද? ඉදින් පිපාසයවූ කල ඒ පිපාසය සහනය
කරගැණීමට විල් පොකුණු ආදියෙන් පැන් ලබාගන්ට හැකිනම් ඒ
පිණිස ලින් පොකුණුආදිය සාරා වෙහෙසීමෙන් කම්කිම්ද? එපරිද්
දෙන්ම ස්වාමිනි නාගසේනයන්වහන්ස ඉදින් ගිහිගෙයි වසන්නාවූ
කාමභෝගිවූ ගෘහස්ථයෝත් ශාන්තවූ උතුම්නිර්වාණයට පැමිණෙත්
නම් ධුතාඟසමාදානයෙන් කවර ප්‍රයෝජනයෙක්ද? ධුතාංගසමාද
නය නිෂ්ඵලවන්නේයයි කියූඑකල පරවාද මර්දනයෙහි අභිද
ක්ෂවූ නාගසේනස්ථවිරයන්වහන්සේ "අට්ඨවීසතිඛො පනිමෙ මහා
රාජ ධුතාඟගුණා යථාභුච්ච ගුණෙහි ධුතාංගානි සබ්බබුද්ධානං පිහයි
තානි පත්ථිතානි කතමෙ අට්ඨවීසති, ඉධ මහාරාජ ධුතඟං සුද්ධාජීවං
සුඛඵලං අනවජ්ජං න පරදුක්ඛාපනං අභයං අසම්පීලං එකන්තව
ඩ්ඪිකං අපරිහානියං අමායං ආරක්ඛා පත්ථිතද්දං සබ්බසත්තා දමනං
සංවරහිතං පතිරූපං අනිස්සිතං විප්පමුත්තං රාගක්ඛයං දෝසක්ඛයං
මොහක්ඛයං මානප්පහාණං කුවිතක්කච්ඡෙදනං කංඛා විතරණං
කොසජ්ජවිද්ධංසනං අරතිප්පහාණං ඛමනං අතුලං අප්පමාණං සබ්බ
දුක්ඛක්ඛය ගමනං ඉමෙ ඛො මහාරාජ අට්ඨවීසති ධුතාංගගුණ යථා
භුච්චගුණෙහි ධුතාභානි සබ්බ බුද්ධානංපිහයිතානි පත්ථිතානි" යි මහ
රජානෙනි යම් ධුතාංගගුණයක් කරණකොටගෙණ සියලු බුදුවර
යන් විසින් ධුතාංගයෝ සිහින් නැමතිවනලද්දහුද ප්‍රාර්ථනාකරණ
ලද්දහුද විද්‍යමානවූ ගුණඇති මේ ධුතාඟ ගුණයෝ විසිඅටෙක් වන්
නාහුය; ඔහු කවුරුදයත්? මහරජානෙනි මේ බුද්ධශාසනයෙහි ධුතා
ඟය පිරිසිදුවූ ජීවිකාව ඇතිබවය; සැපවිපාක ඇති බවය: නිවරදි
බවය, පරහට දුක්නොදෙන බවය, නිර්භිත බවය, අනුන්ට පීඩා
නොකරණ බවය, ඒකාන්ත අභිවෘද්ධි ඇතිබවය, පිරිහීමක් නැති
බවය, වඤ්චාවක් නැතිබවය, ආරක්ෂා ඇතිබවය, සිතූ පැතූදේ දෙන
බවය, සියලු සත්වයන් දමනයකරණ බවය. සංවරයට හිත බවය,
ශාසනයට සුදුසු බවය, තෘෂ්ණාව ආශ්‍රය නොකරණබවය, තෘෂ්ණා
වෙන් මිදෙන බවය, රාගය නැතිකරණ බවය, ද්වේෂය නැතිකරණ
බවය, මෝහය නැතිකරණ බවය, මානය නැතිකරණ බවය, ලාමක
කල්පනා නැතිකරණ බවය, කාංසා දුරුකරණ බවය, අලස තාවය
නැතිකරණබවය, ශාසනයට ආලය ඇතිකරණ බවය, සියලු දුක්
සහනය කරණබවය, අතුල්‍යගුණඇති බවය, අපමණ ආනිසංස ඇති
බවය, සියලු දුක් නසන පිණිස පැවතුම් ඇතිබවය, යන මේ අටවිසි

වැදෑරුම් ධූතගුණයෝයි.' මහරජානෙ
දූනා සසරින් මිදෙනු සඳහා ධූතාංගයන්
ඒ පුද්ගලතෙම දසඅට ගුණයකින් යු
ගුණයකින්දයත්? ඒ ධූතාංගධරයන්ගේ
පිරිසිදු වන්නේය, නිවණට පමුණුවා
කොට පිරීම වන්නේය; කය හා වචන
සිත පිරිසිදුවන්නේය; අභිශයින් වීයසී
දුරුවන්නේය, යමක් කෙරෙහි මමය
පවත්ද එකී සක්කායදෘෂ්ටිය පහවන්
නේය, සියල්ලන්කෙරෙහි මෛත්‍රී ඇති
අනුභවකිරීම ඇතිවන්නේය, සියල්ලන
වන්නේය; නිදි දුරුකිරීම ඇගිවන්
නැතිවන්නේය; පහසු පහසු තැනෙය
පිළිකුල්කරන්නේය, විවේකයෙහි ඇළ
යෙන් අප්‍රමාදව වාසයකරන්නේය; මැ
කරණ නැනැත්තා මේ දසඅට ගුණයෙ
මහරජානෙනි ධූතාංගසේවනයට සුදුසු
හුය; ඔහු දශදෙන කවුරුන්දයත්? ශ්‍ර
ලජ්ජා ඇත්තේ වේද, අධික වීයසීය ඇ
වේද, ශාසන දියුනුව පිණිස පැවති සි
පැලඳීම් ආදියෙහි ගිජුබවෙක් නැති
ඇතිවේද, කුසල්කිරීමෙහි දැඩිවූ සමාද
නොට නැතිවේද, සියල්ලන් කෙරෙහි
රජානෙනි මෙකී ගුණයෙන් යුත් දස
යෝනාම් වන්නාහුය; මහරජානෙනි
හොයි යම් ගිහියෝ නිවනට පැමිණෙ
හිවලදී ධූතගුණයෙහි කරණලද පූරු
සඳ ගුඩකොට තිබී දූන් ගිහිව වසන්
නාහුය; මහරජානෙනි දක්ෂවූ ධනුර්
කෙනෙක් ලඟ සිල්පශාලාවෙහි දුද
ගැන්මය, දැඩිකොට ගැන්මය, ඇගිලි
ගැණීමය; සැරය තැබීමය, දුන්න ඇ
හැරීමය; තෘණපුරුෂ විදමනය, ගොම
මනය, මත්හිපුඤ්ජ විදමනය, දිඹුල්
යහපත්ව නික්ම නැවත රාජරාජ
සිත්ගෙණ ඇත් අස් දසිදසාදී සියලු
මහරජාණනි එපරිද්දෙන්ම ගිහි

යම්මක්හු නිවණට පැමිණේද්ද ඒ සියල්ලෝම ඒ ඒ පූර්ව ජාතිවල ධුතාඞ්ග ගුණයෙහි කරණලද පුරුදු ඇතිව චාරිත්‍රයහා ප්‍රති පත්තිය ශුද්ධකොට දැන් උතුම්වූ නිවණට පැමිණෙන්නාහුය. මහරජාණෙනි ධුතගුණයෙහි පූර්වසේවනයක් නැතිව මෙව ජාතියෙහි නිවණට පැමිණිමක් නොවන්නේය. මෙසේ පෙරපුරුදුවූ ධුතාඞ්ගගුණඇත්තාහුම උතුම්වූ වීර්යයෙන් උතුම්වූ ප්‍රතිපත්තියෙන් කල්‍යාණමිත්‍රවූ ආචාර්‍ය කෙනෙකුන් කරණකොටගෙණ රහත්ඵලයට පැමිණීම වන්නේය, "යථාවා පනභිසක්කො සල්ලකත්තො—පෙ—ආතුරෙ උපසඞ්කමති, නිකිච්ඡාය එවමෙවඛො මහාරාජ යෙතෙ ගිහි අගාරිකා කාමභොගිනො සන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡිකරොන්තිතෙ යබ්බ පුරිමාසු ජාතිසු තෙරසසු ධුතගුණෙසු කතුපාසනා කතභූමි කම්මාපන තත්‍ථෙච චාරිත්තෙ පටිපත්තිංච සොධයිත්වා අජ්ජ තරහි ගිහියෙව සන්තා සන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡිකරොන්ති න මහාරාජ ධුතගුණෙහි අවිසුද්ධානං ධම්මාභි සමයො හොති" යි—යනුවෙන් තවද මහරජාණෙනි යම්සේ සල්ලකත්‍යවූ වෛද්‍යතෙම තමාගේ ආචාර්‍යවරයා කිසි ධනයකින් හෝ ව්‍රතයකින් හෝ සිත්ගෙන ගඬුපලන ශාස්ත්‍රය යහපත්කොට නොගැර ඉගෙණ කරණලද හාවිතා ඇතිව අභිදක්ෂයෙක්ව පසු රෝගයන්ට පිළිසම් කරණුපිණිස රෝගාතුරයන් කරා එළඹෙන්නේද, මහරජාණෙනි එපරිද්දෙන්ම ගිහිගෙයි වසන කාමභෝගීවූ ගිහියෝ ශාන්තවූ උතුම් නිවණට පැමිණෙද්ද ඒ සියල්ලෝම ඒ ඒ පූර්වජාතිවල තෙලෙස් ධුතාඞ්ග ගුණයෙහි කරණලද පුරුදු ඇතිව චාරිත්‍රයද ප්‍රතිපත්තියද පිරිසිදු කොට දැන් මෙසමයෙහි ගිහිව වසමින් උතුම් නිවණට පැමිණෙන්නාහුය. මහරජාණෙනි ධුතගුණයක් පුරා එයින් පිරිසිදු නොවූවන්ට නිර්වාණය නොලැබෙන්නේය. තවද මහරජාණෙනි යම්සේ උදක සේවනයක් නැතිව බීජජාතීන්ගේ හටගැණීමක් නොවන්නේද; මහරජාණෙනි එපරිද්දෙන්ම ධුතාඞ්ගසමාදනයකින් ශුද්ධනොවූවන්ට නිවන් නොලැබෙන්නේය. තවද මහරජාණෙනි කරණලද කුශලක්‍රියා නැත්තාහට ස්වර්ගයට යාමක් නැත්තේය. මහරජාණෙනි එපරිද්දෙන්ම ධුතාඞ්ගසමාදනයකින් පිරිසිදු නොවූවන්ට නිවන් නොලැබෙන්නේමැයි. "පඨවිසමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං පතිට්ඨානට්ඨෙන—පෙ—මහාසත්ථවාහසමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං සබ්බභයසුඤ්ඤඛෙම අභයවර පවරනිබ්බාණ නගරසම්පාපනට්ඨෙන" තවද මහරජාණෙනි ධුතගුණය නිවණට පැමිණෙනු කැමැත්තන්ට ප්‍රතිෂ්ඨා අර්ථයෙන් පෘථිවිය සමාන වන්නේය. සියලු කෙලෙස්මල සෝධන අර්ථයෙන් පිරිසිදු ජලයක් හා සමාන වන්නේය. සියලු කෙලෙස් දවන අර්ථයෙන් මහ ගිනිකඳක් හා සමාන වන්නේය. කෙලෙස් ධූලි

හරණ අර්ථයෙන් මහ සුළඟක් හා සමානවන්නේය; කෙලෙස් ව්‍යාධි දුරුකරණ අර්ථයෙන් ඖෂධයෙහෙනක් හා සමානවන්නේය. සියලු කෙලෙස් විනාශකරණ අර්ථයෙන් දිව්‍ය අමෘතයක් හා සමානවන් නේය. සියලු ගුණධර්ම උපදවන අර්ථයෙන් කෙතක් හා සමාන වන්නේය. කැමති කැමති දෙව් මිනිස් සම්පත් හා නිර්වාණද ගෙණ හැරදෙන අර්ථයෙන් සිතුමිණි රුවනක් හා සමානවන්නේය. සංසාරසාගරයාගේ පරතෙරට පමුණුවන අර්ථයෙන් මහනැවක් හා සමානවන්නේය. ජාතිජරා මරණ දුකින් භයවූවන්ට භයනොවේවයි අස්වසන අර්ථයෙන් රක්‍ෂාස්ථානයක් හා සමානවන්නේය; කෙලශදුඃඛයෙන් පීඩිතවූවන්ට සංග්‍රහකරණ අර්ථයෙන් වැඳු මෑනියන් හා සමානවන්නේය. සිහලු ගුණ උපදවන අර්ථයෙන් පියානන් හා සමානවන්නේය. සියලු ගුණ සොයන අර්ථයෙන් සැබෑකියන මිත්‍රයෙක් හා සමානවන්නේය. සියලු කෙලෙස් මලහා ජනා ඇළලන අර්ථයෙන් පියුමක්හා සමානවන්නේය, කෙලශ හරණ අර්ථයෙන් කොකුම්ආදි යහපත් සුගන්ධයක්හා සමානවන්නේය. අෂ්ටලෝක ධර්මවාතයෙන් කම්පානොවන අර්ථයෙන් මහමෙරහා සමානවන්නේය, පැතුරුණාවූ අර්ථයෙන් ආකාශය හා සමානවන් නේය, කෙලශමලය පාවියන අර්ථයෙන් ගඟාවක්හා සමානවන්නේය නිර්වාණට පමුණුවන අර්ථයෙන් ශාස්තෲවාහකයෙක්හා සමානවන් නේය. තවද මහරජාණෙනි මෙසේ ධූතාඞ්ග සමාදානය නිවන්ලබනු කැමතිවූ පණ්ඩිත ජනයන්ට බොහෝ උපකාරඇත්තේය. සියලු කෙලෙස් දුරුකරන්නේය, සියලු භය දුරුකරන්නේය, භවයෙහි ඉපදීම නැතිකරන්නේය, ලයෙහි වදින රාගාදී උල් දුරුකරන්නේය. ශෝක දුරුකරන්නේය, සසරදුක් දුරුකරන්නේය; රාගද්වේෂ මෝහ මද මාන මාත්සර්‍ය්‍යාදි සියලු අකුශලයන් දුරුකරන්නේය, තවද මහරජාණෙනි යම්සේ මනුෂ්‍යයෝ ජීවත්වනු පිණිස ආහාර සේවනයකෙරෙති ශරීරයට හිතපිණිස බෙහෙත් සේවනය කෙරෙති, උපකාර පිණිස මිත්‍රයන් සේවනය කෙරෙති. මුහුදින් එතර වනුපිණිස නැව් සේවනය කෙරෙති, ඇඟ සුවඳ කරණ පිණිස මල්ගඳවිලවුන් සේවනය කෙරෙති, අභය පිණිස නිර්භයස්ථාන සේවනය කෙරෙති, පිහිට පිණිස පෘථිවිය සේවනය කෙරෙති; සිල්ප පිණිස ගුරුන්සේවනය කෙරෙති, යසස්පිණිස රජුන් සේවනය කෙරෙති, කැමැති කැමැතිදෙය ලබන පිණිස මාණික්‍යරත්නය සේවනයකෙරෙති, මහරජාණෙනි එපරිද්දෙන්ම සියලුම ගුණදරණහෙයින් ආර්‍ය්‍යයෝ ධූතගුණය සේවනයකරත්නාහුය—තවද මහරජාණෙනි යම්සේ ජලය බීජුගවගැණීම පිණිස වේද, ගින්න දැවීමපිණිස වේද, ආහාරය බල ගැණීමපිණිස වේද,

වැල් බැඳීම පිණිස වේද, ආයුධ කැපීම පිණිස වේද, පැන් පිපාසය පිණිස වේද, නිධාන රක්‍ෂාව පිණිස වේද, නැව එතරයාම පිණිස වේද, බෙහෙත් ව්‍යාධි නසන පිණිස වේද, ගුරුවරයන් ඉගෙණ ගැන්ම පිණිස වේද, මැනියන් පුත්‍රපොෂණය පිණිස වේද, අලඞ්කාරය බැබලීම පිණිස වේද, රජුන් ලොවට ආරක්‍ෂා පිණිස වේද, වෙනත් ඒ ඒ සියලු කෘත්‍යයන් සියල්ලම එකක් එකක් සඳහා වන්නේමය. මහරජාණෙනි මේ එකම ධූතාඟ සමාදානය නොයෙක් සාධුගුණයෙන් යුක්තවූ ජීවත් ලැබීම පිණිස වන්නේමැයි. තවද මහරජාණනි මේ ධූතාංගගුණය සියලු ගුණයන්ට වඩා ඉහිරසිටියේය; ශ්‍රෙෂ්ඨව සිටියේය; විශිෂ්ටව සිටියේය, අධිකව සිටියේය; දික්ව සිටියේය; ගරුව සිටියේය, බැරෑරුම්ව සිටියේය; ඉතා මහත්ව සිටියේයයි මේ ආදිනොයෙක් අනන්ත උපමා හේතූදාහරණ සහිත කාරණයක් ඒ නාගසේනස්ථවිරයන්වහන්සේ විසින් වදාළසේක.

**තෙළෙස්ධූතාඟයනම්**—පාංශුකූලිකාඟය, තෙචීවරිකාඟය, පිණ්ඩපාතිකාඟය, සපදානචාරිකාඟය, ඒකාසනිකාංගය, පත්තපිණ්ඩිකාංගය, ඛලුපච්ඡාභත්තිකාඟය, ආරඤ්ඤිකාඟය, රුක්ඛමූලිකාඟය, අබ්භොකාසිකාංගය, සොසානිකාංගය, යථාසන්ථතිකාංගය, නෙසජ්ජිකාංගය යන මෙකී තෙළෙස්ධූතාංග ගුණයම ශ්‍රමණයන් වහන්සේලා විසින් පූරණය කරන්ට හැකිවන්නාහුය, මේ තෙළෙස් ධූතාංගයන් අතුරෙන් යම් ධූතාංගකෙනෙක් ගිහිගෙයි වසන්නාවූ ශ්‍රද්ධාවන්ත උපාසක උපාසිකා ගිහින්විසින් සේවනය කටයුතුවේද, ඒ ධූතාංගදෙක විස්තරවශයෙන් මෙහි ගෙණහැර දක්වන්නෙමි.

**ගිහින්විසින් රක්‍ෂායුතු අඟදෙකෙහි ප්‍රභේදනම්**—ඒකාසනිකාඟය පත්තපිණ්ඩිකාංගය යනමේ ධූතාංගදෙක උපාසක උපාසිකා ගිහින් විසින් රැකියයුතුවන්නේය; එකවිට සමාදන්ව එකට පරිහරණයකරන්ටද සුවසේ හැකිවන්නේමැයි—එහි නොයෙක් ආසනාවල හිඳ අනුභවය ප්‍රතික්‍ෂෙපකිරීමෙන් එක්ආසනයෙක්හි හිඳ ආහර අනුභවකිරීම සමාදන්ව පරිහරණය කරණ චෙතනාව ඒකාසනිකාංගය නම් වන්නේය; දෙවෙනි භාජනයක් ගැණීම ප්‍රතික්‍ෂෙප කිරීමෙන් එකම භාජනයෙක්හි ආහරගැණීම සමාදන්ව පරිහරණය කරණ සිත පත්තපිණ්ඩිකාඟයනම් වන්නේය; මෙකී ධූතාඟ දෙකම හෝ දෙකින් එකක්හෝ සමාදන්ව රක්නා යමෙක් ඇත්නම් ඔහුවිසින් පළමු කොට අෂ්ටාඞ්ගසීලයෙහි හෝ දශශීලයෙහි හෝ පිහිටා ධූතාඟය රැක්කයුතු වන්නේමය, පංචසීලයෙහි පිහිටාත් යුතු වන්නේය; එතකුදුළුවත් ඉරඅවරට ගියායින් පසු ආහාර අනුභවකිරීම ආයුර්ධර්මයට නොහොබනා බැවින් ඒ පඤ්චශීලය හැරදැමිය යුත්තේය. ධූතාංග සමාදන් වන්නහු විසින් බුද්ධජීවමාන කල්හි බුදුන් සමීප

යෙහිදී සමාදන්විය යුත්තේය—බුදුන් පිරිනිවීකල්හි මහාශ්‍රාවකයන්
වහන්සේ නමකගේ සමීපයෙහිද, මහාශ්‍රාවකයන්වහන්සේ නැති
කල්හි සෙසු රහතන් වහන්සේනමකගේ සමීපයෙහිද, ඔවුන් නැති
කල්හි අනාගාමියක්හුගේ සමීපයෙහිද, ඔවුන් නැතිකල්හි සකෘදාගාමි
යක්හුගේ සමීපයෙහිද, ඔවුන් නැතිකල්හි සොවාන්කෙනෙකුගේ
සමීපයෙහිද, ඔවුන් නැතිකල්හි ත්‍රිපිටකධරයක්හුගේ සමීපයෙහිද,
ත්‍රිපිටකධරයක්හු නැතිකල්හි පිටක දෙකක් දරන්නාහුගේ සමීපයෙ
හිද, ඔවුන් නැතිකල්හි එකපිටකෘක් දරන්නාහුගේ සමීපයෙහිද
ඔවුන්නැතිකල්හි අටුවාචාරින්වහන්සේ නමකගේ සමීපයෙහිද,
ඔවුන් නැතිකල්හි ධුතාංගධරයක්හුගේ සමීපයෙහිද, ඔවුන්නැති
කල්හි චෛත්‍යයක් සමීපයෙහිදී සමාදන් වියයුත්තේමැයි.—චෛ
ත්‍යයවනාහි ශාරීරික චෛත්‍යය පාරිභොගික චෛත්‍යය උද්දේසික
චෛත්‍යයයි කියා තුන්ප්‍රකාර වේත්—එහි බුදුරජානන්වහන්සේගේ
ශාරීරික ධාතු පිහිටුවා බඳනාලද දාගැප්වහන්සේ ශාරීරික චෛත්‍ය
යනම් වේ—ශරීරධාතුද එයටම ඇතුළත් වේ; බුදුරජානන්වහන්සේ
විසින් පරිභොගකරණලද බොධිවෘක්ෂය ආදී සියල්ල පාරිභොගික
චෛත්‍යය නම්වේ; බුදුන් උදෙසා සාදනලද පිළිමවහන්සේලා උද්
දේසිකචෛත්‍ය නම් වේයයි දතයුතුයි—මෙහි බිඩාදි උත්තමයන්
තබා දැනට ධුතාංගධර යකෙනෙක්ද ලබාගැනීම දුෂ්කර බැවින් මෙහි
කී ධුතාංග දෙක හෝ එකක් හෝ සමාදන්වන්නාහු විසින් චෛත්‍ය
යක් හෙවත් දාගැබක් ළඟට හෝ බෝධිවෘක්ෂයක් ළඟට හෝ පිළිම
වහන්සේ නමක් ළඟට හෝ ගොස් එහි කටයුතු ඇමදුම් ආදී වත්පි
ළිවෙත්කොට ඇඳිලිබැඳ නමස්කාරකරගෙණ උක්කුටුකයෙන් හිඳ
බුදුන් ලඟදී සමාදන්වන්නාකුමෙන් සිතා ගෞරව උපදවාගෙන
"නානාසන භොජනං පටික්ඛිපාමි එකාසනිකංගං සමාදියාමි" යන
මේ වාක්‍යය තුන්වරක් කියා මේ ඒකාසනික ධුතාංගය සමාදන් විය
යුත්තේය—සියලුම ධුතාංගවල උත්කෘෂ්ටයාය මධ්‍යමයාය මෘදුකයා
යයි තුන්දෙනෙක්වන්නාහුය, හෙවත් පළමුවෙනියාය දෙවෙනියාය
තුන්වෙනියායයි තුන් දෙනෙක් වන්නාහුය—ධුතාංගය සමා
දන් වන්නාවූ කාලයෙහිම මේ තුන් ආකාරයෙන් තමා විසින්
රක්නට පුළුවන් ආකාරයක් කල්පනාවට ගෙන උත්කෘෂ්ටවශ
යෙන් රක්නෙමියි හෝ මධ්‍යමවශයෙන් රක්නෙමියි හෝ මෘදු
කවශයෙන් රක්නෙමියි හෝ සලකා සමාදන් විය යුත්තේය—
මෙසේ එකාසනික ධුතාංගය සමාදන්වූ තැනැත්තා විසින් ආ
හාර අනුභවකරණ කාලයෙහි ඊට සුදුසු ආසනයක් සලකා හින්
දයුත්තේය; බිම හෝ පැදුරක හෝ ඇඳකහෝ පුටුවක හෝ බංකු
වකහෝ යම් කිසිතැනෙක ආහර අනුභවයට උන්කල්හි අනුභවය

යමෙක්හු නිවණට පැමිණේද්ද ඒ සියල්ලෝම ඒ ඒ පූර්ව ජාතිවල ධූතාංග ගුණයෙහි කරණලද පුරුදු ඇතිව චාරිත්‍රයහා ප්‍රතිපත්තිය ශුද්ධකොට දූන් උතුම්වූ නිවණට පැමිණෙන්නාහුය. මහරජානෙනි ධූතගුණයෙහි පූර්වසේවනයක් නැතිව මෙව ජාතියෙහි නිවණට පැමිණීමක් නොවන්නේය. මෙසේ පෙරපුරුදුවූ ධූතාංගගුණඇත්තාහුම උතුම්වූ වීර්‍යයෙන් උතුම්වූ ප්‍රතිපත්තියෙන් කල්‍යාණමිත්‍රවූ ආචාර්‍ය්‍ය කෙනෙකුන් කරණකොටගෙණ රහත්ඵලයට පැමිණීම වන්නේය, “යථාවා පනාසිසකො සල්ලකත්තො—පෙ—ආතුරෙ උපසඞ්කමති, තිකිච්ඡාය එවමෙව ඛො මහාරාජ යෙතෙ ගිහි අගාරිකා කාමභොගිනො සන්තං පරමත්ථං නිබ්බානං සච්ඡිකරොන්තිතෙ සබ්බෙ පුරිමාසු ජාතිසු තෙරසසු ධූතගුණෙසු කතුපාසනා කතභූමිකම්මාතෙ ආචෙ ච චාරිත්තෙ පටිපත්තිංච සොධයිත්වා අජ්ජ තරහි ගිහියෙව සන්තා සන්තං පරමත්ථං නිබ්බානං සච්ඡිකරොන්ති න මහාරාජ ධූතගුණෙහි අවිසුද්ධානං ධම්මාභිසමයො හොති” යි—යනුවෙන් තවද මහරජානෙනි යම්සේ සල්ලකත්තෘවූ වෛද්‍යතෙම තමාගේ ආචාර්‍ය්‍යවරයා කිසි ධනයකින් හෝ ව්‍රතයකින් හෝ සිත්ගෙන ගඩුපලන ශාස්ත්‍රය සහපත්කොට නොහැර ඉගෙණ කරණලද භාවිතා ඇතිව අභිදක්‍ෂයෙක්ව පසු රෝගයන්ට පිළිසම් කරණුපිණිස රෝගාතුරයන් කරා එළඹෙන්නේද, මහරජානෙනි එපරිද්දෙන්ම ගිහිගෙයි වසන කාමභෝගිවූ ගිහියෝ ශාන්තවූ උතුම් නිවණට පැමිණෙද්ද ඒ සියල්ලෝම ඒ ඒ පූර්වජාතිවල තෙළෙස් ධූතාංග ගුණයෙහි කරණලද පුරුදු ඇතිව චාරිත්‍රයද ප්‍රතිපත්තියද පිරිසිදු කොට දූන් මෙසමයෙහි ගිහිව වසමින් උතුම් නිවණට පැමිණෙන්නාහුය. මහරජානෙනි ධූතගුණයක් පුරා එයින් පිරිසිදු නොවූවන්ට නිර්‍වාණය නොලැබෙන්නේය. තවද මහරජානෙනි යම්සේ උදක සේචනයක් නැතිව බීජජාතීන්ගේ හටගැණීමක් නොවන්නේද; මහරජානෙනි එපරිද්දෙන්ම ධූතාංගසමාදානයකින් ශුද්ධනොවූවන්ට නිවන් නොලැබෙන්නේය. තවද මහරජානෙනි කරණලද කුශලක්‍රියා නැත්තාහට ස්වර්ගයට යාමක් නැත්තේය. මහරජානෙනි එපරිද්දෙන්ම ධූතාංගසමාදානයකින් පිරිසිදු නොවූවන්ට නිවන් නොලැබෙන්නේමැයි. “පඨවිසමං මහාරාජ ධූතගුණං විසුද්ධිකාමානං පතිට්ඨානට්ඨෙන—පෙ—මහාසත්ථවාහසමං මහාරාජ ධූතගුණං විසුද්ධිකාමානංසබ්බභයසුඤ්ඤඛෙම අභයවර පවරනිබ්බාණ නගරසම්පාපනට්ඨෙන” තවද මහරජානෙනි ධූතගුණය නිවණට පැමිණෙනු කැමැත්තන්ට ප්‍රතිෂ්ඨා අර්ථයෙන් පෘථිවිය සමාන වන්නේය. සියලු කෙලෙස්මල සෝධන අර්ථයෙන් පිරිසිදු ජලයක් හා සමාන වන්නේය. සියලු කෙලෙස් දවන අර්ථයෙන් මහ ගිනිකඳක් හා සමාන වන්නේය. කෙලෙස් ධූලි

හරණ අර්ථයෙන් මිහ සුලඟක් හා සමානවන්නේය; කෙලෙස් ව්‍යාධි
දුරුකරණ අර්ථයෙන් ද්‍රවබෙහෙතක් හා සමානවන්නේය. සියලු
කෙලෙස් විනාශකරණ අර්ථයෙන් දිව්‍ය අමෘතයක් හා සමානවන්
නේය. සියලු ගුණධර්ම උපදවන අර්ථයෙන් කෙතක් හා සමාන
වන්නේය. කැමති කැමති දෙව් මිනිස් සම්පත් හා නිර්වාණද ගෙණ
හැරදෙන අර්ථයෙන් සිතුමිණි රුවනක් හා සමානවන්නේය. සං
සාරසාගරයාගේ පරතෙරට පමුණුවන අර්ථයෙන් මහනැවක් හා
සමානවන්නේය. ජාතිජරා මරණ දුකින් භයවූවන්ට භයනොවේ
වයි අස්වසන අර්ථයෙන් රක්‍ෂාස්ථානයක් හා සමානවන්නේය;
කෙලශදුඃඛයෙන් පීඩිතවූවන්ට සංග්‍රහකරණ අර්ථයෙන් වැදූ මෑනි
යන් හා සමානවන්නේය. සිහලු ගුණ උපදවන අර්ථයෙන් පියා
නන් හා සමානවන්නේය. සියලු ගුණ සොයන අර්ථයෙන් සැබෑ
කියන මිත්‍රයෙක් හා සමානවන්නේය. සියලු කෙලෙස් මලහා නො
ඇලලන අර්ථයෙන් පියුමක්හා සමානවන්නේය, කෙලශ හරණ
අර්ථයෙන් කොකුම්ආදි යහපත් සුගන්ධයක්හා සමානවන්නේය.
අෂ්ටලෝක ධර්මවාතයෙන් කම්පානොවන අර්ථයෙන් මහමෙරහා
සමානවන්නේය, පැතුරුණාවූ අර්ථයෙන් ආකාශය හා සමානවන්
නේය, කෙලශමලය පාවිසන අර්ථයෙන් ගඟාවක්හා සමානවන්නේය
නිර්වාණට පමුණුවන අර්ථයෙන් ශාස්තෘවාහකයෙක්හා සමානවන්
නේය. තවද මහරජානෙනි මෙසේ ධූතාඞ්ග සමාදානය නිවන්ලබනු
කැමතිවූ පණ්ඩිත ජනයන්ට බොහෝ උපකාරඇත්තේය. සියලු
කෙලෙස් දුරුකරන්නේය, සියලු භය දුරුකරන්නේය, භවයෙහි ඉප
දීම නැතිකරන්නේය, ලයෙහි වදින රාගාදී උල් දුරුකරන්නේය.
ශෝක දුරුකරන්නේය, සසරදුක් දුරුකරන්නේය; රාගද්වේෂ මොහ
මද මාන මාත්සර්‍යාදී සියලු අකුශලයන් දුරුකරන්නේය, තවද
මහරජානෙනි යම්සේ මනුෂ්‍යයෝ ජීවත්වනු පිණිස ආහාර සේව
නයකෙරෙත් ශරීරයට හිතපිණිස බෙහෙත් සේවනය කෙරෙති,
උපකාර පිණිස මිත්‍රයන් සේවනය කෙරෙති. මුහුදින් එතර
වනුපිණිස නැව් සේවනය කෙරෙති, ඇඟ සුවඳ කරණ පිණිස
මල්ගඳවිලවුන් සේවනය කෙරෙති, අභය පිණිස නිර්භයස්ථාන
සේවනය කෙරෙති, පිහිට පිණිස පෘථිවිය සේවනය කෙරෙති;
සිල්ප පිණිස ගුරුන්සේවනය කෙරෙති, යසස්පිණිස රජුන්
සේවනය කෙරෙති, කැමැති කැමැතිදෙය ලබන පිණිස මාණි
ක්‍යරත්නය සේවනයකෙරෙති, මහරජානෙනි එපරිද්දෙන්ම සිය
ලුම ගුණදරණහෙයින් ආර්‍ය්‍යයෝ ධූතගුණය සේවනයකරන්නා
හුය—තවද මහරජානෙනි යම්සේ ජලය බිජුහටගැණීම පිණිස
වේද, ගින්න දැවීම්පිණිස වේද, ආහාරය බල ගැණීමපිණිස වේද,

වැල් බැඳීමපිණිස වේද, ආයුධ තැපීමපිණිස වේද, පැන් පිපාසය පිණිස වේද, නිධාන රක්‍ෂාවපිණිස වේද, නැව එතරයාම පිණිස වේද, බෙහෙත් ව්‍යාධි නසන පිණිස වේද, ගුරුවරයන් ඉගෙණ ගැන්ම පිණිස වේද, මැනියන් පුත්‍රපොෂණය පිණිස වේද, අලඞ්කාරය බැබලීම පිණිස වේද, රජුන් ලොවට ආරක්‍ෂා පිණිස වේද, මෙනත් ඒ ඒ සියලු කෘත්‍යයන් සියල්ලම එකක් එකක් සඳහා වන්නේමය. මහරජානෙනි මේ එකම ධූතාඞ්ග සමාදානය ශතායෙක් සාධුගුණයෙන් යුක්තවූ ජීවත් ලැබීම පිණිස වන්නේමැයි. තවද මහරජානෙනි මේ ධූතාංගගුණය සියලු ගුණයන්ට වඩා ඉතිරසිටියේය; ශ්‍රේෂ්ඨවසිටියේය; විශිෂ්ටව සිටියේය, අධිකවසිටියේය; දික්ව සිටියේය; ගරුවසිටියේය, බැරෑරුම්ව සිටියේය; ඉතා මහත්ව සිටියේයයි මේ ආදිනොයෙක් අනන්ත උපමා හේතුදාහරණ සහිත කාරණයක් ඒ නාගසේනස්ථවිරයන්වහන්සේ විසින් වදාළසේක.

**තෙලෙස්ධුතාංගයනම්**—පාංශුකූලිකාංගය, තෙචීවරිකාංගය, පිණ්ඩපාතිකාංගය, සපදානචාරිකාංගය, ඒකාසනිකාංගය, පත්තපිණ්ඩිකාංගය, ඛලුපච්ඡාභත්තිකාංගය, ආරඤ්ඤිකාංගය, රුක්ඛමූලිකාංගය, අබ්භොකාසිකාංගය, සොසානිකාංගය, යථාසන්තතිකාංගය, නෙසජ්ජිකාංගයා යන මෙකී තෙලෙස්ධුතාංග ගුණයම ශ්‍රමණයන් වහන්සේලා විසින් පූරණය කරන්ට හැකිවන්නාහුය, මේ තෙලෙස් ධූතාංගයන් අතුරෙන් යම් ධූතාංගකෙනෙක් ගිහිගෙයි වසන්නාවූ ශ්‍රද්ධාවන්ත උපාසක උපාසිකා ගිහින්විසින් සේවනය කටයුතුවේද, ඒ ධූතාංගදෙක විස්තරවශයෙන් මෙහි ගෙණහැර දක්වන්නෙමි.

**ගිහින්විසින් රක්‍ෂායුතු අඟදෙකෙහි ප්‍රභේදනම්**-එකාසනිකාංගය පත්තපිණ්ඩිකාංගය යනමේ ධූතාංගදෙක උපාසක උපාසිකා ගිහින් විසින් රැකියයුතුවන්නේය; එකවිට සමාදන්ව එකට පරිහරණයකරන්ටද සුවසේ හැකිවන්නේමැයි-එහි නොයෙක් ආසනවල හිඳ අනුභවය ප්‍රතික්‍ෂෙපකිරීමෙන් එක්ආසනයෙක්හි හිඳ ආහර අනුභවකිරීම සමාදන්ව පරිහරණය කරණ චෙතනාව එකාසනිකාංගය නම් වන්නේය; දෙවෙනි භාජනයක් ගැණීම ප්‍රතික්‍ෂෙප කිරීමෙන් එකම භාජනයෙක්හි ආහරගැණීම සමාදන්ව පරිහරණය කරණ සිත පත්තපිණ්ඩිකාංගයනම් වන්නේය; මෙකී ධූතාංග දෙකම හෝ දෙකින් එකක්හෝ සමාදන්ව රක්නා යමෙක් ඇත්නම් ඔහුවිසින් පළමුකොට අෂ්ටාඞ්ගසීලයෙහි හෝ දශශීලයෙහි හෝ පිහිටා ධූතාංගය රැක්කයුතු වන්නේමය, පවසිලයෙහි පිහිටාත් යුතු වන්නේය; එතකුදුලවත් ඉරඅවරට ගියාසින් පසු ආහාර අනුභවකිරීම ආයෂ් ධර්මයට නොහොබිනා බැවින් ඒ පඤ්චශීලය හැරදැමිය යුත්තේය. ධූතාංග සමාදන් වන්නහු විසින් බුද්ධජීවමාන කල්හි බුදුන් සමීප

යෙහිදී සමාදන්විය යුත්තේය—බුදුන් පිරිනිවීකල්හි මහා ශ්‍රාවකයන්වහන්සේ නමකගේ සමීපයෙහිද, මහාශ්‍රාවකයන්වහන්සේ නැතිකල්හි සෙසු රහතන් වහන්සේනමකගේ සමීපයෙහිද, ඔවුන් නැතිකල්හි අනාගාමියක්හුගේ සමීපයෙහිද, ඔවුන් නැතිකල්හි සකෘදගාමියක්හුගේ සමීපයෙහිද, ඔවුන් නැතිකල්හි සොවාන්කෙනෙකුගේ සමීපයෙහිද, ඔවුන් නැතිකල්හි ත්‍රිපිටකධරයක්හුගේ සමීපයෙහිද, ත්‍රිපිටකධරයක්හු නැතිකල්හි පිටක දෙකක් දරන්නහුගේ සමීපයෙහිද, ඔවුන් නැතිකල්හි එකපිටකයක් දරන්නහුගේ සමීපයෙහිද ඔවුන්නැතිකල්හි අටුවාචාරින්වහන්සේ නමකගේ සමීපයෙහිද, ඔවුන් නැතිකල්හි ධුතාංගධරයක්හුගේ සමීපයෙහිද, ඔවුන්නැතිකල්හි චෛත්‍යයක් සමීපයෙහිදී සමාදන් වියයුත්තේමැයි—චෛත්‍යයවනාහි ශාරීරික චෛත්‍යය පාරිභොගික චෛත්‍යය උද්දේසික චෛත්‍යයයි කියා තුන්ප්‍රකාර වේත්—එහි බුදුරජාණන්වහන්සේගේ ශාරීරික ධාතු පිහිටුවා බඳනාලද දාගැප්වහන්සේ ශාරීරික චෛත්‍යයනම් වේ—ශරීරධාතුද එසටම ඇතුළත් වේ; බුදුරජාණන්වහන්සේ විසින් පරිභොගකරණලද බොධිවෘක්ෂය ආදී සියල්ල පාරිභොගික චෛත්‍යය නම්වේ; බුදුන් උදෙසා සාදනලද පිළිමවහන්සේලා උද්දේසිකචෛත්‍ය නම් වේයයි දතයුතුයි—මෙහි බුද්ධාදී උත්තමයන් තබා දූනට ධුතාංගධර යෙකෙනෙක්ද ලබාගැනීම දුෂ්කර බැවින් මෙහි කී ධුතාංග දෙක හෝ එකක් හෝ සමාදන්වන්නහු විසින් චෛත්‍යයක් හෙවත් දාගැබක් ලඟට හෝ බෝධිවෘක්ෂයක් ලඟට හෝ පිළිමවහන්සේ නමක් ලඟට හෝ ගොස් එහි කටයුතු ඇමදුම් ආදී වත්පිළිවෙත්කොට ඇදිලිබැඳ නමස්කාරකරගෙණ උක්කුටුකයෙන් හිඳ බුදුන් ලඟදී සමාදන්වන්නාකුමෙන් සිය ගෞරව උපදවාගෙන “නානාසන භොජනං පටික්ඛිපාමි එකාසනිකංගං සමාදියාමි” යන මේ වාක්‍යය තුන්වරක් කියා මේ ඒකාසනික ධුතාංගය සමාදන් විය යුත්තේය—සියලුම ධුතාංගවල උත්කෘෂ්ටයාය මධ්‍යමයාය මෘදුකයායයි තුන්දෙනෙක්වන්නාහුය, හෙවත් පළමුවෙනියාය දෙවෙනියාය තුන්වෙනියායයි තුන් දෙනෙක් වන්නාහුය—ධුතාංගය සමාදන් වන්නාවූ කාලයෙහිම මේ තුන් ආකාරයෙන් තමා විසින් රක්නට පුළුවන් ආකාරයක් කල්පනාවට ගෙන උත්කෘෂ්ටවශයෙන් රක්නෙමියි හෝ මධ්‍යමවශයෙන් රක්නෙමියි හෝ මෘදුකවශයෙන් රක්නෙමියි හෝ සලකා සමාදන් විය යුත්තේය—මෙසේ ඒකාසනික ධුතාංගය සමාදන්වූ තැනැත්තා විසින් ආහාර අනුභවකරණ කාලයෙහි ඊට සුදුසු ආසනයක් සලකා හිඳියුත්තේය; බිම හෝ පැදුරක හෝ ඇඳකහෝ පුටුවක හෝ බංකුවකහෝ යම් කිසිතැනෙක ආහාර අනුභවයට උන්කල්හි අනුභවය

පිණිස බතෙහි අත තබන්ට මත්තෙන් යම් යම් කටයුත්තක් සැඹි
ඹියේනම් උන්ආසනයෙන් නැගිට නැවත එහිහෝ වෙන ආසන
යක හෝ හිඳ අනුභවකරන්ට වටී. යම් ආසනයක ආහර අනුභව
යට හිඳ අනුභවකරණු පිණිස බතෙහි අත තුබූනැත්පටන් යම්කා
ත්‍යයක් සඳහා නැගීසිටින්ට නොවටී. එසේ අනුභවයට පටන්ගෙණ
එයින් නැගිට ඒ දවසෙහි ඒ උන් ආසනයෙහි හෝ වෙන ආසනයක
හෝ හිඳ දෙවනුව අනුභවකරන්ට නොවටී. එසේ අනුභවකල
හොත් ධුතාංගය බිඳේ; කුමක්හෙයින්දයත්? සමාදන්වීමෙහිදී නො
යෙක් ආසනවල හිඳ අනුභවකිරීම ප්‍රතික්‍ෂේපකළ බැවිනි; එක ආස
නයකම හිඳ අනුභවකටයුතුයයි කීහෙයින් සැමදවස්හිම එකම පුටු
වකහෝ එකම ඇඳකහෝ එකම පැදුරකහෝ වෙනාත් යම්යම් එකම
තැනකහිඳ අනුභව කටයුතුයයි සමහරු කල්පනාකොට සැක උපද
වත්; යම්යම් දවසෙක්හි කී ආකාරයට යම්යම් තැනකහිඳ අනුභවකො
ට දෙවනු දෙවනු දවස්වල වෙනින් වෙනින් ආසනවල හිඳ අනුභව
කළාට දෙසෙක් නැත්තේය අංගය නොබිඳෙන්නේයයි දතයුතු.
එසේහිඳ අනුභවකිරීම නානාසනභොජනය නම් නොවන්නේය; යම්
දවසෙක්හී යම් ආසනයක හිඳ අනුභවකරන්ට පටන්ගෙන එයින්
නැගිට එදවස්හිම එම ආසනයෙහිහෝ වෙනින් ආසනයකහෝ හිඳ
දෙවනු අනුභවකිරීම නානාසන භොජනයනම් වන්නේය; ධුතාංග
යද බිඳෙන්නේයයි දතයුතු. උත්කෘෂ්ටවශයෙන් හෙවත් පළමුවෙ
නිවශයෙන් සමාදන්වෙමියි සිතා මේ ඒකාසනිකාංගය සමාදන් වන්
නහු විසින් යම් ආසනයක හිඳ අනුභවකරණුපිණිස බතෙහි අතත
බාද එතැන්පටන් තවත් ගෙනාගෙනා වෙනවෙන ද්‍රව්‍ය බෙදවා නො
ගතයුත්තේය; එසේ නැවතනැවත බෙදවාගත්තේනමුත් අංගය
නොබිඳෙන්නේය ඔහු සවල්පයක්ම කැමැත්තා බැවින් නැවතනැ
වත ගේනාගෙනා භොජනගැනීම නොයෙක්ආසනවලහිඳ අනුභවකි
රීම සමානයයි සිතා නැවතනැවත ගෙනාගෙනා බොජුන් බෙදවා
නොගතයුතුවන්නේය; ඉදින් වනාහි වළඳා නිවාඩුව එම අස්නෙහි
ඉන්නකල හෝ එයින් නැගිට වෙනින් ආසනයක ඉන්නකල හෝ
එදවස්හිම ගිතෙල් මී සකුරු ආදියක් ගෙනවුත් යමෙක් ඔහුට දුන්
නේද රෝගසමනයටයයි සිතා බෙහෙත්පිණිස ගෙන අනුභවක
රන්ට වටී, ආහරපිණිස අනුභවකරන්ට නොවටීයයි දතයුතු. මී
සකුරු ආදිය අනුභවකිරීම පළමුවෙනි දෙවෙනි තුන්වෙනි තුන්දෙ
නාටම එසේයයි දතයුත්තේය. මධ්‍යමවශයෙන් හෙවත් දෙවෙනි
විශයෙන් සිතා මේ ඒකාසනික ධුතාංගය සමාදන්වන්නාහු විසින්
ආහාර දවා අනුභවයට පටන්ගත් භාජනයෙහි ආහර තිබෙන
තෙක් ගෙනාගෙනා යමක් බෙදවා ගනිමින් අනුභවකරන්ට වටී;

පළමු ගත් ආහර නිවාඩුවෙනතෙක් නැවත නැවත බෙදවාගණි
මින් අනුභවකරණ බැවින් මෝහට භොජනපයර්‍යන්තිකයයි නමෙක්
වන්නේය; මෘදුක වශයෙන් ද හෙවත් තුන්වෙනි වශයෙන් මේ
එකාසනික ධුතාංගය සමාදන් වන්නහු විසින් අනුභවය පිණිස
උන් ආසනයෙන් නැගිටිනතුරු දෙවනු දෙවනු බෙදවාගනිමින්
අනුභවකරන්වද එම ආසනයෙහිම හිඳ කැමතිනම් කිප කීපවරක්
හෝ අනුභවකරන්ට වටී; මොහු විසින් අනුභවයට උන් ආස
නයෙන් නැගිටිනාතුරු අනුභවකරන්ට වටනා බැවින් මෝ හට
ආසන පයර්‍යන්තිකයයි නමෙක් වන්නේය; මේ පළමුවෙනි දෙ
වෙනි තුන්වෙනි ඒකාසනික ධුතාඞ්ගධරයෝ තුන්දෙනා විසින්ම
යම් ආසනයක හිඳ අනුභවයට පටන්ගෙණ එතනින් නැගිට එම
ආසනයෙහි හෝ වෙනින් ආසනයක හෝ හිඳ එක් දවසෙක්හි
දෙවනු අනුභවකළහොත් ඔවුන්ගේ ධුතාඞ්ගය බිදේ; වෙනින් ආකා
රයකින් මේ ඒකාසනික ධුතාංගය නොබිදේයයි දතයුතු—ඒකාස
නිකධුතාඞ්ගයෙහි ප්‍රභෙදයයි.

පත්තපිණ්ඩිකාඞ්ගයෙහි ප්‍රභෙදනම්—පෙරකී ආකාර චෛත්‍ය
ස්ථානයකට ගොස් වත්පිළිවෙත්කොට බුදුන්ලඟදීමෙන් ගෞරවසිත
උපදවාගණ ඇදිලිබැඳගෙණ උක්කුටුකයෙන් හිඳ උත්කෘෂ්ටය මධ්‍ය
මය, මෘදුකය යන තුන්ආකාරයෙන් තමහට පුලුවන් ආකාරයක්
කල්පනාවටගෙණ එයේසලකා "දුතියෙකභාජනං පටික්ඛිපාමි පත්ත
පිණ්ඩිකඞ්ගං සමාදියාමි" යන මේ වාක්‍යය තුන්වරක් කියා පත්ත
පිණ්ඩිකාඞ්ගය සමාදන්වියයුත්තේය; මේ පත්තපිණ්ඩිකාඞ්ගය සමාදන්
වන්නහු විසින් අනුභවකරණකල්හි එකභාජනයෙක්හිම අනුභව
කටයුතුවන්නේමය; වටින් භාජන තබා ඒ ඒ භාජනවලින් සූපව්‍ය
ජනාදිය ගණිමින් ගණිමින් අනුභව නොකටයුත්තේය; ඉදින් ඔහු
ගේපිරිවර ජනයෝ නොයෙක්භාජනවල ව්‍යංජනදමා ඔහුවෙත ගෙ
ණ තබද්ද එකභාජනයක්මගෙණ අනුභව කටයුත්තේය, බත් හා මිශ්‍ර
නොකොට යමක් අනුභවකරණු කැමතිනම් පළමු වැලඳු භාජ
නය පහකොට අනික්භාජනයක් ගෙණ අනුභවකටයුත්තේය; කැ
මතිවූයේනම් මෙම ක්‍රමයෙන් අනුභවකළ භාජනය අහක තබ තබා
භාජන සියයක නමුදු අණුභව කටයුත්තේය; මෙලෙස භාජන ගෙ
ණ අනුභවකිරිම දෙවෙනි භාජනයක් පිළිගත්තානම් නොවන්
නේය; නොයෙක් භාජනවල අනුභවකරණ ලෝලතාවය නැතිකි
රිම මේ ධුතාඞ්ගයාගේ සමාදානයයි කැඳබොනකල්හිද පළමු කැඳබී
පසුව අල බතල අවුළු දෙල් කොස් ආදිය අනුභව කටයුත්තේය;
අලබතල දෙල් කොස් ආදිය හෝ පළමු අනුභවකොට ඒ භාජනය
අහකතබා පසුව කැඳබියයුත්තේය; මී සකුරු ආදී යමක් ලදහොත්

ඒ කැඳෙහිම බනා බොන්නට කැමතිනම් එසේ කටයුත්තේය; නැතහොත් කැඳබී භාජනය අහක්කොට මි සකුරු භාජනයගෙණ අනුභව කටයුත්තේය; දෙවන භාජනයකගේ ගැන්ම ප්‍රතික්ෂේප කළ බැවින් එකවිට එක භාජනයටවඩා ගෙණ ඒ ඒ භාජනවලින්ද ගණිමින් ගණිමින් අනුභවකළහොත් මේ පතනපිණ්ඩික ධුතාංගය බිඳේයයි දතයුත්තේය; මේ පතනපිණ්ඩික ධුතාංගය උත්කෘෂ්ටවශයෙන් එනම් පළමුවෙනි වශයෙන් සමාදන්වන්නාහු විසින් උක්ලිකනකල ඒ රොඩු දැම්මහැර බත්අනුභවකරණ භාජනයෙහිතුබු අනික්කිසි රොඩ්ඩක් අහකලන්ට නොවටනේය; එහෙයින් අනුභවකරණ භාජනයට බෙදනිබෙන මස්මාංසාදියෙහි කටුද කුරුඳු කරපිංච කොළ ආදී රොඩුද අනුභවකිරීමට පටන්ගන්ට මත්තෙන් තමාවිසින් අහකදමා හෝ අනුන් ලවා මෙසේ කරවයිකියා අහකදම්මවා හෝ අනුභවයට පටන්ගන්ට වටනේය; තමාට සෑහෙන පමණක්ම බෙදවා ගෙණ අනුභවකරන්ට වටනේය; මස්මාංස කැවිලි ආදි යමක් අතින් ගෙණ දතට අල්ලා කඩකඩා අනුභවකරන්ට නොවටනේය; භාජනයෙහිදීම පොඩිකොට අනුභවකරන්ට වටනේය; මධ්‍යමවූ එනම්; දෙවෙනිවූ පතනපිණ්ඩික ධුතාංගධරයා විසින් අනුභවයට ගත් භාජනයෙහි තිබෙන මාළුකාවුආදි යම්යම් රොඩු අහකදමදමා එකඅතකින් ඕනෑලෙස බිදබිද කන්ට වටනේය; මෘදුකවූ එනම් තුන්වැනිවූ පතනපිඩික ධුතාංගධරයාවිසින් බත් අනුභවකරණ භාජනයෙහි තිබෙන මාළුකාවු රොඩු ආදිය අහක දමදමාද මස්මාංස කැවිලිආදි සියල්ල අතින් හෝ දතින් හෝ බිඳ බිඳද අනුභවකරන්ට වටනේය; මේ තුන්දෙනාගේම මේ පතනපිඩික ධුතාංගය එකවිට අනුභවය පිණිස භාජනදෙකක් පිළිගත් කෙණෙහිද ලඟතුබුන තවත් තවත් භාජනවලින් ගෙණගෙණ අනුභවකළ කෙණෙහිද මේ ධුතාංගය බිඳෙන්නේය; අනික් ආකාරයකින් නොබිඳෙන්නේය; අනික් මෙහි දැක්වූ ඔවුනොවුන් විසින් පැවැත්වියයුතු ආකාරය ඔවුනොවුන්ගේ වත්යයි දතයුත්තේය; ඒ ආකාර පැවතුම් වෙනස්වූයේ නමුදු මේ අංගය නොබිඳෙන්නේයයි දතයුත්තේය. මෙකී අංගදෙකම යමෙකුගේ යම් ප්‍රමාදයකින් බිඳීමට සෑහෙන යම් ක්‍රියාවක්කර බිඳුනේ නම් නැවත කී ආකාරයෙන් සමාදන්විය යුත්තේය.—පතනපිණ්ඩිකාංගයෙහි ප්‍රභේදයයි.

**ධුතාංගසොරාගේ ආකාරයනම්**—යම් ධුතාංගයක් සමාදන්ව රක්නා යමෙක් විසින් තමා ධුතාංගධරයෙක්ව ධුතාංගයන් රක්නාබව ලොවට ප්‍රකාශකරණ අදහසින් යම්යම් ක්‍රියාවක් පැවැත්වූයේවීනම් එබඳු පාප අදහස් ඇති පුද්ගලතෙම ධුතාංගසොරානම් වන්නේය; ඒ කාරණයෙන් එයින් මියගොස් සතරඅපායෙහි මහත් දුක්විඳින්

නේයයි දතයුත්තේය; තවද ධූතාංගධරයෙක්ව ධූතාංගයන් රක්නා බව අනුන්ට අඟවන අදහසක් නැතිව තමාගේ කෑම්, බීම්, ඉඳීම්, හිටීම්, ආදි ක්‍රියා පැවතුම් දැක, මොහු ධූතාංගධරයෙක්ව ධූතාංගයන් රක්නේයයි අනුන් දැනගන්නේ නමුදු එයින් ධූතාංගධරයාහට කිසි දෙසක් නැත්තේමැයි යම් ධූතාංගයක් සමාදන්ව රක්නා යමෙක් ඇත්නම් ඔහුවිසින් කිසිවෙකුට මාගේ මේ ධූතගුණය නොහඟවන් නෙමියයි යන යහපත් පිරිසිදු අදහසින් ධූතාංගයන් සමාදන්ව රක්‍ෂාකටයුත්තේමැයි.

මේ ධූතාංග සොරාගේ ආකාරයි

**ධූතාංගානිශංසනාම්**—ආබාධ නැතිවන බවය, හෙවත් නිරෝගිබවය ශරීරපරිහරණය සැහැල්ලුබවය, ශරීරය බලවඩිනබවය, සැපසේ වාසයකරණබවය, රසතෘෂ්ණාව නැතිකරණබවය, සියලු ද්‍රව්‍යයන්හි ස්වල්පවූ කැමති ඇතිවනබවය, අධිකවූ රසතෘෂ්ණාව නැතිකරණබවය, පමණදැන ආහර අනුභවකරණබවය, වික්ෂිප්ත සිත් නැතිව ආහර අනුභව කරණබවය, සසර දෙවිමිනිස්සැප විඳුවා කෙලවර නිවණාව පමුණුවන බවය, යනුමෙහි ප්‍රකාශකල ධූතාගදෙකෙහි ගුණයෝයි; මහරජාණෙනි, ජරාමරණාදි දුකින් මිදෙනු කැමැත්තාවූ යම් පුද්ගලයෙක් බුද්ධශාසනය සචිරකොට ගණිමියි සිතා ධූතාංගයන් සමාදන්වේද, හේතෙම අන්‍යයන්ට මඩා දෙකොටසක් පුදලැබිමට සුදුසුවන්නේය, දෙවියන්ට හා, මනුෂ්‍යයන්ට ප්‍රියවන්නේය; මනාපවන්නේය, කැමතිවන්නේය, පූජිතාවන්නේය, සනානයකොට සළුපැලඳ සඳුන් ආදි සුවඳ ඇඟගාසිටි පුරුෂයෙක්හට දෑසමන්, සීනිදෑ, බෝලිදෑ, ආදී මල්වඩන්වෙන්ද, ඉතා තද බඩගිනිවූවෙක්හට ප්‍රණීත මධුර රසවත් භෝජනයක්මෙන්ද, පිපාසයෙන් පීඩිතයෙක්හට සිහිල් නිර්මල සුවද ජලයක්මෙන්ද, විෂගත පුරුෂයෙක් හට උතුම්වූ දිව්‍යබෙහෙතක් මෙන්ද. ශීඝ්‍රගමන් කැමැත්තෙක්හට අජානිය අශ්වයෙක් මෙන්ද, දිලිඳු පුරුෂයෙක්හට සිතුමිණිරුවනක් මෙන්ද, රාජ්‍යයට පැමිණෙනු කැමති රජකුමරෙක්හට අනිධවල නිර්මල ඡේසතක්මෙන්ද, චතුරාර්‍යසත්‍ය ධර්මයන් කැමැත්තාහට උතුම්වූ අර්හත්ඵලාධිගමයක්මෙන්ද, මේ ධූතාංග ගුණය වන්නේය, ඒ ධූතාංගධරයාහට සතරසතිපට්ඨානය, සතර සම්‍යක් වීර්‍යය, සතර ඍද්ධිපාදය, පඤ්චේන්ද්‍රියය, පඤ්චබල, සප්තබොධ්‍යාඞ්ග, ආර්‍යඅෂ්ටාංගික මාර්ගය, යනමේ සත්තිස්බෝධිපාක්ෂික ධර්මයෝ පරිපූර්ණවන්නාහුය. තවද සමථවිදර්ශනාවය, සතර ශ්‍රාමාණ්‍ය ඵලය, සිව්පිළිසිඹියාවය, ත්‍රිවිද්‍යාවය, ෂට්අභිඥවය යනාදී සියලු ලෝකොත්තර ගුණධර්මයෝ ඒ ධූතාංගධරයාහට අයිතිවන්නාහුය; ඒ ධූතාංගධරයන්වහන්සේ අර්හත්ඵල නැමති නිර්මලවූ ඛචලවජ්‍රයෙන් උතුම්වූ අභිෂේකයට පැමිණෙන

සේක෴හෙවත් ශාන්තප්‍රනීතවූ, ජරාමරණාදි කිසිත් දුකක්නැති නිර්වාණයට කිසිත් සැකයක් නැතිවම පැමිණෙනසේකැයි වදාළසේක, මේ සාමාන්‍ය වශයෙන් සියලු ධුතාංගානිසංසයෝයි.

තමතමන්ට වැඩකැමති එම්බා පින්වත් සද්ධාවන්ත සත්පුරුෂයෙනි "න මහාරාජ ධුතගුණෙ අවිසුද්ධානං සමයො හොති" යනුහෙයින් ධුතගුණයෙන් පිරිසිදු නොවූවන්ට ධර්මාභිසමය නොවන්නේය; හෙවත් ධුතාංගයන් සමාදන්ව රක්ෂානොකලාහට නිවන් නොලැබෙන්නේයයි ශුද්ධවූ බුද්ධදෙශනාවෙහි තීන්දුකොට වදාරා තිබෙන බැවින් මේ දුර්ලභවූ මනුෂ්‍යාත්මය හා බුද්ධොත්පාද කාලයද අති දුර්ලභවූ ශ්‍රී සද්ධර්ම රත්නයද ලබාගෙණ, ඇස්, කන්, නාසා, ආදියද, විකලනැතුව, සිටිනා තොප විසින් මේ මනුෂ්‍යාත්මය නිස්ඵලකර නොගෙණ හොඳ සිහියෙන් කල්පනාවට ගණිමින් පෝය පැමිණි අට දවසකට වරක්වත් මෙහි දැක්වූ ධුතාංග දෙක සමාදන්ව රක්ෂාකොට සසර දුකින්මිදී උතුම්වූ නිවන්පුර සිරි විඳිනට උත්සාහ කටයුතු෴

අඤ්ඤාය සීහල ජනස්ස සුදුල්ලභා මා
නිට්ඨාපිතාවර පරංජසදීපනී මෙ
ලද්ධා දලිද්ද නිධයො විය තං සුසම්මා
හොන්තා සමුස්සහථ මොක්ඛපුරං පයාතුං

පුඤ්ඤෙන නෙන ධිගතෙන භවා භවෙහං
අග්ගොව ලොකිය ජනෙසු ඛිලෙසු රනෙක
සංසාරබාධුපසුපීළිත නන්ත සත්තෙ
තම්හාපනෙතුමසමො සුගතොභවෙය්‍යන්ති.

යනුවෙන් ලක්දිව්වැසි සිංහල ජනයන්ට වැඩපිණිස මාවිසින් දෙශනාවෙන් පිටපත්කොට නිමවනලද අතිදුර්ලභවූ උතුම් "පරංජසදීපනී" නම් මේ ප්‍රකරනය දිළින්දෙක්හට ලැබුනු රත්න නිධානයක්මෙන් මනාකොට රැගෙණ පින්වත්නි, නිවන්පුරයට පැමිණෙන්ට යහපත්කොට උත්සාහකරව්; මාවිසින් මේපොත කිරීමෙන් පැමිණෙනලද මේ පින කරණකොටගෙණ භවයක් පාසා සියලු ලෞකික ජනයන් කෙරෙහි අග්‍රයෙක්ව භවයෙහි සැරිසරා කෙළවර සංසාර පීඩාවෙන් පීඩාවක් නොලැබ අනන්ත සත්වයන් ඒ සංසාර පීඩාවෙන් මුදන්නට හෙබාණ සත්වයන් සසරදුකින් මුදා නිවණට පමුණුවන්ට මම අසමසමවූ යහපත්ගති ඇති ලොවුතුරා බුදුකෙනෙක් වෙම්වයි; මේ පොත කළාවූ මාගේ අදහස සහ ප්‍රාර්ථනාවද, කෙළවර මේ ගාථාදෙකින් මෙසේ දක්වනලදී෴

පරංජසදීපනිය නිමි.

# විඥාපනය.

---

මෙහි ප්‍රකාශවන මධුරමනෝහර බුද්ධවංසදෙශනා නම්වූ මාහැඟි ධර්මප්‍රකරණය හා කර්ණාමෘතරසායනවූ මෛත්‍රීවර්ණනාවද යන ප්‍රකරණදෙක අපසම්‍යක් සම්බුදුරජාණන්වහන්සේගේ නියතවිවරණයෙහි පටන් බෝධිසත්ව චරිතය හා බුදුවීමේ පටන් බුද්ධචරිතත් එසේම මතු ලොවපහළවිවදුරණ මෛත්‍රී සර්වඥයන්වහන්සේගේ වර්ණනාවත් ප්‍රකාශකිරීමෙන් ඉතා රසවත්වූ ධර්මරාසියක් අඩංගුකොට පුරාතන පණ්ඩිතුමන් විසින් සම්පාදනය කරණලද්දේවිනුමුත් කවරකලක කවරනම් කෙනෙකුන් විසින් කරණලද්දේද යනු නිශ්චයකළ නොහැකිය.

නිර්වාණපුරවර්ණනාව හා පරංජයදීපනිය යන සද්ධර්මාමෘත රසාස්වාදජනවූ ප්‍රකරණ දෙක අමරපුර සද්ධම්මවංසනිකායාධිපතියෙක්ව රත්දෙඹේ මහාමඞ්ගල සමුද්‍රාරාමයෙහි වැඩසිට පරලෝකප්‍රාප්තවූ තුඩුවේ වත්තේ පඤ්ඤාසීහ මහාස්ථවිරයන්වහන්සේ විසින් නිර්වාන නගරය වර්ණනාකිරීමෙන් හා ඒ නිර්වානයට පැමිණෙන අන්දම ප්‍රකාශවූ ධර්මරාශියක් අඩංගුකොට කරණලදී.

මුන්වහන්සේගේ ප්‍රමාණය මේ කුඩාපොත්දෙකින්ම පණ්ඩිත ලෝකයාට තේරුම් යනවාඇති.

මේ කර්ණරසායන අර්ථාන්විත ධර්මයන්ගෙන් යුක්තවූ මෙමපොත යමෙක් සමාදරයෙන් ගෙණ භාවිතාකරන්නේනම් ඔහු නොබෝකලකින්ම අභිධර්මාදියෙහි දක්‍ෂපණ්ඩිතයෙක් වෙනවා නියතමයි; එපමනකුත් නොව මෙහි ප්‍රකාශ ධර්මය දැන පිළිපදින තැනැත්තා සංසාරදුකින්මිදී නිර්වානයටත් ඒකාන්තයෙන්ම පැමිණෙනවාමයි; මේ පොතේ ඇති අනඝකම මෙහි නොකිව්වත් මේපොත කියවා බලන කාටත් තේරුම් යනවාඇති.

මෙම පොත හතරවෙනිවරට සුද්ධකරවා මුද්‍රනයකරවන්ට යෙදුනේ පැලියගොඩ පදිංචි සූරියආරච්චිගේ බබාසිඤ්ඤො අප්පුහාමි විසින්ය.

මෙය නැවත මුද්‍රනයකිරීමේ බලය මෙහි අත්සන්කරණ මටම සබංගත්බවද දන්වමි.

ඇස්. බී. ඒ.

# ශුද්ධි පත්‍රය.

| පිට. | පේළි. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 5 | 21 | ස්ත්‍රියක් | ස්ත්‍රියන් |
| „ | 25 | එනල් | එතකල් |
| 6 | 8 | ගෙයිනුන් | හොයිනුන් |
| 7 | 5 | සක්ලන් | සක්වලන් |
| 8 | 25 | එක්සිස | එක්සිය |
| 9 | 3 | දුඃකයයි | දුඃඛයයි |
| 14 | 28 | සිතුවලෙනි | සිතුවේලෙනි |
| 15 | 23 | නිසවම්ද | කියවම්ද |
| 18 | 21 | මෙස් | මෙසේ |
| 19 | 4 | හියේය | ගියේය |
| 21 | 4 | විචිතාවිනම් | විජිතාවීනම් |
| 22 | 28 | ජරව | රජව |
| 36 | 37 | රාශිටගන්නි | සරාසිටගන්නී |
| 65 | 11 | සිහලු | සියලු |



